විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ශ්‍රී ලංකාව

තිස් අටවැනි වාර්ෂික වාර්තාව

பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு

இலங்கை

முப்பத்தி எட்டாவது வருடாந்த அறிக்கை

# UNIVERSITY GRANTS COMMISSION

# SRI LANKA

# THIRTY EIGHTH ANNUAL REPORT

# 2016

# පටුන

පිටු අංකය


අ. සභාපතිතුමාගේ පණිවුඩය ...................................................... 1
ආ. හැඳින්වීම ...................................................... 3
ඇ. දැක්ම හා මෙහෙවර...................................................... 3
ඈ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය ...................................................... 4

1. විධායක සාරාංශය ...................................................... 4
2. විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය ...................................................... 11
3. විශ්වවිද්‍යාල හා ආයතන කළමනාකරණය ...................................................... 12
4. විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම...................................................... 18
5. අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම...................................................... 24
6. මූල්‍ය පරිපාලනය...................................................... 34
7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව...................................................... 39
8. මානව සම්පත් ප්‍රගතිය...................................................... 42
9. යටිතල පහසුකම් සංවර්ධනය...................................................... 49
10. තොරතුරු තාක්ෂණය සංවර්ධනය කිරීම...................................................... 50
11. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය...................................................... 52
12. ගරු.උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා හා ගරු. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සමඟ පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීම් ...................................................... 56
13. නීති කටයුතු...................................................... 57
14. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය...................................................... 60
15. මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම හා මධ්‍යම අභ්‍යන්තර විගණනය...................................................... 61
16. සමීක්ෂණ, ප්‍රකාශන හා පර්යේෂණ අධ්‍යයනයන්...................................................... 62
17. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය...................................................... 64
18. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල...................................................... 67
19. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල...................................................... 68
20. 2016 වර්ෂයේ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි...................................................... 70
21. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ...................................................... 74
22. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ...................................................... 112
23. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන...................................................... 122

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකාව

## තිස් අටවැනි වාර්ෂික වාර්තාව

**2016**

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## අ. සභාපතිතුමාගේ පණිවුඩය

2016 වර්ෂයේ දී, කොමිෂන් සභාව විසින් ඇතැම් ප්‍රධාන කර්තව්‍යයන් අනාකූලනය කිරීම හා දියුණු කිරීම පිණිස ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ගෙන ඇති අතර 2017 වර්ෂය සඳහා ප්‍රතිසංස්කරණ කීපයක් වෙනුවෙන් මූලික පසුබිම ස්ථාපනය කරන ලදී. මෙම වෙනස්කම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013-2017 ක්‍රමෝපාය සැලසුම හා සමගාමී වන අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ රජයේ නව උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය ලබා දීමට අපේක්ෂා කෙරේ.

වැදගත් අවස්ථා විධායක සාරාංශයේ දක්වා ඇත.

ප්‍ර9ධාන වෙනස්කම් අතර, රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මඟින් පිරිනමනු ලබන අධ්‍යයන පාඨමාලා හඳුනා ගැනීම සඳහා උපකාරී වන කේතාංක ක්‍රමය (Unicode system) හඳුන්වා දීම, සිසුන්ට පහසු ප්‍රවේශ අත්පොතක් නිර්මාණය කිරීම හා ශිෂ්‍ය ප්‍රවේශය සඳහා පළමු වරට මාර්ගගත අයදුම් කිරීමේ හා ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම ඇතුළත්ය. ප්‍රවේශ කටයුතු දෙපාර්තමේන්තුව වඩා ඉඩ පහසුකම් සහිතව පුළුල් කරන ලද අතර සරල ක්‍රියාකාරිවය වැඩි දියුණු කිරීමටත් සිසුන් තෝරා ගැනීමේ ක්‍රියාවලියෙහි ප්‍රමිතිය සහ විනිවිදභාවය ආරක්ෂා කිරීමටත් තොරතුරු තාක්ෂණ සාක්ෂරතා සහිත නව මානව සම්පත් බඳවා ගන්නා ලදී. 2016 වර්ෂයේ දී විශ්වවිද්‍යාල පද්ධතියට නව තාක්ෂණ උපාධි වැඩසටහන් හඳුන්වා දීම කුසලතාවන්හි අයෝග්‍ය ගැළපීම පිළිබඳ ගැටලුව විසඳීමට උපකාරී වනු ඇති අතර රාජ්‍ය උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නංවනු ඇත.

විද්‍යාර්ථීන් ආචාර්ය උපාධි සඳහා විදේශ විශ්වවිද්‍යාලයන්හි හා භින්න ආචාර්ය උපාධි වැඩසටහන්වල ලියාපදිංචි වීමේ උනන්දුව ඉහළ නැංවීම පිණිස මූල්‍යයනය ඉහළ නංවන ලදී. මෙය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මය ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.

අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මය වර්ධනය කිරීමටත් නව අදාළ උපාධි වැඩසටහන් හඳුන්වා දීමටත් ස්ථාවර කමිටු ප්‍රතිව්‍යුහගත කිරීම හා නීතිය, සෞන්දර්යය අධ්‍යයනය, අධ්‍යාපනය හා තාක්ෂණය සඳහා නව ස්ථාවර කමිටු ඇති කිරීම සිදු කරන ලදී. කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පෙර සියලු නව පාඨමාලා තත්ත්ව සහතිකකරණ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරීක්ෂා කෙරේ. කර්මාන්ත නියෝජිතයන් හා විශේෂඥ දැනුමක් සහිත විශිෂ්ට පුද්ගලයන්ට කොමිෂන් සභා ස්ථාවර කමිටු සඳහා ආරාධනා කරන ලදී. සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා, විශ්වවිද්‍යාල නියමුවන් වෙතින් කීප වරක් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව සාම්ප්‍රදායික ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකක (ELTU), ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශ (ELTD) ලෙස උසස් කිරීමට ක්‍රමවේදයක් සකස් කරන ලදී. අලුතින් ස්ථාපනය කරන ලද ස්ත්‍රී -පුරුෂ

සමාජභාවයේ සාධාරණත්වය සහ සමානත්වය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් යෝජනා කරන ලද පරිදි, ස්ත්‍රී -පුරුෂ සමාජභාවය, ලිංගික හා ස්ත්‍රී -පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය හා නවකවදය පිළිබඳ ගැටලු විසඳීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ කේන්ද්‍රයක් පිහිටුවන ලදී. යුනෙස්කෝ සංවිධානයේ හා ඉන්දියානු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගීත්වයෙන් විශ්වවිද්‍යාල සිසුන් සඳහා මාර්ගගත පැමිණිලි යාන්ත්‍රණයක් ක්‍රියාතක්මක කිරීම සඳහා විධිවිධාන සකස් කරන ලදී. මෙම යාන්ත්‍රණය 2017 වර්ෂයේ සිට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ජර්මනියේ 'GIZ' වැඩසටහනේ සහයෝගීත්වයෙන්, සිසුන්ගේ හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ව්‍යවසායකත්ව කුසලතා පුබුදුවා ලීමට සහ විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර විශ්වාසය ගොඩ නැගීම සඳහා විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) ස්ථාපනය කිරීමට අවසර ලබා දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

ස්වාධීන තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන යාන්ත්‍රණයක් ගොඩ නැගීම සඳහා වූ යෝජනාව 2016 වර්ෂයේ දී සිදු කරන ලද වඩාත්ම වැදගත් සංවර්ධනය වේ. මේ සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් දක්වන ලද අනගි දායකත්වය හා සහයෝගය අපි අගය කරන්නෙමු.

මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආ. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1978 දෙසැම්බර් මස 22වන දින ස්ථාපනය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් වනුයේ උසස් අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, මුදල් වෙන් කිරීම, අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම නියාමනය සහ රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම වේ.

සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු දෛනිකව පරිපාලනය කිරීම හා කොමිෂන් සභා රැස්වීම්වල සභාපතිත්වය දැරීම සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය හා අනුකූලනය පිණිස වෙන් කරන ලද රාජකාරී හා කාර්යයන් සහිත දෙපාර්තමේන්තු, අංශ හා ඒකක ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 15ක්, පශ්චාත් උපාධි ආයතන 11ක් හා ආයතන 7ක් ඇතුළත් වේ. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ. විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

ඇ. දැක්ම හා මෙහෙවර

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම**

2020 වන විට ශ්‍රී ලංකාව කලාපය තුළ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට සහ ආසියාව තුළ උසස් අධ්‍යාපනයෙහි නියමුවකු බවට පත් කරලීම.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවර**

ජාතික සංවර්ධනය හා සමගාමීව, ගුණාත්මක ඉගැන්වීම් ඉගෙනුම්, ඉහළ ප්‍රතිඵලදායී පර්යේෂණ, නවෝත්පාදන ව්‍යවසාය, නිර්මාණාත්මක ප්‍රජා දායකත්වය, සාමය හා සමගිය සහ ක්‍රමෝපායික ජාත්‍යන්තර සහයෝගය සඳහා කැපවූ තිරසාර, පුළුල් ලෙස පිළිගනු ලබන, ප්‍රවේශ්‍ය උසස් අධ්‍යාපන පද්ධතියක් සඳහා යහපාලනය සහ කළමනාකාරීත්වය තුළින් මඟ පෙන්වීමට , ස්ථාපනය කිරීමට සහ සංවර්ධනය කිරීම

***

**ඇ.විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධානයන් ප්‍රකාරව කොමිෂන් සභාව පහත අරමුණු සමඟ ස්ථාපනය කොට ඇත:

1. ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.

3. උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.

4. උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම.

5. එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

## 1. විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාව, 2016 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් සමාලෝචනය කරයි. 2016 වර්ෂයේ මූලික වැදගත් අවස්ථා සහ ජයග්‍රහණයන්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතිකකරණය, මූල්‍යමය පරිපාලනය හා කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගීත්වය හා පර්යේෂණ සහයෝගීත්වය යන ක්ෂේත්‍රයන්හි සාරාංශගත කර ඇත.

වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, 2013-2017 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි ඉලක්ක, අරමුණු, සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI), රට තුළ පැන නගින අපේක්ෂා හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කර ගත් ආර්ථිකයෙහි මානව අවශ්‍යතා, සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගන්නා ලදී.

<u>විශ්වවිද්‍යාල /රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම</u>

2013-2017 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි ප්‍රධාන ඉලක්කයක් වනුයේ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීමයි. 2016 වර්ෂයේ දී, නව පීඨ, අධ්‍යයනාංශ ස්ථාපනය කිරීමේ, නව අධ්‍යයන වැඩසටහන් ( විස්තර පහත දක්වා ඇත) ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ දැනට ක්‍රියාත්මක අධ්‍යයන වැඩසටහන්වල ධාරිතාව වැඩි කිරීම සඳහා වූ යෙදවුම් සමඟ, 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා රජයේ උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීමට හැකි විය.

2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා අපේක්ෂකයෝ **155,550**ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබූහ. එම වර්ෂය සඳහා සම්මත කර ගත් නිර්ණායක මත පදනම්ව සාමාන්‍ය විධිවිධාන යටතේ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ඇතුළත් කර ගැනීම 2016 වර්ෂය අවසානයේ දී සිදු කරන ලදී. 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර

ගැනීමට යෝජිත සිසුන් සංඛ්‍යාව 27,603 කි. ඉසෙඩ් අගය මත පදනම්ව සාමාන්‍ය ප්‍රවේශය යටතේ තෝරා ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 26,541කි. එයට අමතරව, විශේෂ විධිවිධාන ප්‍රකාරව සිසුන් 2,409 ක් තෝරා ගන්නා ලදී. තෝරා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 28,950 කි.

2016 වර්ෂයේ දී අදාළ පීඨ සඳහා තෝරා ගන්නා ලද අමතර සිසුන් සංඛ්‍යාව පහත දක්වා ඇත:

| | |
|---|---|
| තාක්ෂණ | 2030 |
| වෛද්‍ය | 70 |
| විද්‍යා | 575 |
| ඉංජිනේරු | 208 |
| කෘෂිකර්මය | 45 |
| වාස්තු විද්‍යාව/නිර්මානවේදය/නගර හා ග්‍රාම සැලසුම්කරණය | 20 |
| අතුරු වෛද්‍ය | 170 |
| කළමනාකරණ හා වාණිජ්‍ය | 590 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව | 1816 |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව | 40 |

2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට හැකි අවම කාල සීමාවක් තුළ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ අරමුණ සහිතව සුදුසුකම් ලත් සිසුන්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා මාර්ගගත පද්ධතිය 2015 මැයි 08වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පළමු වරට සාර්ථකව දියත් කරන ලදී. සිසුන්ගෙන් 33.8%ක් පමණ මෙම පහසුකම භාවිත කරන ලදී. මාර්ගගත ලියාපදිංචි වීමේ පද්ධති පහසුකම භාවිතය 100%ක් විය. කෙසේ වුවද, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගතව අයදුම් කිරීම අනිවාර්යය කර ඇති බැවින් 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාර්ගගත පහසුකම සිසුන් 100%ක්ම භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය තවදුරටත් සරල හා නවීකරණය කර ගැනීම සඳහා භාවිත කරන සිසුන්ට වඩාත් පහසු ප්‍රවේශ අත්පොතක් හා අනන්‍ය හඳුනාගැනීමේ කේතයක් (UNICODE) 2016 වර්ෂයේ දී හඳුන්වා දෙන ලදී. ඉහත සඳහන් ක්‍රමවලට අමතරව, අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල නිකුත් වූ දින සිට රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගන්නා තෙක් වූ කාල අන්තරය අවම කර ගැනීම සඳහා වෙනත් ඵලදායි පියවර කිපයක්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගෙන ඇත. ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය තුළ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කොමිෂන් සභාවේ මානව හා අනෙකුත් සම්පත් වැඩි කිරීම, නව ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුම ලබා දීම සඳහා ආචාර්යවරුන් හා සිසුන් සඳහා වැඩමුළු පැවැත්වීම, මාර්ගගත අයදුම් කිරීමේ හා ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය අනාකූල කිරීම සඳහා සහ සිසුන්ට වඩාත් පහසු ප්‍රවේශ අත්පොතක් සැලසුම් කිරීම සඳහා බාහිර ප්‍රභවයන්ගෙන් තොරතුරු තාක්ෂණ සම්පත් යොදා ගැනීම මේ ක්‍රියාපිළිවෙළ තුළ ඇතුළත්ය.

<u>අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය</u>

සමාලෝචිත වර්ෂය තුළ, සිසුන් සඳහා උසස් අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා ඉහළ නැංවීම සඳහා එක් අධ්‍යයන පාඨමාලාවක් සහ නව ප්‍රථම උපාධි වැඩසටහන් 38ක් හා නව පශ්චාත් උපාධි වැඩසටහන් 15ක් හඳුන්වා දෙන ලදී. මෙය පසුගිය වර්ෂයේ හඳුන්වා දුන් වැඩසටහන් 27 හා 4ට සංසන්දනාත්මකවය.

**2013** වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව 2015 වර්ෂයේ පැවැත්වෙන උසස් පෙළ විභාගය සඳහා තාක්ෂණික විෂය ධාරාව හඳුන්වා දෙන ලදී. ඒ අනුව, 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ලියාපදිංචිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තාක්ෂණික විෂය ධාරාවේ උපාධි පාඨමාලා සහ තාක්ෂණික පීඨ අනුමත කරන ලදී. ඒ අනුව, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, යාපනය, රුහුණ, කොළඹ, අග්නිදිග, සහ නැගෙනහිර යන

විශ්වවිද්‍යාලයන්හි තාක්ෂණ පීඨ 7ක් ස්ථාපනය කරන ලදී. 2015/2016 වර්ෂයේ පළමු කණ්ඩායම ලෙස සියලුම පීඨ සඳහා තෝරා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2,030කි.

<u>තත්ත්ව සහතිකකරණය හා ප්‍රතීතනය</u>

තත්ත්ව සහතිකකරණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන ව්‍යවස්ථාපිත වගකීමකි. එය අඛණ්ඩ සහ ඉදිරියට යන ක්‍රියාවලියක් ලෙස ද සැලකේ. එබැවින්, අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය, සංවර්ධනය කිරීම, පහසුකම් සැලසීම හා අධීක්ෂණය සඳහා සියලුම විශ්වවිද්‍යාල විසින් 2015 මැයි මස 05 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2015 ප්‍රකාරව අධ්‍යක්ෂ - අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණය (Director-IQA) විසින් ප්‍රධානත්වය දරන ‘අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක (IQAU)’ පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය (QAAC) ඒ සඳහා කැප වූ සහාය කාර්ය මණ්ඩලයක් සමඟ වඩාත් ඉඩ පහසුකම් ඇති කාර්යාලයක් වෙත ගෙන යන ලදී. ඒ සඳහා නායකත්වය සැපයීමට පූර්ණ කාලීන නව අධ්‍යක්ෂවරයෙකු 2016 වර්ෂයේ දී පත් කරන ලදී.

රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි පාඨමාලාවල ගුණාත්මය හා අදාළත්වය තහවුරු කිරීම සඳහා ජාතික ආයතනයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, සහ අදාළ පාර්ශ්වකරුවන් විසින් රැස්වීම් වාර කීපයක් පවත්වන ලදී. "තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන කොමිෂන් සභාව" වැනි ආයතනයක් පිහිටුවීම සුදුසු බවට එකඟතාවක් ඇති වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් යෝජනාව පිළිබඳ අවසන් තීරණය ගැනීමට හා සාකච්ඡාව හා අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත පනතක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

නව තත්ත්ව සහතිකකරණ හා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව අත්පොත් ප්‍රකාරව 2017 වර්ෂයේ දී විශ්වවිද්‍යාල 15හිම ප්‍රථම තත්ත්ව සහතිකකරණ චක්‍රය ආරම්භ කිරීමට සහ සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම අවසානයකට ගෙනෙන ලදී. 2017 මැද භාගය වන විට ක්‍රියාත්මක වීමට නියමිත උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ලෝක බැංකු ව්‍යාපෘතිය මඟින් මේ සඳහා මූල්‍ය අරමුදල් ලබා දෙනු ඇත.

<u>පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා ප්‍රදාන ලබා දීම</u>

අධ්‍යයන පාඨමාලාවන්හි උසස් ප්‍රමිතීන් තහවුරු කිරීම පිණිස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා ප්‍රදාන අවශ්‍ය වේ. ආචාර්ය උපාධි අධ්‍යයන සඳහා ලියාපදිංචි වීම සඳහා විද්‍යාර්ථීන් 53දෙනෙකුට රු.මිලියන 513ක මුළු මුදලක් ලබා දෙන ලදී. විද්‍යාර්ථීන් 40දෙනෙකු සඳහා පර්යේෂණ ප්‍රදාන 40ක් සපයන ලදී. ප්‍රදානයේ මුළු වටිනාකම රු.මිලියන 112.8කි. 2015 ලබා දුන් ප්‍රදාන හා සැසඳීමේ දී මෙම මූල්‍යායනයන් සැලකිය යුතු වශයෙන් ඉහළ අගයක් ගනී. විශ්වවිද්‍යාලවල කණිෂ්ඨ විද්‍යාර්ථීන්ගේ සුභසිද්ධිය උදෙසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඕස්ට්‍රේලියාවේ පිහිටි ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) සමඟ එක්ව ඒකාබද්ධ/භින්න ආචාර්ය උපාධි පාඨමාලාවක් දියත් කර තිබේ. ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනයේ ප්‍රමුඛයකු ලෙස සැලකෙන ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයට විශේෂයෙන්ම විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණය සහ සෞඛ්‍ය විද්‍යා යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ශක්තියක් ඇත. වැඩසටහන 2013 වර්ෂයේ දී දියත් කරන ලද අතර සාර්ථකව තෙවැනි වරට 2016 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ අයදුම්පත් ඇගයීමේ ක්‍රමය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමයට මූලික වශයෙන් සමාන වේ. මෙම වැඩසටහන යටතේ කථිකාචාර්යවරුන් දහතුන්දෙනෙක් අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අතර 2016 මැයි මස 19වන දින සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. ඒ අනුව, ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ප්‍රවේශ අවස්ථා ලබා ගත් සිසුන් එකොළොස්දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් මූල්‍ය අනුග්‍රහය ලැබීම සඳහා

තෝරා ගන්නා ලදී. අනෙක් අයදුම්පත් දෙකක් සම්බන්ධයෙන් ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ ප්‍රතිචාරය අපේක්ෂාවෙන් පසුවේ.

වැඩමුළු හා සම්මන්ත්‍රණ

කීර්තිමත් විද්වතුන්ගේ සහ විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛ පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් ජාතික වැදගත්කමක් ඇති කරුණු පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු හා සම්මන්ත්‍රණ ගණනාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. විවිධ දෙපාර්තමේන්තු, අංශ, ස්ථාවර කමිටු, පර්යේෂණ හා අන්තර්ජාත්ක සහයෝගීතා අංශය (DRIC), තතත්ව සහතිකකරණ හා ප්‍රතීතණ මණ්ඩලය (QAAC), ස්ත්‍රී -පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය /සමානත්වය සඳහා වූ කේන්ද්‍රය මඟින් එම වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී.

ශිෂ්‍ය කටයුතු

මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගේ මුළු ·එකතුව 47,704ක් විය. 2016 වර්ෂය තුළ දී ශිෂ්‍යාධාර ලබන්නන් 24,609 ක් ද දායක පරිත්‍යාග / වෙනත් ශිෂ්‍යත්වලාභීන් 84 ක් ද විය.

මහපොළ ශිෂ්‍යත්වය රු. 2,500/- සිට 5,000/- දක්වාත් ශිෂ්‍යාධාරය රු. 2,000 සිට 4,000 දක්වාත් ඉහළ නැංවීමේ රජයේ තීරණය කොමිෂන් සභාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාත්මක කරන ලදී.

ලැප්ටොප් පරිගණක මිල දී ගැනීම සඳහා පොලී රහිත ණය ලබා දීමේ රජයේ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහාය වන ලදී.

දැනට ආරම්භ කොට ඇති නේවාසිකාර ව්‍යාපෘතිය සම්පූර්ණ කළ විට 2018 වර්ෂය අවසානය වන විට සියලු සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සැලසුමයි.

රැකියා වෙළඳපොළ සඳහා විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ අදාළත්වය ඉහළ නැංවීම; " නොගැළපෙන කුසලතා" ගැටළුව සඳහා පිළියම් යෙදීම

අ. ජාතිකව හා කලාපීයව අදාළ වන නව උපාධි වැඩසටහන් කීපයක් හඳුන්වා දෙන ලදී:

- ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය, සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයන්ගෙන් නව තාක්ෂණික වැඩසටහන් 25ක් - කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලය,අග්නිදිග විශ්වවිදයාලය යන විශ්වවිද්‍යාලයන්හි නව තාක්ෂණික පීඨ 7ක් ස්ථාපනය කරන ලදී.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් ස්ථාපනය කිරීම ආරම්භ කරන ලදී.

ආ. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සඳහා ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව අඩු නොකොට ඔවුන්ගේ කුසලතා හා දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා මූලික ගණිතය, සංඛ්‍යානය, අනිවාර්ය ශාස්ත්‍රීය අගයන් සහිත තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි හඳුන්වා දීම තුළින් දැනට පවතින මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධි වැඩඩසටහන විවිධාංගීකරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

<u>තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාවේ ධාරිතාව ගොඩ නගා ගැනීම සඳහා සිසුන්ට සහාය දැක්වීම</u>

ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ කථන, ලේඛන, සහ සන්නිවේදන හැකියාව ඉහළ නැංවීම සඳහා සියලු විශ්වවිද්‍යාලයන්හි ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකක (ELTU) ප්‍රතිස්ථාපනය කරමින් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශ (ELTD) ඇති කරන ලදී. එයට අමතරව ආචාර්යවරුන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව හැකියාව බල ගැන්වීමට සහ සහාය ලබා දීමට පියවර ගන්නා ලදී.

රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි භාෂා කුසලතා අත්‍යවශ්‍ය වේ. එබැවින් මෙම කුසලතා ඇති කර ගැනීමට හා සංවර්ධනය කර ගැනීමට සිසුන්ට සහාය දැක්වීමට තෝරා ගනු ලැබූ සියලු සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශයට පෙර පිවිසිය හැකි හා මොඩියුලය මාර්ගගතව සාර්ථකව නිම කළ විට සහතිකපතක් ලබා ගැනීමේ පහසුකම සහිත මාර්ගගත ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ මොඩියුල නිර්මාණය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අරමුදල් සපයන ලදී. මෙම ක්‍රියාකාරකම සඳහා ලෝක බැංකු HETC ව්‍යාපෘතිය මගින් ද අරමුදල් සපයන ලදී.

<u>විශ්වවිද්‍යාලවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය හා නවකවදය</u>

විශ්වවිද්‍යාලවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය හා නවකවදය පිළිබඳව ගැටළු විසඳීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහත පියවර ගෙන ඇත.

- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් හා පරිසංවාද /වැඩමුළු සංවිධානය කිරීමෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී -පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය හා නවකවද උවදුර පිළිබඳව දැනුවත්බවක් ඇති කරන ලදී.
- 'ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය හා සමානත්වය පිළිබඳ ස්ථාවර කමිටුව' නමින් නව ස්ථාවර කමිටුවක් ස්ථාපනය කරන ලදී.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී -පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය, සහ නවක වදය පිළිබඳ ගැටළු විසඳීම පිණිස අධ්‍යක්ෂවරයෙකු සහිතව ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානත්වය සඳහා නව කේන්ද්‍රයක් ඇති කරන ලදී.
- විශ්වවිද්‍යාල ශිෂ්‍යන්ට මාර්ගගතව නිර්නාමික පැමිණිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණයක් ආරම්භ කරන ලදී.
- 1998 නවක වද පනත ප්‍රකාරව විශ්වවිද්‍යාල තුළ ප්‍රචණ්ඩත්වය හා නවදවදය දීමේ ප්‍රතිවිපාක පිළිබඳ දැනුවත් බවට සානථ කරන සාක්ෂ්‍ය වශයෙන් 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි කරන අවස්ථාවේදී සිසුන් හා දෙමව්පියන් විසින් අත්සන් කළ යුතු දිවුරුම් ප්‍රකාශයක් නව විශ්වවිද්‍යාල අත්පොතෙහි ඇතුළත් කරන ලදී.

<u>කාර්ය මණ්ඩල සංවර්ධනය</u>

2016 වර්ෂයේ දී, මහා භාණ්ඩාගාරය විසින් නව සේවක සංඛ්‍යා තනතුරු 717 (2015-156) ක් අනුමත කරන ලද අතර ඒ සමඟ විශ්වවිද්‍යාල පද්ධතියේ අනුමත සේවක සංඛ්‍යාව 29,794ක් දක්වා ඉහළ යන ලදී.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන පහළොවම නිතරන්තරයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩසටහන් සහ අධ්‍යයන, පරිපාලන, මූල්‍ය, විධායක, තාක්ෂණික, අනධ්‍යයන, ලිපිකරු හා සුළු සේවක ඇතුළත් සියලුම කාණ්ඩ සඳහා වෙනත් කෙටි කාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු, දුරස්ථ පුහුණු යනාදිය පවත්වනු ලබයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිය හා අනුකූල වෙමින් අධ්‍යයන පාලනයේ සහ ඉගැන්වීමේ විශිෂ්ටත්වයට පත් වීමේ පුළුල් ඉලක්කය සහිතව හා කලාපීය අවශ්‍යතා හා ගැටලු ආමන්ත්‍රණය කරන පශ්චාත් උපාධි පර්යේෂණ සිදු කිරීම සඳහා හැකියාව ලබා දීමට ශ්‍රී ලංකාව තුළදී හෝ වෙනත් කවර හෝ රටක දී පශ්චාත් උපාධිය හා ආචාර්ය උපාධිය හැදෑරීමේ අභිමතාර්ථය වෙනුවෙන් පශ්චාත් උපාධි ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 151ක් වන මූල්‍ය අනුග්‍රහය විද්‍යාර්ථීන් 53දෙනෙකු සඳහා ලබා දී ඇත (2015 වර්ෂයේ රු.මිලියන 69.8 හා සංසන්දනාත්මකව) .

එයට අමතරව, දේශීය පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමට විද්‍යාර්ථීන් සඳහා ප්‍රදාන 53ක් ලබා දෙන ලදී. ප්‍රදානවල මුළු වටිනාකම රු.මිලියන 151කි. එයට අමතරව පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනිම සඳහා විදේශගත වීමට විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගුවන් ගමන් පත් ලෙස රු.මි. 4.3ක් ලබා දී ඇත. ජාතික විද්‍යා පදනම (NSF) සහ ජාතික පර්යේෂණ මණ්ඩලය (NRC) වැනි රාජ්‍ය ආයතනයන් ද පර්යේෂණ ධාරිතාව වැඩි කිරීම සඳහා සහ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා අද්‍යයන කාර්ය මණ්ඩලයට භාණ්ඩාගාර අරමුදල් ලබා දෙන ලදී.

<u>යටිතල පහසුකම් සංවර්ධනය</u>

සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති හා දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ විස්තර ඒ සඳහා වෙන් කරන ලද අරමුදල් සමඟ පහත පරිදි වේ:

සිසුන්ගේ ඉගෙනුම් පරිසරය සහ නේවාසික පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා 2016 වර්ෂයේ දී පහත සඳහන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නව ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදී.

- ශිෂ්‍ය නේවාසිකාගාර – 73 (රු.මිලියන 12,943)
- අධයයන ගොඩනැගිලි -148 (රු.මිලියන 4,406)
- ශිෂ්‍ය විනෝදාස්වාදන පහසුකම් - 43 (රු.මිලියන 254 )
- පරිපාලනමය ගොඩනැගිලි - 9 (රු.මිලියන 282)
- කාර්ය මණ්ඩල නිල නිවාස – 11 (රු.මිලියන 655)

දැනට ක්‍රියාත්මක නව ව්‍යාපෘති වනුයේ:

- ශිෂ්‍ය නේවාසිකාගාර – 34 (රු.මිලියන 6,559 )
- අධයයන ගොඩනැගිලි -113 රු.මිලියන 29,164 )
- ශිෂ්‍ය විනෝදාස්වාදන පහසුකම් - 29 (රු.මිලියන 3,026 )
- පරිපාලනමය ගොඩනැගිලි - 5 (රු.මිලියන 667 )
- කාර්ය මණ්ඩල නිල නිවාස – 11 (රු.මිලියන 655 )

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දැනට ඉදි කරගෙන යනු ලබන සිව් මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2015 මැයි මස 29 දින ආරම්භ කරන ලද අතර 2017 අවසානයට පෙර නිම කිරීමට අපේක්ෂිතය.

<u>විශ්වවිද්‍යාල - ව්‍යාපාර සබඳතා (UBL) වැඩි දියුණු කිරීම</u>

විශ්වවිද්‍යාල - ව්‍යාපාර සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී:

- නව කොමිෂන් සභා චක්‍රලේඛයක් නිකුත් කිරීම මඟින් හා GIZ වැඩසටහනේ අනුග්‍රහයෙන් විශ්වවිද්‍යාල ව්‍යාපාර කුටි ස්ථාපනය කිරීමට අවසර ලබා දිම තුළින් විශ්වවිද්‍යාල - ව්‍යාපාර සබඳතා (UBL) වැඩි දියුණු කිරීම සඳහා නව ක්‍රමවේදයක් ගොඩ නගන ලදී.

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධිධාරීන්ගේ ධාරිතාව ගොඩ නැගීම සඳහා තිරසාර ක්‍රියාවලින් සංවර්ධනයට සහාය ලබා ගැනීමට ලංකා සේවා සම්මේලනයේ නියෝජිතයන්ට, සහ ශ්‍රී ලංකා වාණිජ්‍ය මණ්ඩලයේ හා ජාතික වාණිජ්‍ය මණ්ඩලයේ නියෝජිතයන්ට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුවට ආරාධනා කරන ලදී.

<u>තොරතුරු තාක්ෂණ (IT) සංවර්ධනය</u>

සමාලෝචිත වර්ෂය තුළ දී, මාර්ගගත ගෙවීම්, "Tapol"ඒකක ක්‍රියාකාරීත්වය ස්වයංක්‍රියකරණය, නෛතික කටයුතු වාර්තා කිරීම හා ප්‍රවේශය, සිසුන්ට නවකවදය ආශ්‍රිත පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා මෘදුකාංග සංවර්ධනය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රසාරණය වන ක්‍රියාකාරකම් සඳහා ඉඩ සැලසීම සඳහා කොමිෂන් සභා "V-LAN" ජාලය පුළුල් කරන ලදී. වර්ෂය තුළ දී තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය සඳහා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය සහ සාධරණත්වය සඳහා වූ කේන්ද්‍රය සඳහා නව වෙබ් අඩවි දෙකක් සංවර්ධනය කරන ලදී.

<u>මූල්‍ය පරිපාලනය හා කළමනාකරණය</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම ඉල්ලා සිටි අතර මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් යන දෙකම සඳහා රු.මිලියන 48,826 ක් අනුමත කරන ලදී.

පසුගිය වර්ෂය හා සැසඳීමේදී, විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා රජය මඟින් සිදු කළ වැටුප් වැඩි කිරීමේ වියදම ආවරණය කිරීම සඳහා 2016 වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන වෙන් කිරීම 40%කින් වර්ධනය වී ඇත.

2016 වර්ෂය තුළ දී කොමිෂන් සභාවේ විගණන කමිටුව අවස්ථා හයක දී රැස් වී ඇති අතර මහා භාණ්ඩාගාර මඟින් හඳුන්වා දෙන ලද යහ පාලන සහ කළමනාකරණ ක්‍රමවේද තුළින් මූල්‍ය කළමනාකරණය ඉහළ නැංවීම සඳහා සහාය දක්වනු පිණිස කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන වාර්තා 18ක් නිකුත් කරන ලද අතර ඉන් 07ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා අදාළව වන අතර වාර්තා 11ක් උසස් අධ්‍යාපන ආයතන සඳහා විය.

ඉදිරි වර්ෂයේ දී කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල පහසු ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී උසස් අධ්‍යාපනයේ උත්තරීතර උපදේශනාත්මක හා නියාමන ආයතනය වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නව විෂයන් සම්බන්ධව ආයතන චක්‍රලේඛ 14ක් හා නව විෂයයන් සම්බන්ධව කොමිෂන් සභා චක්‍රලේඛ 19ක් ද ( 2015 දී 14) නිකුත් කරන ලද අතර අනෙකුත් ඒවා මඟින් පෙර චක්‍රලේඛ යාවත්කාල කරන ලදී.

<u>උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය</u>

මෙය ලෝක බැංකු ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ අදාළ ක්ෂේත්‍ර පිළිබඳව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය සමඟ අවසන් තීරණයකට එළැඹෙන ලදී. ඇ.ඩො. මිලියන 100ක් ලබා දෙනු ඇත. ව්‍යාපෘතියේ විෂය පථය වනුයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ, කොමිෂන් සභාවේ, රාජ්‍ය විශ්වවිද්‍යාල 15, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් තාක්ෂණ ආයතනවල හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ( උපාධි ප්‍රදානය කරන ආයතන) හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘතිය මඟින් සහයෝගය දැක්වීමය. වෙනත් සංවර්ධන නියෝජිතායතන සහ විදේශ රාජ්‍යයන් විසින් දැනටමත් මූල්‍යායනය කර ඇති

ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති හැර ඉහත උසස් අධ්‍යාපන ආයතනවල සංවර්ධනය හා සවිමත් කිරීම සඳහා AHEAD ව්‍යාපෘතිය යටතේ සහාය ලබා දෙනු ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූලි මස ආරම්භ වනු ඇති අතර අවශ්‍ය අරමුදල් ලබා දෙනු ඇත.

ව්‍යාපෘතියේ වැඩසටහන් සංරචකය පහත දී ඇති ක්‍රමෝපාය ප්‍රතිඵල ක්ෂේත්‍ර තුන යටතට ගැනෙන හඳුනාගත් වැඩසටහන් සඳහා සහාය ලබා දෙයි : -

- ආර්ථික සංවර්ධනය සඳහා වන ප්‍රමුඛතා ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනයේ ලියාපදිංචිය ඉහළ නැංවීම
- උසස් අධ්‍යාපනයේ ගුණාත්මය ඉහළ නැංවීම
- උසස් අධ්‍යාපනයේ කළමනාකාරීත්වය සවිමත් කිරීම

## 2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය

සභාපති

මහාචාර්ය මොහාන් ද සිල්වා
එම්.එස්, එෆ්.ආර්.සී.එස් එඩින්, එෆ්.සී.එස්.එස්.එල්
ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,
වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගෞරව විශේෂඥ ශල්‍ය වෛද්‍ය, දකුණු කොළඹ ශික්ෂණ රෝහල

උප සභාපති

මහාචාර්ය පී.එස්.එම් ගුණරත්න
බී.එස්.සී (ව්‍යා.අධ.) (ජ.පුර), එම්.බී.ඒ (කොළඹ), එම්.එස්.සී හා පී.එච්.ඩී (සුකුබා, ජපානය), පොදු රාජ්‍ය මණ්ඩල අධිශිෂ්‍ය (මැන්චෙස්ටර්, එ.රා), ජේ.එස්.පී.එස් අධිශිෂ්‍ය (යොකොහාමා, ජපානය)
මූල්‍යකරණය පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

සාමාජිකයන්

මහාචාර්ය මලික් රණසිංහ
බී.එස්.සී ඉංජිනේරු (ගෞරව), එම්.ඒ.එස්සී (යූ.බී.සී), පී.එච්.ඩී.(යූ.බී.සී), සී ඉංජි, Int PE, එෆ්.අයි.ඊ (ශ්‍රී.ල), එෆ්.එන්.ඒ.එස් (ශ්‍රී.ල)

මහාචාර්ය ආර්.කුමාරවඩිවේල්
බී.එස්.සී (ගෞරව), පී.එච්.ඩී (බ්‍රිස්ටල්)

මහාචාර්ය හේමන්ත සේනානායක
එම්.බී.බී.එස් එම්.එස් (ප්‍රසව හා නාරිවේදය ), එෆ්.ආර්.සී.ඕ.ජී, එෆ්.එස්.එල්.ඕ.ජී, එෆ්.ආර්.සී.එස්.ඊ.ඩී

වෛද්‍ය උවයිස් හනීෆා
එම්.බී.බී.එස්, ඩී.එෆ්.එම්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා.,එම්.එස්.සී, එම්.ඩී, එෆ්.සී.ජී.පී, එම්.ආර්.සී.ජී.පී

ආචාර්ය වික්‍රම වීරසූරිය
එල්.එල්.බී (ලංකා), පී.එච්.ඩී (ලන්ඩන්), නීතිඥ

මහා භාණ්ඩාගාර නියෝජිත

ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර (2016.04.24 දින සිට )
පී.එච්.ඩී ආර්ථික විද්‍යාව මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලය, එ.රා, එම්.එස්.සී ආර්ථික විද්‍යාව මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලය, එ.රා එම්.බී.ඒ කොළඹ විශ්වවිද්‍යාලය, බී.කොම් කැලණිය විශ්වවිද්‍යාලය

ලේකම්

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
බී.එස්.සී (ගෞරව), එම්.බී.ඒ (කොළඹ), පී.එච්.ඩී. (වූහුම්)

(9 වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා ඉහත සාමාජිකයන් 2015.03.04 දින පත් කරන ලදී. )

**3.** විශ්වවිද්‍යාල හා අයතන කළමනාකරණය

**3.1** කොළඹ විශ්වවිද්‍යාලය

කුලපති
අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ

උප කුලපති
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක

ලේඛකාධිකාරී
කේ.ඒ.එස්. එඩ්වඩ් මහතා

**3.2** පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය පී.ඩබ්. ඇපාසිංහ

උප කුලපති
මහාචාර්ය යූ.බී දිසානායක

ලේඛකාධිකාරී
යූ.ඩී. දොඩන්වල මහතා

**3.3** කැලණිය විශ්වවිද්‍යාලය

කුලපති
මහෝපාධ්‍යාය, පූජ්‍ය වැලමිටියාවේ ධර්මකීර්ති ශ්‍රී කුසලධම්ම හිමි

උප කුලපති
මහාචාර්ය වයි.එම්. සුනන්ද මද්දුම බණ්ඩාර

ලේඛකාධිකාරී
ඩබ්.එම්. කරුණාරත්න මහතා

3.4 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි

උපකුලපති
මහාචාර්ය සම්පත් අමරතුංග

ලේඛකාධිකාරී
කේ.ජී. බ්‍රිටෝ මහතා

3.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති
විද්‍යා ජෝති මහාචාර්ය කේ.කේ.වයි. ඩබ්. පෙරේරා

උප කුලපති
මහාචාර්ය ඒ.කේ.ඩබ්. ජයවර්ධන

නියෝජ්‍ය උප කුලපති
මහාචාර්ය ආර්.ඒ. අත්තලගේ

ලේඛකාධිකාරී
ඒ.එල්.ජවුෆර් සදීක් මහතා

3.6 යාපනය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එස් පද්මනාදන්

උප කුලපති
මහාචාර්ය වසන්ති අරසරත්නම් මිය

ලේඛකාධිකාරී
වී. කන්දීපන් මහතා ( 2016.01.01 සිට 2016.03.10 දක්වා)
එන්. රාජාවිශන් මහතා (වැඩ බලන) ( 2016.03.11 සිට 2016.12.31 දක්වා)

3.7 රුහුණ විශ්වවිද්‍යාලය

කුලපති
අති පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලත්තර සුමනජෝති නායක හිමි

**උප කුලපති**
මහාචාර්ය ගාමිණී සේනානායක

**නියෝජ්‍ය උපකුලපති**
ආචාර්ය ඒ.එම්.එන් අලගියවන්න

**ලේඛකාධිකාරී**
පී.එස්. කළුගම මිය

**3.8** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

**කුලපති**
මහාචාර්ය කොල්වින් ගුණරත්න

**උප කුලපති**
මහාචාර්ය එස්.ඒ. ආරියදුරෙයි

**නියෝජ්‍ය උප කුලපති**
මහාචාර්ය කමල් බී ගුණහේරත්

**ලේඛකාධිකාරී**
ඩබ්.එල්. වින්දාා ජයසේන මිය

**3.9** ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

**උප කුලපති**
මහාචාර්ය ටී. ජයසිංහම්

**නියෝජ්‍ය උපකුලපති**
ආචාර්ය කේ.ඊ. කරුණාකරන්

**ලේඛකාධිකාරී**
වී.කන්දීපන් මහතා ( 2016.03.10 සිට 2016.12.31 දක්වා)
ඒ. පාහිරදන් මහතා (වැඩ බලන ) (2015.02.01 සිට 2016.03.09 දක්වා )

**3.10** ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

**කුලපති**
මහාචාර්ය අකි. එම්. ඉෂාක්

**උප කුලපති**
මහාචාර්ය එම්.එම්.එම්. නජීම්

**ලේඛකාධිකාරී**
එච්. අබ්දුල් සත්තාර් මහතා (2016.01.01 සිට 2016.07.31 දක්වා )

එම්.අයි. නව්ෆර් මහතා (වැඩ බලන) (2016.08.01 සිට 2016.12.31 දක්වා)

**3.11** ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**කුලපති**
මහාචාර්ය ලීල් ගුණසේකර

**උප කුලපති**
මහාචාර්ය කේ.එච්. රංජිත් විජයවර්ධන

**ලේඛකාධිකාරී**
ජී.එම්.ජී.බී. අබේසිංහ මහතා

**3.12** ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**කුලපති**
මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර හිමි

**උප කුලපති**
මහාචාර්ය චන්ද්‍රන පී. උඩවත්ත

**ලේඛකාධිකාරී**
එම්.එෆ්. හිබතුල් කරීම් මහතා

**3.13** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**කුලපති**
මහාචාර්ය ටියුලින් ද සිල්වා

**උප කුලපති**
මහාචාර්ය එස්. ජේ. බී.ඒ ජයසේකර

**ලේඛකාධිකාරී**
ජී.පියරත්න මහතා

**3.14** ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**කුලපති**
පූජ්‍ය බෙන්ගමුවේ ධම්මදින්න හිමි

**උප කුලපති**
ආචාර්ය ජී.චන්ද්‍රසේන

**ලේඛකාධිකාරී**
ජී.ජී. කරුණාරත්න මහතා (පැවරුම් පදනම මත)

**3.15** සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය

කුලපති
පද්ම ශ්‍රී අචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව
සංගීත් නිපුන් මහාචාර්ය සනත් නන්දසිරි (2016.11.23 සිට)

උප කුලපති
මහාචාර්ය ආරියරත්න කළුආරච්චි

ලේඛකාධිකාරී
බී.එම්.දයාවංශ මහතා

**3.16** කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්.සමිත

**3.17** පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි

**3.18** දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
වෛද්‍ය එස්.ඩී. හපුආරච්චි මිය

**3.19** මානව සම්පත් අභිවර්ධන ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි

**3.20** වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.ජේ. ද සිල්වා

**3.21** පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජගත් වීරසිංහ

**3.22** කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය අජන්ත ධර්මසිරි

**3.23** කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය කේ.පී. හේවාගමගේ

**3.24** ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනය

නිසි බලධාරියා
මහාචාර්ය ජයන්ත වැලිහින්ද

**3.25** විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.එම්.ඩී.නාමල් ප්‍රියන්ත

**3.26** ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
ආර්.පී.රණවීර මහතා

**3.27** තොරතුරු තාක්ෂණ ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
එම්.එම්.පී.ඩී. සමරසේකර මිය

**3.28** ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

**3.29** සෞන්දර්යය අධ්‍යයන පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය සිවගනනම් ජයසේකර්

**3.30** ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය එච්.වී.එම්. රත්වත්තේ මිය

**3.31** මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ
මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න (වැඩ බලන)

**3.32** කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
එම්.පී.පියතිලක මහතා

4. විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

(සාමාන්‍ය ප්‍රවේශය හා විශේෂ විධිවිධාන යටතේ)

2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම

(2015 අගෝස්තු මස පැවැති අ.පො.ස (උ/පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව)

සමාලෝචිත කාලය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි මස "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය -2015/2016 " අත්පොත ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම පොත 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට මාර්ගෝපදේශ සපයයි. විවිධ අධ්‍යයන වැඩසටහන් සඳහා ඇතුළත් කර ගැනීමට යෝජිත සිසුන් සංඛ්‍යාව සහ පියවල තොරතුරු මෙම පොතෙහි දක්වා ඇත. 2016 අප්‍රියෙල් මාසයේ දී 2015 අගෝස්තු මස පැවැති අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටින ලද සිසුන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවන ලදී. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වූයේ 2016 මැයි මස 16 වන දිනයි.

**යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 28,950 ක් විය.** මෙය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී 10% ක වර්ධනයකි. අදාළ ශිෂ්‍ය සංඛ්‍යාව විෂය ධාරා 6ක් යටතේ (කලා, ජෛවීය විද්‍යා, භෞතික විද්‍යා, ඉංජිනේරු තාක්ෂණය, ජෛව පද්ධති තාක්ෂණය හා වාණිජ්‍ය) පොතෙහි ලැයිස්තුගත කර ඇති ඉහත උසස් අධ්‍යාපන ආයතන 22 හි පවත්වාගෙන යනු ලබන ප්‍රථම උපාධි වැඩසටහන් 99 ක් සඳහා ඇතුළත් කර ගනී.

- **සාමාන්‍ය ප්‍රවේශය යටතේ තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව - 26,541**
- **විශේෂ ප්‍රවේශය යටතේ තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව - 2,409**

විභාග දෙපාර්තමේන්තුවට අනුව 2015 අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා සිසුන් **309,069ක්** පෙනී සිටින ලදී ( අපේක්ෂකයන් 236,072 ක් පාසල් අයදුම්කරුවන් වූ අතර **72,997** ක් පෞද්ගලික අයදුම්කරුවන් විය). මෙම සංඛ්‍යාවෙන් සිසුන් **155,550**ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීය (50.3%).

**4.1.1** සාමාන්‍ය විධිවිධාන යටතේ තෝරා ගත් සිසුන් සංඛ්‍යාව (සමස්තය 26,541)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම්පත් 68,299ක් ලැබුණි. 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා එක් එක් ප්‍රථම උපාධි වැඩසටහන සඳහා කඩඉම් ලකුණු 2016 සැප්තැම්බර් මස නිකුත් කරන ලද අතර අයදුම් කළ සිසුන් අතරින් සිසුන් 26,541 ක් සාමාන්‍ය ප්‍රවේශය යටතේ තෝරා ගන්නා ලදී. සුදුසුකම් ලැබූ හා අයදුම් කළ සිසුන් අතරින් සාමාන්‍ය ප්‍රවේශය යටතේ තෝරා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය අනුපිළිවෙළින් 17.1% ක් හා 38.8% ක් විය.

4.1.2 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීමේ දී පහත ප්‍රවේශ ප්‍රතිපත්ති යොදා ගන්නා ලදී.

4.1.3 2015 වර්ෂයේ පැවැති අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අපේක්ෂකයන් විසින් ලබාගත් ඉසෙඩ් අගයේ සාමාන්‍ය මත ලබා ගත් පෙළ ගැස්වූ කුසලතා අනුපිළිවෙල මත පදනම්ව විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම තීරණය කෙරෙනු ඇත.

4.1.4 කලා විෂය ධාරාවට අදාළ පාඨමාලා සඳහා ( එනම් කලා, කලා (SP), කලා (SAB), සන්නිවේදන අධ්‍යයන, සාමය හා ගැටුම් කළමනාකරණය, ඉස්ලාමීය අධ්‍යයන, අරාබි භාෂාව සඳහා) දෙන ලද දිස්ත්‍රික්කයකින් ඇතුළත් කර ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1993/94 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂ අතරින් වැඩි සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කර ගත් වර්ෂයට වඩා අඩු නොවන බවට වූ කොන්දේසියට යටත්ව දීප ව්‍යාප්ත කුසලතා අනුපිළිවෙල මත ප්‍රවේශය සිදු කෙරෙනු ඇත.

4.1.5 ඉහත 4.1.2 හි සඳහන් කරන ලද පාඨමාලාවලට අමතරව අනෙකුත් සියලු පාඨමාලා සඳහා පහත නිර්ණායක දෙක මත පදනම්ව සිසුන් ඇතුළත් කර ගනී:

- දීප ව්‍යාප්ත කුසලතාව
- දිස්ත්‍රික් පදනම මත කුසලතාව

4.1.5.1 පවතින ස්ථාන සංඛ්‍යාවෙන් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතාව මත පෙළ ගැස්වූ ඉසෙඩ් අගයේ අනුපිළිවෙළ මත පුරවනු ලැබේ.

4.1.5.2 එක් එක් පාඨමාලාවේ පවතින ස්ථාන සංඛ්‍යාවෙන් 55%ක් එක් එක් දිස්ත්‍රක්කයේ ජනගහනය රටේ මුළු ජනගහනට දක්වන අනුපාතය මත පරිපාලන දිස්ත්‍රක්ක 25 අතර වෙන් කෙරේ.

4.1.5.3 එක් එක් පාඨමාලාවේ පවතින ස්ථාන සංඛ්‍යාවෙන් 5%ක් පහත සඳහන් අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර දිස්ත්‍රික් 16 අතර, දිස්ත්‍රික් ජනගහනය, දිස්ත්‍රක් 16 මුළු ජනගහනයට දක්වන අනුපාතය මත වෙන් කෙරේ;

| | |
|---|---|
| 1. නුවරඑළිය | 9. මඩකලපුව |
| 2. හම්බන්තොට | 10. අම්පාර |
| 3. යාපනය | 11. පුත්තලම |
| 4. කිලිනොච්චිය | 12. අනුරාධපුරය |
| 5. මන්නාරම | 13. පොලොන්නරුව |
| 6. මුලතිව් | 14. බදුල්ල |
| 7. වව්නියාව | 15. මොණරාගල |
| 8. ත්‍රිකුණාමලය | 16. රත්නපුරය |

කලා හැර වෙනත් පාඨමාලාවන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනිමේදී ද කිසියම් දිස්ත්‍රක්කයකට වෙන් කර ඇති පංගු ප්‍රමාණය එම දිස්ත්‍රකික්ය සඳහා 1993/1994 අධ්‍යයන වර්ෂයේ වෙන් කරන පංගු ප්‍රමාණයට වඩා අඩු නොවන බවට තහවුරු කෙරේ.

නව අධ්‍යයන පාඨමාලා හා ඇතුළත් කර ගත් ශිෂ්‍ය සංඛ්‍යාව **(මුළු සිසුන් සංඛ්‍යාව 2075)**

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ හැදෑරිය හැකි අධ්‍යයන පාඨමාලා ලැයිස්තුවට 2015/2016 අධ්‍යයන වර්ෂයේ දී පහත නව අධ්‍යයන පාඨමාලා එකතු කරන ලදී. නව පාඨමාලා සහ එක් එක් පාඨමාලාවට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව පහත වගුවේ ලැයිස්තුගත කර ඇත:

| | අධ්‍යයන පාඨමාලාව | විශ්වවිද්‍යාලය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ඉංජිනේරු තාක්ෂණවේදය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>කැලණිය විශ්වවිද්‍යාලය<br>යාපනය විශ්වවිද්‍යාලය<br>රුහුණු විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය<br>රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව<br>ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 775 |
| 2 | ජෛව පද්ධති තාක්ෂණවේදය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>යාපනය විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 625 |
| 3 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>කැලණිය විශ්වවිද්‍යාලය<br>වව්නියාව මණ්ඩපය<br>රුහුණු විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය<br>රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 425 |
| 4 | භෞතික විද්‍යාව - තො.ස.තා | කැලණිය විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 100 |
| 5 | සාගර සහ මිරිදිය විද්‍යා | රුහුණු විශ්වවිද්‍යාලය | 50 |
| 6 | ආහාර ව්‍යාපාර කළමනාකරණය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 50 |
| 7 | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම | කැලණිය විශ්වවිද්‍යාලය | 50 |
| | | එකතුව | **2075** |

<u>2015/2016 වර්ෂය සඳහා යෝජිත හා තෝරා ගත් සිසුන් සංඛ්‍යාව සහ පෙර වර්ෂ දෙකේ දී තෝරා ගත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි ලැයිස්තුගත කර ඇත. ( සංසන්දනය කිරීම සඳහා) :</u>

| අධ්‍යයන පාඨමාලාව | තෝරා ගත් සංඛ්‍යාව සාමාන්‍ය **2015/2016** | තෝරා ගත් සංඛ්‍යාව සාමාන්‍ය **2014/2015** | තෝරා ගත් සංඛ්‍යාව සාමාන්‍ය **2013/2014** |
|---|---|---|---|
| 1. වෛද්‍ය විද්‍යාව | 1,242 | 2,223 | 1,234 |
| 2. දන්ත ශල්‍ය විද්‍යාව | 78 | 78 | 102 |
| 3. පශු වෛද්‍ය විද්‍යාව | 79 | 98 | 116 |

| | | | |
|---|---|---|---|
| 4. කෘෂිකර්මය | 569 | 604 | 627 |
| 5. ආහාර විද්‍යාව හා පෝෂණය | 108 | 108 | 118 |
| 6. ජෛවීය විද්‍යාව | 1,253 | 1,397 | 1,380 |
| 7. ව්‍යවහාරික විද්‍යාව(ජෛවිය විද්‍යාව) | 208 | 208 | 212 |
| 8. ඉංජිනේරු විද්‍යාව | 1,636 | 1,486 | 1,494 |
| 9. ඉංජිනේරු විද්‍යාව - (EM) | 48 | 48 | 58 |
| 10. ඉංජිනේරු විද්‍යාව - (TM) | 58 | 48 | 57 |
| 11. ප්‍රමාණ සමීක්ෂණය | 123 | 123 | 130 |
| 12. පරිගණක විද්‍යාව | 332 | 297 | 297 |
| 13. භෞතිය විද්‍යාව | 1,880 | 1,941 | 1,932 |
| 14. මැනුම් විද්‍යාව | 78 | 78 | 61 |
| 15. ව්‍යවහාරික විද්‍යාව (භෞතිය විද්‍යාව) | 442 | 412 | 414 |
| 16. කළමනාකරණය | 3,825 | 3,760 | 3,619 |
| 17. දේපල කළමනාකරණය හා තක්සේරුකරණය | 58 | 59 | 69 |
| 18. වාණිජ්‍යය | 643 | 630 | 537 |
| 19. කලා | 4,851 | 4,827 | 4,744 |
| 20. කලා (SP)- ජනමාධ්‍ය | 79 | 79 | 79 |
| 21. කලා (SAB) | 224 | 226 | 198 |
| 22. කළමනාකරණ අධ්‍යයන - (TV) –A | 198 | 172 | 204 |
| 23. වාස්තු විද්‍යාව | 53 | 53 | 54 |
| 24. නිර්මාණවේදය | 41 | 48 | 44 |
| 25. නීතිය | 346 | 346 | 368 |
| 26. තොරතුරු තාක්ෂණය | 198 | 198 | 199 |
| 27. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය | 48 | 48 | 48 |
| 28. කළමනාකරණය (රාජ්‍ය) (විශේෂ) | 73 | 73 | 85 |
| 29. සන්නිවේදන අධ්‍යයනය | 98 | 74 | 74 |
| 30. නගර හා ග්‍රාම නිර්මාණය | 48 | 48 | 65 |
| 31. සාමය හා ගැටුම් නිරාකරණය | 33 | 33 | 34 |
| 32. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 296 | 296 | 288 |
| 33. යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 58 | 58 | 63 |
| 34. විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය | 48 | 38 | 38 |
| 35. ආහාර විද්‍යාව හා තාක්ෂණය | 148 | 158 | 140 |
| 36. සිද්ධ වෛද්‍ය විද්‍යාව | 100 | 98 | 98 |
| 37. හෙද | 223 | 223 | 210 |
| 38. තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය | 148 | 148 | 148 |
| 39. කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය | 199 | 198 | 218 |
| 40. කලා (විශේෂ) / ප්‍රසාංගික කලා | 79 | 79 | 79 |
| 41. සෞඛ්‍ය ප්‍රවර්ධන | 48 | 48 | 50 |
| 42. ඖෂධ විද්‍යාව | 118 | 118 | 110 |
| 43. වෛද්‍ය රසායනාගාර විද්‍යාව | 113 | 113 | 117 |
| 44. විකිරණ ශිල්පය | 43 | 43 | 47 |
| 45. භෞත චිකිත්ස | 58 | 59 | 75 |
| 46. පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය | 48 | 48 | 51 |

| | | | |
|---|---|---|---|
| 47. පහසුකම් කළමනාකරණය | 48 | 48 | 52 |
| 48. ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 53 | 53 | 52 |
| 49. අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 58 | 59 | 75 |
| 50. කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | 88 | 88 | 88 |
| 51. සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | 48 | 48 | 49 |
| 52. පරිගණනය හා කළමනාකරණය | 48 | 48 | 61 |
| 53. ධීවර සහ සාගර විද්‍යාව | 58 | 58 | 61 |
| 54. ඉස්ලාම් අධ්‍යයන | 250 | 248 | 198 |
| 55. විද්‍යාව සහ තාක්ෂණය | 58 | 58 | 58 |
| 56. පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | 58 | 58 | 58 |
| 57. ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 63 | 63 | 63 |
| 58. සත්ත්ව පාලන විද්‍යාව | 58 | 58 | 58 |
| 59. සංගීතය | 362 | 371 | 392 |
| 60. නැටුම් | 326 | 322 | 326 |
| 61. චිත්‍ර සහ නිර්මාණ | 33 | 28 | 28 |
| 62. නාට්‍ය හා රංග කලා | 83 | 83 | 83 |
| 63. දෘශ්‍ය සහ තාක්ෂණික කලා | 41 | 48 | 48 |
| 64. අපනයන කෘෂිකර්මය | 58 | 58 | 58 |
| 65. තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම | 58 | 58 | 58 |
| 66. කාර්මික තොරතුරු තාක්ෂණය | 58 | 58 | 60 |
| 67. ඛනිජ සම්පත් සහ තාක්ෂණය | 59 | 58 | 59 |
| 68. ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) | 48 | 48 | 54 |
| 69. කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය ( අග්නිදිග වි.වි) | 118 | 108 | 115 |
| 70. ආගනණය සහ තොරතුරු පද්ධති | 98 | 98 | 78 |
| 71. ශාරීරික අධ්‍යාපනය | 48 | 38 | 48 |
| 72. ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | 88 | 88 | 88 |
| 73. කථන හා ශ්‍රවන විද්‍යාව | 48 | 48 | 74 |
| 74. අරාබි භාෂාව | 198 | 198 | 145 |
| 75. දෘශ්‍ය කලා | 96 | 96 | 95 |
| 76. සත්ත්ව පාලන සහ මත්ස්‍ය විද්‍යාව | 48 | 49 | 52 |
| 77. ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය | 58 | 58 | 60 |
| 78. ජලජ සම්පත් තාක්ෂණය | 58 | 58 | 58 |
| 79. තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | 58 | 58 | 58 |
| 80. ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 63 | 63 | 63 |
| 81. තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | 99 | 98 | 114 |
| 82. සංචාරක හා සත්කාරක කළමනාකරණය | 119 | 118 | 139 |
| 83. කෘෂි සම්පත් කළමනාකරණය හා | 148 | 149 | 157 |

| | | | |
|---|---|---|---|
| තාක්ෂණය | | | |
| 84. කෘෂි ව්‍යාපාර කළමනාකරණය | 48 | 49 | 52 |
| 85. හරිත තාක්ෂණය | 4/8 | 48 | 48 |
| 86. තොරතුරු පද්ධති | 98 | 98 | 98 |
| 87. භූ දර්ශන වාස්තු විද්‍යාව | 47 | 40 | 48 |
| 88. පරිවර්තන අධ්‍යයන | 71 | 71 | 72 |
| 89. මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 48 | 48 | 53 |
| 90. සිනමා හා රූපවාහිනී අධ්‍යයනය | 48 | 48 | - |
| 91. ව්‍යාපෘති කළමනාකරණය (නව) | 48 | 49 | - |
| 92. ඉංජිනේරු තාක්ෂණය (නව) | 767 | - | - |
| 93. ජෛව පද්ධති තාක්ෂණය (නව) | 620 | - | - |
| 94. තොරතුරු සන්නිවේදන තාක්ෂණය (නව) | 422 | - | - |
| 95. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) | 48 | - | - |
| 96. සාගර හා මිරිදිය විද්‍යා (නව) | 48 | - | - |
| 97. ආහාර ව්‍යාපාර කළමනාකරණය (නව) | 48 | - | - |
| 98. භෞතික විද්‍යාව- තො.ස.තා (නව) | 98 | - | - |
| යෝජිත මුළු සංඛ්‍යාව | 27,603 | 25,395 | **24,540** |
| සාමාන්‍ය විධිවිධාන යටතේ තෝරා ගත් මුළු සංඛ්‍යාව | **26,541** | **24,343** | **24,180** |
| සඳහන් කළ විශේෂ විධිවිධාන යටතේ තෝරා ගත් මුළු සංඛ්‍යාව | **2,809** | **1,333** | **1,020** |
| ජාතික/අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයන හැර වෙනත් ක්ෂේත්‍රවල විශිෂ්ඨ දක්ෂතා දැක්වූ සිසුන් | | | |
| විදේශ සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කිරීම | | | |
| සන්නද්ධ හමුදා,පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් | | | |
| විශේෂ විෂයන් සඳහා අතිරේක ප්‍රවේශය යටතේ ඇතුළත් කිරීම, | | | |
| අන්ද හා ආබාධිත | | | |
| ගුරුවරුන් ඇතුළත් කිරීම | | | |
| අභියාචනා | | | |
| සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ තෝරා ගත් මුළු සිසුන් ගණන | **28,950** | **25,676** | **25,200** |

# 5. අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම

## 5.1 ස්ථාවර කමිටු

1978 අංක 16 දරන විශ්විද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත) 4 (2) ඡේදයේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු පිහිටුවා ඇත. එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම නම් අදාළ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය හා සම්බන්ධ කරුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීමය. ඒ අනුව 2016 වර්ෂය තුළ විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු විස්සක් (20) හා වෙනත් එක් (1) කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය යටතේ ක්‍රියාත්මක විය. එක් එක් කමිටුව යටතේ පැවැති රැස්වීම් වාර ගණන පහත සඳහන් කර ඇත. තවත් ස්ථාවර කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව සම්පත් දෙපාර්තමේන්තුව මඟින් කැඳවනු ලැබිය. ;

එක් එක් ස්ථාවර කමිටුව යටතේ පවත්වන ලද රැස්වීම් වාර සංඛ්‍යාව පහත දක්වා ඇත;

| අංකය | ස්ථාවර කමිටුවේ නම | 2016 දී පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටුව | 02 |
| 02. | වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 03. | තත්ත්ව සහතිකකරණය හා ප්‍රතීතනය පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 04. | දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 05. | විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 06. | උසස් අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුව | - |
| 07. | කෘෂිකර්ම, පශු වෛද්‍ය විද්‍යා හා සත්ත්ව පාලන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 08. | පශ්චාත් උපාධි අධ්‍යයනය හා පර්යේෂණය පිළිබඳ ස්ථාවර කමිටුව | 03 |
| 09. | ඉංජිනේරු හා වාස්තු විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 10. | තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 11. | මානව ශාස්ත්‍ර සමාජ විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 12. | අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව | 02 |
| 13. | ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව | 04 |
| 14. | කළමනාකරණ අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 15. | බාහිර උපාධි පිළිබඳ ස්ථාවර කමිටුව | 01 |
| 16. | පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 17. | නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව | 02 |
| 18. | පුස්තකාල හා තොරතුරු විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 19. | ලලිත කලා පිළිබඳ ස්ථාවර කමිටුව | 01 |
| 20. | කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව | |
| | | |
| | සුදුසුකම් /උපාධි ප්‍රදාන ආයතන පිළිගනු ලැබීම සඳහා වූ අයදුම්පත් අධ්‍යයනය කිරීම සඳහා වූ කමිටුව | 04 |

**5.2** 2016 වර්ෂයේ දී අනුමත කරන ලද ශාඛා/ පීඨ/ අධ්‍යයනාංශ/ කේන්ද්‍ර

2016 වර්ෂයේ දී අනුමත කරන ලද ශාඛා

| අංකය | ශාඛාවේ නම | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| 1. | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය - කොළඹ ශාඛාව | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය |

2016 වර්ෂයේ දී අනුමත කරන ලද පීඨයන් (09)

| අංකය | පීඨයේ නම | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| 1. | තාක්ෂණ පීඨය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 2. | හෙද පීඨය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. | ව්‍යාපාර පීඨය | මොරටුව විශ්වවිද්‍යාලය |
| 4. | තාක්ෂණ පීඨය | යාපනය විශ්වවිද්‍යාලය |
| 5. | තාක්ෂණ පීඨය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 6. | තාක්ෂණ පීඨය | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| 7. | තාක්ෂණ පීඨය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය |
| 8. | තාක්ෂණ පීඨය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 9. | වෛද්‍ය පීඨය* | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |

** 2015 වර්ෂයේ දී අනුමත කොට 2016 වර්ෂයේ දී ගැසට් පත්‍රයේ පළ කරන ලදී.*

වර්ෂයේ දී අනුමත නව අධ්‍යයනාංශ (34)

| අංකය | අධ්‍යයනාංශයේ නම | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| 1. | වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 2. | වෛද්‍ය මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. | බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 4. | සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 5. | මෙවලම් හා ස්වයංක්‍රීය ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 6. | පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 7. | කෘෂිකර්ම තාක්ෂණ අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 8. | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 9. | මූලික හෙද විද්‍යා අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 10. | සායනික හෙද විද්‍යා අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 11. | හෙද විද්‍යාව සඳහා මූලික විද්‍යාව / සමාජ විද්‍යා අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 12. | මූලික විද්‍යා අධ්‍යයනාංශය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 13. | අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 14. | භාෂා අධ්‍යයනාංශය | මොරටුව විශ්වවිද්‍යාලය |
| 15. | තීරණ විද්‍යා අධ්‍යයනාංශය | මොරටුව විශ්වවිද්‍යාලය |
| 16. | කාර්මික ආර්ථික විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයනාංශය | මොරටුව විශ්වවිද්‍යාලය |

| | | |
|---|---|---|
| 17. | කළමනාකරණ තාක්ෂණ අධ්‍යයනාංශය | මොරටුව විශ්වවිද්‍යාලය |
| 18. | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | යාපනය විශ්වවිද්‍යාලය |
| 19. | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | යාපනය විශ්වවිද්‍යාලය |
| 20. | අන්තර් විෂය අධ්‍යයනාංශය | යාපනය විශ්වවිද්‍යාලය |
| 21. | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 22. | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 23. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 24. | බහු විෂයයික අධ්‍යයනාංශය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 25. | නිර්වින්දනවේද අධ්‍යයනාංශය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 26. | දර්ශනය හා වටිනාකම් අධ්‍යයන අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| 27. | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| 28. | බහු විෂයයික අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| 29. | ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යානය අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය |
| 30. | ජෛව ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 31. | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 32. | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| 33. | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| 34. | නිනිති විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |

2016 වර්ෂයේ දී අනුමත කරන ලද කේන්ද්‍ර (03)

| | කේන්ද්‍රයේ නම | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| 1. | ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 2. | මුඛ පිළිකා පිළිබඳ පර්යේෂණ සඳහා කේන්ද්‍රය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 3. | ආහාර තාක්ෂණ පර්යේෂණ සහ පුහුණුව සඳහා කේන්ද්‍රය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |

**5.3** 2016 වර්ෂයේ දී අනුමත ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන්

2016 වර්ෂයේ දී අනුමත ප්‍රථම උපාධි වැඩසටහන් (38)

| | උපාධි වැඩසටහන | අධ්‍යයන පාඨමාලාව |
|---|---|---|
| 1. | බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, කොළඹ වි.වි | කලා |
| 2. | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය, මානව සම්පත් අභිවර්ධන ආයතනය | |
| 3. | ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ ව්‍යාපාර විද්‍යාවේදී ගෞරව උපාධිය, මොරටුව වි.වි | ව්‍යාපාර විද්‍යාව |
| 4. | මූල්‍ය විශ්ලේෂණය පිළිබඳ ව්‍යාපාර විද්‍යාවේදී ගෞරව උපාධිය,මොරටුව වි.වි | |
| 5. | ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර විද්‍යාවේදී උපාධිය, මොරටුව වි.වි | |
| 6. | මූල්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය, කැලණිය වි.වි | කළමනාකරණය |
| 7. | රක්ෂණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය, කැලණිය වි.වි | |
| 8. | බැංකුකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) | |

| | | |
|---|---|---|
| | උපාධිය, කැලණිය වි.වි | |
| 9. | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, කැලණිය වි.වි | පරිගණක විද්‍යාව |
| 10 | මෙවලම් හා ස්වයංක්‍රීය ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, කොළඹ වි.වි | ඉංජිනේරු තාක්ෂණය |
| 11 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර වි.වි | |
| 12 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, කැලණිය වි.වි | |
| 13 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, යාපනය වි.වි | |
| 14 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, රුහුණ වි.වි | |
| 15 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, රජරට වි.වි | |
| 16 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, සබරගමුව වි.වි | |
| 17 | නිනිති විද්‍යාව පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, වයඹ වි.වි | |
| 18 | ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, වයඹ වි.වි | |
| 19 | කෘෂිකර්මය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය, ඌව වෙල්ලස්ස වි.වි. | |
| 20 | පාරිසරික විද්‍යාව පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, කොළඹ වි.වි | ජෛව පද්ධති තාක්ෂණය |
| 21 | කෘෂිකර්මය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, කොළඹ වි.වි | |
| 22 | ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර වි.වි | |
| 23 | වාණිජ්‍ය හරිත වගාව පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, යාපනය වි.වි | |
| 24 | ආහාර නිෂ්පාදනය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, යාපනය වි.වි | |
| 25 | කෘෂිකාර්මික තාක්ෂණය හා ව්‍යවසායකත්වය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, නැගෙනහිර වි.වි | |
| 26 | කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, අග්නිදිග වි.වි | |
| 27 | ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, රජරට වි.වි | |
| 28 | ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, සබරගමුව වි.වි | |
| 29 | ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, වයඹ වි.වි | |
| 30 | ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය, ඌව වෙල්ලස්ස වි.වි | |
| 31 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය, ශ්‍රී ජ'පුර වි.වි | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| 32 | පරිගණක ජාල තාක්ෂණය පිළිබඳ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය, කැලණිය වි.වි | |
| 33 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය, යාපනය වි.වි | |
| 34 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය, රුහුණ වි.වි | |
| 35 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය, අග්නිදිග වි.වි | |
| 36 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය, රජරට වි.වි | |
| 37 | භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, කැලණිය වි.වි | භෞතික විද්‍යාව - තො.ස.තා |
| 38 | භෞතික විද්‍යාව හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, කැලණිය වි.වි | |

2016 වර්ෂයේ දී අනුමත කරන ලද පශ්චාත් උපාධි වැඩසටහන් (15)

| අංකය | වැඩසටහනේ නම | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය |
|---|---|---|
| 1. | සෞඛ්‍ය තොරතුරු විද්‍යාව පිළිබඳ වෛද්‍ය විද්‍යා ආචාර්ය උපාධිය හා මණ්ඩල සහතිකය | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය |
| 2. | වේදනා නාශක ඖෂධ පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව [PGDip(Palliative Med)] | |
| 3. | විද්‍යාගාර සත්ත්ව පාලන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි සහතික හා ඩිප්ලෝමා පාඨමාලාව | කොළඹ විශ්වවිද්‍යාලය |
| 4. | තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (MSc IT) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 5. | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 6. | වෘත්තිමය ගණකාධිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MPAcc) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 7. | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය (DBA) | කැළණිය විශ්වවිද්‍යාලය |
| 8. | මහජන සබඳතා හා මාධ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | කැළණිය විශ්වවිද්‍යාලය |
| 9. | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBA) | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 10. | මැනුම් විද්‍යා පිළිබඳ විද්‍යාපති උපාධිය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 11. | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | මානව සම්පත් අභිවර්ධන ආයතනය |
| 12. | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | මානව සම්පත් අභිවර්ධන ආයතනය |
| 13. | ආපදා විශ්ලේෂණ කළමනාකරණය හා අවම කිරීම පිළිබඳ විද්‍යාපති උපාධිය | මානව සම්පත් අභිවර්ධන ආයතනය |
| 14. | භූගෝලීය තොරතුරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | මානව සම්පත් අභිවර්ධන ආයතනය |
| 15. | සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | මානව සම්පත් අභිවර්ධන ආයතනය |

**5.4** 2016 වර්ෂයේ දී පවත්වන ලද ජාතික වැදගත්කමක් සහිත උසස් අධ්‍යාපනය පිළිබඳ පවත්වන ලද වැඩමුළු හා සාකච්ඡා

1. රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකකවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය මඟින් 2016 මාර්තු මස 30වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී වැඩමුළුවක් පවත්වන ලදී.

2. 2016 අප්‍රියෙල් මස 21වන දින පවත්වන ලද "ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය / සමානාත්මතාව පිළිබඳ උපදේශනාත්මක සංවාදය" පිළිබඳ වූ වැඩමුළුව

3. 2016 අප්‍රියෙල් මස 22- 28 දක්වා පවත්වන ලද "ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය / සමානාත්මතාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම" පිළිබඳ වැඩමුළුව

4. 2016 අගෝස්තු මස පවත්වන ලද "නවකවදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සඳහා මාර්ගගත පැමිණිලි හා ප්‍රතිකර්ම යාන්ත්‍රණ" පිළිබඳ වැඩමුළුව.

5. රාජ්‍ය විශ්වවිද්‍යාල වල අභයන්තර තත්ත්ව සහතික ඒකක වල භූමිකාව පිළිබඳ නේවාසික වැඩමුළුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය මඟින් 2016 මැයි 18 සහ 19 යන දිනවල කටුනායක ටැමරින්ඩ් ට්‍රී හෝටලයේ දී පවත්වන ලදී .

6. 2016 ජූනි මස දෙවන දින පවත්වන ලද "ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව" පිළිබඳ වැඩමුළුව

7. 2016 ජූනි 14 හා 15 යන දිනවල ගල්කිස්ස බර්ජයා හෝටලයේ පැවති අලුතින් හඳුන්වාදෙනු ලැබූ වැඩසටහන් සමාලෝචන අත්පොත පිළිබඳ වැඩසටහන් සමාලෝචකයන් පුහුණු කිරීම

8. විශ්වවිද්‍යාල පද්ධතියේ විද්‍යා පීඨ සඳහා 2016 ජූනි මස 24 දින පවත්වන ලද "ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව" පිළිබඳ වැඩමුළුව.

9. 2016 ජූනි 28වන දින ගල්කිස්ස බර්ජයා හෝටලයේ පැවති වැඩමුළුවක දී අලුතින් හඳුන්වාදෙනු ලැබූ ආයතනික සමාලෝචන අත්පොත ප්‍රකාරව ආයතනික සමාලෝචනවල දෙවන වටය සඳහා සම්පත් දායකයන් පුහුණු කරන ලදී.

10. 2016 අගෝස්තු මස පවත්වන ලද "නවකවදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්රචණ්ඩත්වය (SGBV) සඳහා මාර්ගගත පැමිණිලි හා ප්‍රතිකර්ම යාන්ත්‍රණ" පිළිබඳ වැඩමුළුව

11. " MBBS අවසාන පරීක්ෂණයේ සායනික සංරචකය" පිළිබඳ වැඩ මුළුව 2016 දෙසැම්බර් 15 වන දින පවත්වන ලදී.

12. 2016 නොවැම්බර් මස 25දින ටාජ් සමුද්‍රා හෝටලයේ දී පවත්වන ලද "උසස් උපාධි අධීක්ෂණ පිළිවෙත්වල දී ඵලදායී පර්යේෂණ " පිළිබඳ වැඩමුළුව

**5.5** <u>දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම</u>

සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික සිසුන් ඔවුන් අධ්‍යයන සුදුසුකම් ලබා ගත් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 1000කට වැඩි සංඛ්‍යාවක් පරීක්ෂා කරන ලදී.

**5.6** <u>බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා පිරිනැමීම සඳහා ප්‍රතිපත්ති රාමුව හා මාර්ගෝපදේශ පිළිබඳ වූ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 932 සඳහා සංශෝධන</u>

ඕනෑම බාහිර උපාධි උපාධි / විස්තාරිත වැඩසටහනක් සඳහා ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව පිළිබඳව මතභේදකාරී තත්ත්වයක් මතු විය. ප්‍රතිපත්ති රාමුවේ 1.6 වගන්තිය සංශෝධනය කිරීමට යෝජනා කරන ලදී. බාහිර උපාධි වැඩසටහනක් සඳහා ඇතුළත් කර ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ඒ හා සමාන අධ්‍යයන පාඨමාලාවක අභ්‍යන්තරව බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් දෙගුණයක් නොඉක්මවිය යුතුය යන්න වර්තමාන නිර්ණායකය වේ.

ප්‍රතිපත්ති රාමුවේ 1.6 වගන්තිය සඳහා යෝජිත සංශෝධනය පහත පරිදි වේ;

- 1.6. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මත පදනම්ව සිසුන් සංඛ්‍යාව තෝරා ගැනීමේ වගකීම එක් එක් විශ්වවිද්‍යාලයේ / උසස් අධ්‍යාපන ආයතනයේ / ආයතනයේ සනාතන සභාවේ ඇතුළත් කිරීමේ කමිටුවේ වගකීමකි. බාහිර උපාධි වැඩසටහනක් සඳහා ඇතුළත් කර ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ඒ හා සමාන අධ්‍යයන පාඨමාලාවක අභ්‍යන්තරව බඳවා ගන්නා තථ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව නොඉක්මවිය යුතුය.

- *කෙසේ වුවද, ඉදිරියේ දී විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන / ආයතන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව නවෝත්පාදන, ජාතිකව හා ගෝලීයව අදාළ වන්නා වූ උපාධි පාඨමාලා පමණක් හඳුන්වා දීමට/ ප්‍රවර්ධනය කිරීමට ප්‍රයත්න දැරිය යුතුය.*

- *කිසිදු තත්ත්වයක් යටතේ අධ්‍යයනාංශයක / පීඨයක බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යයනාංශයේ / පීඨයේ අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහන සඳහා ලියාපදිංචි තථ්‍ය සිසුන් සංඛ්‍යාව නොඉක්මවිය යුතුය.*

"විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන / ආයතන මඟින් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා පිරිනැමීම සඳහා ප්‍රතිපත්ති රාමුව හා මාර්ගෝපදේශ" පිළිබඳ වූ 2010 ඔක්තෝබර් 15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 932 තදින්ම පිළිපැදීම සඳහා උප කුලපතිවරුන්ට, මණ්ඩපාධිපතිවරුන්ට හා පීඨාධිපතිවරුන්ට හා උසස් අධ්‍යාපන ආයතන අධ්‍යක්ෂවරුන්ට දැන්වීමට 2016 පෙබරවාරි 26 පැවති සිය 935වන සභා වාරයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

<u>බාහිර උපාධි වැඩසටහන් සඳහා සිසුන් ලියාපදිංචි වීම - 2014 අධ්‍යයන වර්ෂය - කැලණිය විශ්වවිද්‍යාලය</u>

කැලණිය විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාලය මඟින් සපයන ලද තොරතුරු අනුව බාහිර උපාධි වැඩසටහන් සඳහා අයදුම් කළ හා අනුමැතිය ලබා දුන් සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ:

| අධ්‍යයන වැඩසටහන | විශ්වවිද්‍යාලයේ ඉල්ලුම | වි.වි.ප්‍ර.කො. එකඟතාව |
|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය | 2,432 | අවසර ලබා දෙන ලදී. |
| ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය උපාධිය) | 716 | සිසුන් 688කට සීමා කරන ලදී. |
| වාණිජවේදී (විශේෂ) උපාධිය<br>වාණිජවේදී (සාමාන්‍ය) උපාධිය | 390 | අවසර ලබා දෙන ලදී. |
| විද්‍යාවේදී උපාධිය | 522 | අවසර ලබා දෙන ලදී. |
| එකතුව | **4,060** | |

## 5.7 තාක්ෂණික විෂයයන් හඳුන්වා දීම

**2013** වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව 2015 වර්ෂයේ පැවැත්වෙන උසස් පෙළ විභාගය සඳහා තාක්ෂණික විෂය ධාරාව හඳුන්වා දෙන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තාක්ෂණික විෂය ධාරාවේ උපාධි පාඨමාලා සහ තාක්ෂණික පීඨ අනුමත කරන ලද අතර අදාළ පීඨයන්හි තාක්ෂණික අධ්‍යයනාංශ පිහිටුවීම සඳහා යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍යතාවන් සඳහා පහසුකම් 2016 වර්ෂයේ දී සලසන ලදී. පළමු සිසුන් කණ්ඩායම 2016 දී බඳවා ගන්නා ලදී.

## 5.8 විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ පද්ධති සවිබල ගැන්වීම

උසස් අධ්‍යාපන පද්ධතියෙහි ප්‍රමිතීන් පවත්වා ගැනීමට හා වැඩි දියුණු කිරීමට අධ්‍යයන හා පරිපාලන කර්තව්‍යයේ තත්ත්ව සහතිකකරණය හා ප්‍රතීතනය පාලනය කරන ශක්තිමත් යාන්ත්‍රණයක් අත්‍යඅවශ්‍ය වේ.

2005 වර්ෂයේ සැප්තැම්බර් මස පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ **තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය (QAAC)** රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වගකීම දරන ආයතනයයි.

එහි දැක්ම වනුයේ සවිමත් තත්ත්ව සහතිකකරණ පද්ධතියක සහයෝගය සමඟ උසස් අධ්‍යාපනයේ විශිෂ්ටත්වක් ලබා ගැනීම වන අතර එහි මෙහෙවර වනුයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල අඛණ්ඩ සංවර්ධනය හා කාර්යක්ෂම කාර්යසාධනය මඟින් ගුණාත්මකබව තහවුරු කිරීමත් එනයින් ජාත්‍යන්තරව පිළිගත් ඇගයීම් යාන්ත්‍රණ අනුව විශ්වවිද්‍යාල පාර්ශ්වකරුවන්ගේ ප්‍රජාවෙහි විශ්වාසය දිනා ගැනීමත්ය.

තවද එය රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයනාංශ, උපාධි වැඩසටහන් සහ පීඨ මඟින් සිදු කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම් නිවැරදිව විදහා දක්වයි. මෙම පරිශ්‍රමයේ දී, අධ්‍යයන වැඩසටහන්වල ජාත්‍යන්තර යහ ප්‍රමිතීන්ගේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා අධීක්ෂණය හා පාලනය, වැඩසටහන් හා ආයතනවල තිරසාරත්වය තහවුරු කිරීම සඳහා අත්‍යඅවශ්‍ය සංරචකයන්ය.

රජයේ විශ්වවිද්‍යාල හා ආයතනයන්හි තත්ත්ව සහතිකකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම, උපකුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) යටතේ ඇති තත්ත්ව සහතිකකරණය සඳහා වූ කමිටුවේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති තත්ත්ව සහතිකකරණය සඳහා වූ කමිටුවෙහි සහ කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලයේ සහාය ඇතිව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත.

2016 ජූනි මස දක්වා තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය (QAAC) කොමිෂන් සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක වූ අතර පසුව එය ප්‍රධන ගොඩනැගිල්ලට යාබද වෙනත් කාර්යාලයකට ගෙන යන ලදී. මෙම කාර්යාලය 2016 ඔක්තෝබර් මස 20වන දින නිල වශයෙන් හා උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. අධ්‍යක්ෂවරයෙකු ( තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන), සහකාර ලේකම්වරයෙකු පරිගණක යෙදවුම් සහකාරවරු දෙදෙනෙක් හා එක් කම්කරුවකුගෙන් මෙහි කාර්ය මණ්ඩලය සමන්විත වේ. 2016 ජනවාරි මස පළමුවන දින සිට මහාචාර්ය දීප්ති සී බණ්ඩාර අධ්‍යක්ෂ වශයෙන් ක්‍රියාකරයි.

තත්ත්ව සහතිකකරණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන ව්‍යවස්ථාපිත වගකීමකි. එය අඛණ්ඩ සහ ඉදිරියට යන ක්‍රියාවලියක් ලෙස ද සැලකේ. එබැවින්, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට ඉහළ මට්ටමේ ක්‍රියාකාරිත්වයක් සහිත ඔවුන්ගේ ම අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ පද්ධතියක් පිහිටුවා ගැනීමට හැකියාව ලබා දීමේ අරමුණින් තත්ත්ව සහතිකකරණය හා ප්‍රතීතනය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශ සහිතව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2015 මැයි මස 05 දිනැතිව චක්‍රලේඛ අංක 04/2015 නිකුත් කර ඇත. 2016 වර්ෂයේ දී සියලුම විශ්වවිද්‍යාලවල පාලක සභා විසින් අධ්‍යක්ෂ - අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණය (Director-IQA)විසින් ප්‍රධානත්වය දරන 'අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක ((IQAU)' පත් කරන ලදී. අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකක අදාළ විශ්වවිද්‍යාලවල සියලුම අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම,

සංවිධානය, සංවර්ධනය කිරීම, පහසුකම් සැලසීම හා අධීක්ෂණය සිදු කරන ලද අතර ගන්නා ලද තීරණවල ඵලදායී ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය හා සම්බන්ධ වී කටයුතු කරන ලදී.

සාමාජිකයන් 26දෙනෙකු සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණය හා ප්‍රතීතනය පිළිබඳ ස්ථාවර කමිටුව තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය වෙත සහාය දක්වන අතර විශ්වවිද්‍යාලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරයි.

## 5.9 ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) යාවත්කාල සංස්කරණය

සෑම සුදුසුකමක් සඳහාම අවශ්‍ය වන ඉගෙනුම් ප්‍රතිඵලයේ අවම මට්ටම, සුදුසුකම් දරන්නකු විසින් උපයා ගත යුතු අවම ශාස්ත්‍රීය අගය (credit) මඟින් දැක්වෙන බැවින් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව, රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන් දෙකේම උසස් අධ්‍යාපන ආයතනවලට පාඨමාලා සැලසුම් කිරීමේ දී උපකාරී වේ. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මඟින් පිරිනමනු ලබන උසස් අධ්‍යාපන සුදුසුකම්වල ගුණාත්වය වඩාත් ශක්තිමත් කිරීම කෙරෙහි දායක වේ. විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (**HETC**) මඟින් ඉදිරිපත් කරන ලද හා තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතතනය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් නිර්දේශ කරන ලද ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි යාවත්කාල පිටපත ( පළමු සංස්කරණය 2012 ජූනි, දෙවන සංස්කරණය 2012 ඔක්තෝබර්, සහ තෙවන සංස්කරණය 2013 ජනවාරි) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 සැප්තැම්බර් මස 17වන දින පැවැති සිය 925වන සභා වාරයේ දී අනුමත කරන ලදී. එය මුද්‍රණය කරන ලද අතර ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (**SLQF**) යාවත්කාල සංස්කරණය තතත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩල වෙබ් අඩවියේ (**QAAC**) පළ කර ඇත.

### ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) අනුරූපණය

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි අධ්‍යයන වැඩසටහන් සුදුසු පරිදි අනුරූපණය කිරීම තහවුරු කිරීමට යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි යාවත්කාල පිටපත තුළ උපාධි පාඨමාලා ස්ථානගත කිරීම පිළිබඳ තොරතුරු විශ්වවිද්‍යාල මඟින් එවන ලද පරිදි ලබා ගන්නා ලදී. **( ඇමුණුම 12).**

### ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව පිළිබඳ පැහැදිළි කිරීම

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සමඟ අනුරූපී නොවන විශ්වවිද්‍යාල හා අධ්‍යයන වැඩසටහන් මඟින් භාවිත කරන නිම්තිකාරක හා සුදුසුකම් පිළිබඳව 2016 දෙසැම්බර් මස 05 දින පැවැති තත්ත්ව සහතිකකරණය පිළිබඳව 79වන ස්ථාවර කමිටුවේ දී සාකච්ඡා කරන ලදී. ඒ අනුව පහත නිර්දේශයන් සිදු කරන ලදී.

### ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ

- ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 5,6, හෝ 10 මට්ටමේ නව උපාධි වැඩසටහනක් http://www.ugc.ac.lk/en/universities-and-institutes/degree-courses /undergraduate-courses.html යන වෙබ් අඩවියේ ලැයිස්තුගත කර නොමැති පුළුල් අධ්‍යයන ක්ෂේත්‍රයක නිම්තිකාරකයක් මඟින් නම් කිරීමට සැලසුම් කරන්නේ නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තතත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

- ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 9 මට්ටමේ නිම්තිකාරකය විශේෂිත අධ්‍යයන ක්ෂේත්‍රයක් සඳහා පමණක් සීමා වී ඇති නිසා සහ එම විශේෂිත මට්ටම සුදුසුකම් නාමයේ

නිමිතිකාරකයක් සඳහා අවකාශ නොසලසන බැවින් අදාළ නිමිතිකාරකය සාධාරණීකරණය කළ හැකි නම් උපාධි වැඩසටහන පිරිනමන පීඨය නොසලකා සුදුසු ඕනෑම නිමිතිකාරකයක් යොදා ගත හැකිය.

විෂය ඉම් ලකුණු (SBM)

ඉම් ලකුණු ප්‍රකාශයේ නිර්ණායක සංවර්ධනය සඳහා මණ්ඩල තේරීමේ නිර්ණායක සකස් කිරීම තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය විසින් සිදු කරන ලද අතර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය විසින් විශ්වවිද්‍යාල වෙතින් රැස් කර ගන්නා ලද තොරතුරු සමඟ ඉදිරි දශකය සඳහා පවතින විෂය ඉම් සලකුණු 45ක් සංශෝධනය කළ යුතු බවත් විශ්වවිද්‍යාලවල ඉල්ලීම පරිදි නව විෂය ඉම් ලකුණු 76ක් සංවර්ධනය කළ යුතු බවත් හඳුනාගන්නා ලදී. (ඇමුණුම 15, ඇමුණුම 16). ඉම් සලකුණු 100ක් පමණ සංවර්ධනය කිරීම දුෂ්කර හා කළමනාකරණය කළ නොහැක්කකි. එබැවින්, AHEAD ව්‍යාපෘතියේ සහ ස්ථාවර කමිටුවේ සාමාජිකයන්ගේ මතය අනුව ඉම් ලකුණු සංඛ්‍යාව පාලනය කර ගත හැකි සංඛ්‍යාවක් දක්වා අවම කර ගැනීමට තීරණය විය. එම අවශ්‍යතාව අනුව ,ඉම් ලකුණු වශයෙන් පුළුල් විෂය ක්ෂේත්‍ර අන්තර්ගත වන එක්සත් රාජධානියේ තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන ඉම් ලකුණු මාර්ගෝපදේශ අධ්‍යයනය කොට තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන මණ්ඩලය මඟින් රාමුවක් ගොඩ නගන ලදී.

**5.10 2011** සිට 2015 දක්වා පිට වූ උපාධිධාරීන් සංඛ්‍යාව (විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපනය කළ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන)

2015 වර්ෂයේ දී විශ්වවිද්‍යාලවලින් බිහි වූ උපාධිධාරීන් සංඛ්‍යාව 33,072කි. පිටවූ සමස්ත උපාධිධාරීන් සංඛ්‍යාවෙන් බහුතරය කලා විෂය ධාරාවෙන් වූ අතර එය 50%ක් පමණ විය. 2011 සහ 2015 වර්ෂවලට අදාළ මුළු උපාධිධාරීන් සංඛ්‍යාවේ අනුබණ්ඩනය පහත පරිදි වේ;

**2011**-2015 දක්වා පීඨවලින් /අධ්‍යයන විෂය ධාරාවලින් බිහි වූ උපාධිධාරීන් සංඛ්‍යාව

| විෂය ධාරාව | 2011 | 2012(4) | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| කලා | 10691 | 4623 | 9192 | 14651 | 16387 |
| කළමණාකරන හා වාණිජ | 4550 | 1422 | 4186 | 5982 | 5152 |
| නීති | 348 | 445 | 454 | 496 | 337 |
| වෛද්‍ය | 1061 | 1031 | 547(1) | 1209 | 1145 |
| දන්ත වෛද්‍ය | 65 | 20 | 73 | 68 | 79 |
| පශු වෛද්‍ය | 58 | 54 | 59 | 57 | 69 |
| කෘෂිකර්ම | 616 | 724 | 828 | 867 | 710(2) |
| ඉංජිනේරු | 1346 | 758 | 1507 | 1438 | 1344 |
| ගෘහනිර්මාණ ශිල්පය හා ප්‍රමාන සමීක්ෂණ | 211 | 228 | 201 | 214 | 77(3) |
| පරිගණක විද්‍යාව | 581 | 587 | 682 | 947 | 1043 |
| ඖෂධවේදය | 302 | 60 | 361 | 399 | 264 |
| විද්‍යා | 2621 | 1646 | 2736 | 2740 | 2711 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයුර්වේද වෛද්‍ය | **192** | **113** | **168** | **175** | **227** |
| එකතුව | **22642** | **11711** | **20994** | **29243** | **29545** |
| | | | | | |
| සටහන : | | | | | |

(1) පරීක්ෂණයට නැවත පෙනී සිටීමට අදාළ දත්ත පමණි, මෙම වසරේ ප්‍රධාන පරීක්ෂණයට අදාළ දත්ත නොමැත.

(2) නැගෙනහිර සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලවලට අදාළ නිමැවුම නැත

(3) ගෘහනිර්මාණ ශිල්පය , ප්‍රමාණ සමීක්ෂණය සහ පහසුකම් කළමනාකරණයට අදාළ නිමවුම නොමැත.

(4) 2012 වර්ෂයේ විවිධ පියවලින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩවර්ජන හේතුවෙන් අවසාන පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වීම මත 2012 වර්ෂයේ දී උපාධිධාරීන් සංඛ්‍යාව අඩුවිය.

**6.** මූල්‍ය පරිපාලනය

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ළඟා කර ගැනීමේ අරමුණු ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016 වර්ෂයේ දී මූල්‍යායනය කළ යුතු ක්‍රමෝපායික ඉලක්ක අටක් පහත පරිදි හඳුනාගෙන ඇත.

- උසස් අධ්‍යාපනයට සහභාගී වීම හා සාධාරණ ප්‍රවිශ්ටය පුළුල් කිරීම
- අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මය හා අදාළත්වය වැඩිදියුණු කිරීම
- පර්යේෂණ, නවෝත්පාදනය. හා ව්‍යවසායකත්වය සවිමත් කිරීම
- සමාජ ආර්ථික සංවර්ධනයේ සහ සාමය හා සංහිඳියාවේ ක්‍රමෝපායික හවුල්කරුවන් ලෙස උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉහළ නංවන ලද කාර්යභාරය
- ඉහළ නංවන ලද ජාත්‍යන්තර සහයෝගීත්වය හා තරඟකාරීත්වය
- වැඩි දියුණු කරන ලද භෞතික හා සෞන්දර්යාත්මක පරිසරය හා පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය
- වැඩි දියුණු කරන ලද මූල්‍ය කළමනාකරණය හා තිරසාරත්වය
- ඉහළ නැංවූ යහ පාලනය

2015 දෙසැම්බර් මස 19 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අයවැය අනුමත කර ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමත කරන ලද අයවැය 2016 වර්ෂය වෙනුවෙන් නිදහස් කර ඇත. වර්ෂය තුළ දී, විශේෂයෙන්ම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම මූල්‍යායනය කිරීම සඳහා අනුපිළිවෙළින් රු. මිලියන 3,855ක හා රු.මිලියන 48ක අමතර ප්‍රතිපාදනයක් ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රදාන වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලදී.

අනුමත අයවැයේ සාරාංශය (රු.මිලියන)

| කාණ්ඩය / විෂය මාතෘකාව | අනුමත අයවැය 2015(අමතර වෙන් කිරීම් සමඟ) | අනුමත අයවැය 2016 (අමතර වෙන් කිරීම් සමඟ) |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 25,898.00 | 29,029.00 |
| ප්‍රාග්ධන / සංවර්ධන ප්‍රදාන - | 8,860.00 | 19,797.00 |
| ප්‍රදාන එකතුව | **34,758.00** | **48,826.00** |
| අභ්‍යන්තර ආදායම/ වෙනත් ප්‍රදාන | 4,335.09 | 5,109.25 |
| **මුළු වියදම** | **39,093.09** | **53,935.25** |

**6.1)** පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මූල්‍යයන ප්‍රතිපත්තිය පදනම් කර ගෙන විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන, පුනරාවර්තන එක්වර ප්‍රදානය (RBG) හා ප්‍රාග්ධන එක්වර ප්‍රදානය (CBG) ලෙස වෙන් කෙරේ.

**6.2)** මූල්‍යයන ප්‍රතිපත්තිය - පුනරාවර්තන ප්‍රදාන වෙන් කිරීම (RG)

6.2.1) විශ්වවිද්‍යාල හා ප්‍රථම උපාධි උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන ප්‍රදාන වෙන් කිරීම පහත මූල්‍යයන සූත්‍රය පදනම් කොට ගෙන ඇත;

*පුනරාවර්තන ප්‍රදාන = විකරණය කළ එක් ශිෂ්‍යයකු සඳහා වියදම (MCPS) ශිෂ්‍ය ලියාපදිංචිය (SE)*

6.2.2) විකරණය කළ එක් ශිෂ්‍යයකු සඳහා වියදම (MCPS) පහත ප්‍රතිපත්තිමය සාධක මත ගණනය කරන ලදී;

- සත්‍ය සේවක සංඛ්‍යාවේ වාර්ෂික වැටුප් වර්ධක
- වෙනත් පුනරාවර්තන වියදම් මත උද්ධමනය
- වෙනත් පුනරාවර්තන වියදම් මත ධාරිතා ප්‍රසාරණය
- ප්‍රතිපත්තිමය සාධක – (මූල්‍යන අනුපාතිකය )

6.2.3) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ පශ්චාත් උපාධි ආයතන සඳහා පුනරාවර්තන ප්‍රදානවෙන් කිරීම පහත මූල්‍යන ප්‍රතිපත්තිය මත පදනම් කර ගෙන ඇත.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය –පුනරාවර්තන ප්‍රදානවලින් 60%ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මූල්‍යයනය කර ඇත.
- පශ්චාත් උපාධි ආයතන (PGIs) –හිඟය පියවා ගැනීමට පමණක් රජයේ ප්‍රදාන ලබා දෙනු ලැබේ. ( පශ්චාත් උපාධි ආයතනවල වියදම - උපයා ගත් අරමුදල්)

## 6.3) මූල්‍යයන ප්‍රතිපත්තිය - ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම (CG)

### 6.3.1 ප්‍රාග්ධන එකවර ප්‍රදානය (CBG)

අරමුදල් උපයෝගීතාවයේ ප්‍රගතිය සහ ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ වසර තුනක මූල්‍ය සැලසුම සලකා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත ප්‍රාග්ධන එකවර ප්‍රදානය වෙන් කරන ලදී.

### 6.3.2 පර්යේෂණ සඳහා අරමුදල් සැපයීම – රු.මිලියන 600

පහත කාණ්ඩ යටතේ පර්යේෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත පර්යේෂණ ප්‍රදානයක් ලෙස අරමුදල් ලබා දෙන ලදී.

අ) ජාතික වශයෙන් අදාළත්වයක් ඇති පර්යේෂණ
- නිදන්ගත වකුගඩු රෝග (CKD)
- ඩෙංගු

ආ) විද්‍යාත්මක, ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත නවෝත්පාදන පර්යේෂණ

ඇ) ජන විකාශ, සමාජ-සංස්කෘතික හා ආර්ථික ගැටළු සම්බන්ධ පර්යේෂණ

ඈ) කාර්මික හා තාක්ෂණික සංවර්ධනය සහ නවෝත්පාදන තාක්ෂණික විසඳුම් කරා මෙහෙයවන විශ්වවිද්‍යාල කාර්මාන්ත සබඳතා හා අදාළ පර්යේෂණ

ඉ) ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, පරිසංවාද, පර්යේෂණ හා ප්‍රකාශන සංවිධානය කිරීම

### 6.3.3. ඉංජිනේරු පීඨ සවිබල ගැන්වීම – රු.මිලියන 950

වොෂිංටන් ඒකමතියේ (Accord) අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට - රු.මිලියන 500, පේරාදෙණිය ඉංජිනේරු පීඨයට රු. මිලියන 200, රුහුණ ඉංජිනේරු පීඨයට රු.මිලියන 150, සහ අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට රු.මිලියන 100 ක් ලෙස අරමුදල් වෙන් කරන ලදී.

### 6.3.4 අයවැය යෝජනා

ගරු මුදල් අමාත්‍ය විසින් සිදු කරන ලද අයවැය කථාවට අනුව පහත අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය අරමුදල් වෙන් කර ඇත.

- විශ්වවිද්‍යාලයන්හි තාක්ෂණ පීඨ ස්ථාපනය කිරීම
- යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම
- විශ්වවිද්‍යාලයන්හි පීඨ කාර්ය මණ්ඩල සඳහා නවාතැන් පහසුකම් සැපයීම
- ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත වෘත්තීය ආයතන සමඟ ප්‍රතීතනය දිරිමත් කිරීම
- වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීම

### 6.3.5 විශ්වවිද්‍යාල පද්ධතියේ අරමුදල් වෙන් කිරීම / ප්‍රයෝජ්‍යකරණය

පෙර වර්ෂය හා සාපේක්ෂව වර්ෂය තුළ සමස්ත ප්‍රදානයේ ( අමතර ප්‍රදාන සමඟ) අනුබණ්ධනය සහ වෙන් කරන ලද /භාවිත කරන ලද මුදල් ප්‍රමාණය පහත දක්වා ඇත.

| ප්‍රදානය | 2015 වර්ෂය | | | 2016 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කරන ලද මුළු මුදල රු.මි | නිදහස් කරන ලද මුළු මුදල රු.මි | නිදහස් කරන ලද / ප්‍රයෝජ්‍යකරණය කරන ලද අනුපාතිකය මුළු වෙන් කිරීමේ % ලෙස | වෙන් කරන ලද මුළු මුදල රු.මි | නිදහස් කරන ලද මුළු මුදල රු.මි | නිදහස් කරන ලද / ප්‍රයෝජ්‍යකරණය කරන ලද අනුපාතිකය මුළු වෙන් කිරීමේ % ලෙස |
| පුනරාවර්තන | 25,898.0 | 25,761.0 | 99.5% | 29,029.0 | 27,999.0 | 96.5% |
| ප්‍රාග්ධන | 8,860.0 | 8,735.0 | 98.4% | 19,797.0 | 15,162.4 | 76.6% |
| එකතුව | **34,758.0** | **34,491.0** | **99.25%** | **48,778.0** | **43,161.4** | **88.5%** |


පෙර වර්ෂය හා සසඳන විට, 2016 වර්ෂයේ දී පුනරාවර්තන ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වෙන් කිරීම අනුපිළිවෙළින් 12%කින් හා 123%කින් වැඩි වී ඇත.

ඉහත වගුවෙන් පෙන්වා ඇති පරිදි 2016 වර්ෂයේ දී ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රයෝජ්‍ය කිරීම /නිදහස් කිරීම ප්‍රාග්ධන වෙන් කිරීමෙන් 76.6%ක් වන අතර එය 2015 වර්ෂය හා සැසඳීමේ දී 22% ක අඩු වීමකි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන)
2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා

| | | | | | | රු.මිලියන |
|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2014** | **2015** සංශෝධිත අයවැය | **2016** සංශෝධිත අයවැය |
| **1.** රජයේ ප්‍රතිපාදන | | | | | | |
| පුනරාවර්තන | 13,161 | 14,719 | 18,317 | 20,841 | 25,898 | 29,029 |
| ප්‍රාග්ධන | 7,100 | 5,779 | 8,524 | 10,945 | 8,860 | 19,797 |
| **2.** වියදම | | | | | | |
| පුනරාවර්තන | 12,961 | 14,591 | 16,932 | 20,638 | 25,761 | 27,999 |
| ප්‍රාග්ධන | 4,279 | 4,361 | 5,820 | 10,000 | 8,735 | 15,162 |
| **3.** සිසුන් සඳහා මූල්‍යාධාර | | | | | | |
| මහපොළ | 127 | 101 | 94 | 109 | 576 | 912 |
| ශිෂ්‍යාධාර | 357 | 283 | 386 | 414 | 466 | 832 |

**ප්‍රාග්ධන ප්‍රදානයේ සංයුතිය - 2016 (රු.මි)**




## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
## 214 ශීර්ෂය
## පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම -වර්ෂ 2014 සිට 2016 දක්වා

රු.මිලියන

| විශ්වවිද්‍යාල / ආයතන | පුනරාවර්තන | | | ප්‍රාග්ධන | | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 අයවැය සංශෝධිත | 2016 අයවැය සංශෝධිත | 2014 | 2015 අයවැය සංශෝධිත | 2016 අයවැය සංශෝධිත |
| පේරාදෙණිය | 3,255 | 4,081 | 4,370 | 1,099 | 900 | 1,563 |
| කොළඹ | 1,918 | 2,238 | 2,472 | 680 | 615 | 637 |
| ශ්‍රී ජයවර්ධනපුර | 1,856 | 2,360 | 2,617 | 1,009 | 875 | 1,621 |
| කැලණිය | 1,815 | 2,264 | 2,430 | 570 | 700 | 1,081 |
| මොරටුව | 1,280 | 1,579 | 1,828 | 714 | 640 | 1,545 |
| රුහුණ | 1,695 | 2,152 | 2,284 | 608 | 535 | 1,176 |
| යාපනය | 1,337 | 1,722 | 2,056 | 1,190 | 721 | 1,367 |
| විවෘත | 965 | 1,040 | 1,000 | 125 | 80 | 230 |
| නැගෙනහිර | 645 | 807 | 994 | 515 | 495 | 628 |
| රජරට | 894 | 959 | 1,255 | 485 | 500 | 817 |
| සබරගමුව | 733 | 891 | 1,024 | 387 | 175 | 555 |
| අග්නිදිග | 580 | 780 | 830 | 500 | 345 | 567 |
| වයඹ | 708 | 827 | 949 | 684 | 350 | 786 |
| සෞන්දර්යය කලා | 499 | 706 | 717 | 339 | 260 | 421 |
| ඌව වෙල්ලස්ස | 321 | 360 | 538 | 230 | 260 | 600 |
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි | 16 | 19 | 20 | 9 | 10 | 10 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි | 50 | 64 | 80 | 420 | 350 | 285 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි | 50 | 57 | 66 | 7 | 10 | 10 |
| කළමනාකරණ පශ්චාත් උපාධි | - | - | - | - | - | - |
| විද්‍යා පශ්චාත් උපාධි | 10 | 12 | 12 | 12 | 10 | 38 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි | 24 | 12 | 25 | 3 | 5 | 10 |
| ඉංග්‍රීසි පශ්චාත් උපාධි | 10 | 14 | 13 | 39 | 50 | 38 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධ ආ. | - | - | 8 | | | 8 |
| දේශීය වෛද්‍ය විද්‍යා | 214 | 274 | 299 | 60 | 50 | 157 |
| මානව සම්පත් අභිවර්ධන | 25 | 32 | 40 | 12 | 10 | 10 |
| කො.වි.වි.පරිගණක අධ්‍ය. | 94 | 123 | 160 | 15 | 45 | 245 |
| ගම්පහ වික්‍රමආරච්චි | 166 | 191 | 227 | 120 | 120 | 164 |
| මොරටුව තාක්ෂණ ආයතනය | 110 | 127 | 155 | 7 | 12 | 10 |
| ජාතික පුස්තකාල හා විඥාපන | 12 | 15 | 17 | 4 | 5 | 5 |
| ජෛව රසායන, අනුක ජීව | 43 | 55 | 60 | 23 | 20 | 20 |
| ස්වාමි විපුලානන්ද | 74 | 140 | 150 | 45 | 50 | 69 |
| මානව. සමාජ අධ්‍යයන ජාතික | 14 | 18 | 21 | 100 | 98 | 120 |
| ත්‍රිකුණාමල මණ්ඩපය | 121 | 160 | 203 | 400 | 245 | 536 |
| කෘෂි තාක්ෂණ ග්‍රාමීය විද්‍යා | 13 | 25 | 30 | 18 | 65 | 10 |
| වි. ප්‍ර. කො.ස | 465 | 350 | 485 | 518 | 254 | 604 |
| දකුණු ආසියානු වි.වි | 164 | - | - | - | - | - |
| **එකතුව** | **20,014** | **24,454** | **27,435** | **10,945** | **8,860** | **15,945** |
| කාර්යසාධන ප්‍රතිපාදන | 827 | 1,444 | 1,594 | - | - | - |
| අයවැය යෝජනා | - | - | - | - | - | 3,855 |
| මුළු එකතුව | **20,841** | **25,898** | **29,029** | **10,945** | **8,860** | **19,797** |

**07.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව

2016 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 318ක් වූ අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ (විධායක) සේවක සංඛ්‍යා තනතුරු 55ක්, අධ්‍යයන මට්ටමේ (අධ්‍යයන කාර්ය මණ්ඩලය) තනතුරු 07ක්, තෘතික මට්ටමේ (අධ්‍යයන සහාය) තනතුරු 9ක් ද්විතීයක මට්ටමේ තනතුරු 190 ක් ( ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි) සහ ප්‍රාථමික මට්ටමේ (වෙනත් යටත්) 57ක් විය. 2016 දෙසැම්බර් 31 දින වනවිට පළමු කාණ්ඩයේ 39ක්, දෙවන කාණ්ඩයේ 07ක්, තෙවන කාණ්ඩයේ 05ක් හා සිව්වන කාණ්ඩයේ 153ක් හා පස්වන කාණ්ඩයේ 55ක් ලෙස 259දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටින ලදී.

**7.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, සේවා ස්ථිරත්ව ලබා දීම්, ස්ථාන මාරු, විශ්‍රාම ගැන්වීම් හා ඉල්ලා අස්වීම්**

සමාලෝචිත වර්ෂය තුළ, කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ස්ථිර පත්වීම් 55ක් ද කොන්ත්‍රාත්/ තාවකාලික පදනම /පැවරුම් පදනම/ දෛනික ගෙවීම් පදනම මත පත්වීම් 14ක් ද ලබා දෙන ලදී. ස්ථිර පත්වීම් අතුරින් පත්වීම් හතක් විධායක ශ්‍රේණි කාණ්ඩයේ වේ.

වර්ෂය තුළ දී, කොමිෂන් සභාව විසින් ලේකම් කාර්යාලයේ සේවකයන් සඳහා උසස්වීම් 5ක් ද සේවා ස්ථිරත්වයන් 3ක් ද ලබා දුන් අතර ඒ තුළ විධායක මෙන්ම ලිපිකරු හා සමාන්තර සේවා ශ්‍රේණි ද වෙයි.

2016 වර්ෂයේ දී, කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවය කරන ලද සේවකයන් සිව්දෙනෙකු උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ එක් පරිගණක යෙදවුම් සහකාරවරයෙකු තාවකාලික පදනම මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය වෙත නිදහස් කරන ලදී.

2016 වර්ෂය තුළ, සේවකයන් 5දෙනෙකු සේවයෙන් විශ්‍රාම ගත් අතර සේවකයන් තිදෙනෙකු අදාළ තනතුරින් ඉල්ලා අස්විය; මෙයින් එක් පුද්ගලයෙකු විධායක ශ්‍රේණියේ වන අතර අනෙක් දෙදෙනා ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල තනතුරු දරන ලද පුද්ගලයන් වේ.

විධායක ශ්‍රේණියේ එක් නිලධාරියෙකු සබරගමුව විශ්වවිද්‍යාලයේ සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු කරන ලදී.

**7.2 කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම**

සෑම වර්ෂයකදීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ රාජකාරි හා අදාළ වැඩමුළු/ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම මඟින් ඔවුන්ගේ කුසලතා සහ රාජකාරි දැනුම වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව සලසයි. මෙම වැඩසටහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන අයාතනය, ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය, කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය, ව්‍යාපාර කළමනාකාරීත්ව ජාතික ආයතනය, නිපුණතා සංවර්ධන අරමුදල, උසස් අධ්‍යාපන සඳහා ජාතික මධ්‍යස්ථානය, මානව සම්පත් අභිවර්ධන ආයතනය, විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය, කොල්ට් ට්‍රේඩින් ලංකා පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය, කොළඹ විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වැනි පිළිගත් ආයතන විසින් මෙහෙයවනු ලබන අතර කාර්ය මණ්ඩලය සඳහා අනුග්‍රහය දැක්වීම සඳහා වෙනම කාර්ය මණ්ඩල පුහුණු අරමුදලක් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලැබේ.

(1) සමාලෝචිත වර්ෂය තුළ දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 25දෙනෙකු හා විධායක නොවන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 13දෙනෙකු ඔවුන්ගේ කාර්යාලීය කටයුතු හා සෘජුව අදාළ වන කෙටි කාලීන පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වන ලදී.

(2) විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුට හා විධායක නොවන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුට ඔවුන්ගේ රාජකාරී දැනුම වර්ධනය කර ගැනීම සඳහා දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.

(3) රියදුරු හා ප්‍රාථමික ශ්‍රේණි යටතට ගැනෙන සේවකයන් කණ්ඩායමකට රියදුරු හා ප්‍රාථමික ශ්‍රේණි සේවකයන් සඳහා කුසලතා සංවර්ධන කෙටි කාලීන පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

(4) විධායක නිලධාරීන් 5දෙනෙකුට කෙටි කාලීන විදේශීය පුහුණු වැඩසටහනකට සහභාගී වීම සඳහා රාජකාරී නිවාඩු ලබා දුන් අතර එක් නිලධාරියෙකු සඳහා දේශීයව පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා දින පහක පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබා දෙන ලදී. ඒ හැර ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවකයන් 4දෙනෙකු සඳහා ඔවුන්ගේ අවශ්‍යතා අනුව වැටුප් සහිත නිවාඩු ලබා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයසට එළැඹුන / පසු කරන ලද සේවකයන් පස්දෙනෙකුගේ සේවය කොමිෂන් සභාව මඟින් දීර්ඝ කරන ලදී.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678,696, සහ 893හි විධිවිධාන ප්‍රකාරව දීර්ඝ කාලීන සේවය වෙනුවෙන් ලබා දෙනු ලබන ත්‍යාග සඳහා හිමිකම් ලැබූ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 12දෙනෙකු සඳහා ඔවුන් විශ්වවිද්‍යාල පද්ධතියට සිදු කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාව වෙනුවෙන් මුදල් ත්‍යාග පිරි නමන ලදී.

## 7.3 විශ්‍රාම පූර්ව නිවාඩු, වැටුප් සහිත නිවාඩු හා වැටුප් රහිත නිවාඩු

2016 වසරේ දී සේවකයන් සිව්දෙනෙකු සඳහා විශ්‍රාම පූර්ව නිවාඩු ලබා දෙන ලද අතර සේවකයන් 07දෙනෙකුට වැටුප් සහිත නිවාඩු ද දෙදෙනෙකුට විදේශ සංචාර සඳහා වැටුප් රහිත නිවාඩු ද ලබා දෙන ලදී. සේවකයන් දෙදෙනෙකුට කොමිෂන් සභා චක්‍රලේඛ අංක 408හි විධිවිධාන ප්‍රකාරව සප්ත වාර්ෂික නිවාඩු ලබා දෙන ලදී.

## 7.4 සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියලුම ස්ථිර සේවකයන් සඳහා වඩාත් ප්‍රතිලාභදායක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ලබා දීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ දැනට පවතින සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය දීර්ඝ කරන ලදී.

## 7.5 සේවය අගය කිරීම හා සේවයට පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ දී සේවයෙන් ඉවත්වූ සේවකයන් ඉටු කරන ලද සේවය අගය කිරීමත් සලකනු ලබන කාලයේ දි සේවයට එකතු වූ සේවකයන් පිළිගැනීමත් කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලදී.

## 8. මානව සම්පත් ප්‍රගතිය

### 8.1 නව අනුමත සේවක සංඛ්‍යා තනතුරු සහ සමස්ත සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද නිර්දේශ සලකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක සංඛ්‍යා තනතුරු 717ක් අනුමත කරන ලදී. එම තොරතුරු පහත වගුවේ සඳහන් කොට ඇත.

| සේවක කාණ්ඩය | නව තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යයන | 380 |
| පරිපාලනමය සහ වෙනත් කාර්ය මණ්ඩල | 18 |
| අධ්‍යයන සහාය | 06 |
| කළමනාකරණ සහකාර /තාක්ෂණික නොවන | 55 |
| කළමනාකරණ සහකාර /තාක්ෂණික | 96 |
| පුහුණු/අර්ධ පුහුණු /නුපුහුණු | 129 |
| තාවකාලික /කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | 33 |
| **එකතුව** | **717** |

විශ්වවිද්‍යාල සේවක සංඛ්‍යාවේ අනුබණ්ඩනය පසුගිය වසර 4 සිට 5 දක්වා කාලය තුළ පහත පරිදි වර්ධනය වී ඇත;

| | *2011* | *2012* | *2013* | *2014* | *2015* | *2016* |
|---|---|---|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 8,021 | 8,290 | 8,510 | 8,603 | 8,696 | 9,076 |
| පරිපාලන සහ ඒ හා සම කාර්ය මණ්ඩලය * | 898 | 1,023 | 1,075 | 1,096 | 1,099 | 1,117 |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 882 | 906 | 939 | 969 | 976 | 982 |
| අනධ්‍යයන, පරිපාලනමය නොවන කාර්ය මණ්ඩලය | 10,491 | 10,824 | 11,132 | 11,213 | 11,266 | 11,579 |
| | 20,292 | 21,043 | 21,656 | 21,881 | 22,037 | 22,754 |

** වෛද්‍ය නිලධාරීන් ද ඇතුළත්ව*

### 8.2 පරිපාලනමය ශ්‍රේණි සඳහා පත් කිරීම / උසස් කිරීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71(2) වගන්තියේ හා 8(1) වගන්තියේ (i) හා (ii)උප වගන්ති ප්‍රකාරව පරිපාලනමය ශ්‍රේණි සඳහා පත් කිරීම / උසස් කිරීම සිදු කළ යුත්තේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. ඒ අනුව 2016 වර්ෂයේ දී පහත පත් කිරීම් සහ උසස් කිරීම් සිදු කරන ලදී;

**පත් කිරීම**

| තනතුර | විශ්වවිද්‍යාලය | පත්වීම් ගණන |
| --- | --- | --- |
| වෛද්‍ය නිලධාරි | කොළඹ විශ්වවිද්‍යාලය<br>සබරගමුව විශ්වවිද්‍යාලය | 01<br>01 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරි | මොරටුව විශ්වවිද්‍යාලය | 01 |
| සහකාර අධ්‍යක්ෂ /ප්‍රාදේශීය අධ්‍යාපන සේවා | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 06 |
| අධ්‍යක්ෂ ශාරීරික අධ්‍යාපනය | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 01 |
| ගොවිපොළ කළමනාකරු -II ශ්‍රේණිය | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 01 |
| වැඩ ඉංජිනේරු (සිවිල්) III ශ්‍රේණිය | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය<br>කොළඹ විශ්වවිද්‍යාලය | 01<br>01<br>01 |
| වැඩ ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණිය | මොරටුව විශ්වවිද්‍යාලය<br>යාපනය විශ්වවිද්‍යාලය | 01<br>01 |
| වැඩපොළ ඉංජිනේරු III ශ්‍රේණිය | යාපනය විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 01<br>01 |
| ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු III ශ්‍රේණිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 01 |
| තොරතුරු පද්ධති කළමනාකරු | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 01 |
| ප්‍රධාන අරක්ෂක නිලධාරී | කැලණිය විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 01<br>01 |
| ප්‍රධාන විනයාරක්ෂක | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 01 |
| පාලක (උද්‍යාන) III ශ්‍රේණිය | රුහුණ විශ්වවිද්‍යාලය | 01 |
| එකතුව | | **24** |

උසස් කිරීම්

| තනතුර | විශ්වවිද්‍යාලය | උසස් කිරීම් සංඛ්‍යාව |
| --- | --- | --- |
| අධ්‍යක්ෂ ශාරීරික අධ්‍යාපන (ඉහළ ශ්‍රේණිය) | යාපනය විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 01<br>01<br>01 |
| අධ්‍යක්ෂ ශාරීරික අධ්‍යාපනය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 01 |
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික තාක්ෂණ නිලධාරි | කැලණිය විශ්වවිද්‍යාලය<br>කොළඹ විශ්වවිද්‍යාලය<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>යාපනය විශ්වවිද්‍යාලය | 02<br>03<br>03<br>01 |
| ප්‍රධාන තාක්ෂණ නිලධාරි | පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>මොරටුව විශ්වවිද්‍යාලය<br>කැලණිය විශ්වවිද්‍යාලය | 01<br>01<br>01 |
| භාරකරු (කෞතුකාගාර) II ශ්‍රේණිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 01 |
| වැඩ ඉංජිනේරු (සිවිල්) IIශ්‍රේණිය | කොළඹ විශ්වවිද්‍යාලය | 01 |
| වැඩ ඉංජිනේරු (සිවිල්) ශ්‍රේණිය | සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | 01 |
| එකතුව | | **19** |

**8.2 ලිපිකරු/ ගබඩා භාරකරු / සරප්/ පරිගණක යෙදවුම් සහකාර තනතුරුවල III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම**

2014.12.31 දිනට සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන් 133 දෙනෙකු සඳහා ලිපිකරු/ ගබඩා භාරකරු / සරප්/ පරිගණක යෙදවුම් සහකාර තනතුරුවල II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය 2016 ජූලි මස 02වන දින වි.ප්‍ර.කො.ස මඟින් පවත්වන ලදී. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ අපේක්ෂකයන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම පිණිස අදාළ ප්‍රතිඵල 2016.12.19 දින උසස් අධ්‍යාපන ආයතන වෙත නිකුත් කරන ලදී. අපේක්ෂකයන්ගේ සාරාංශය පහත පරිදි වේ:

| සාරාංශය | |
|---|---|
| සමත් වූ අපේක්ෂකයන් සංඛ්‍යාව | 36 |
| අසමත් වූ අපේක්ෂකයන් සංඛ්‍යාව | 61 |
| නොපැමිණි අපේක්ෂකයන් සංඛ්‍යාව | 36 |
| මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව | 133 |

**8.3 ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයන් III ශ්‍රේණියේ ලිපිකරු තනතුර සඳහා පත් කිරීම**

1979.11.27 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 50, 1998.09.15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 742 සහ අනුමත බඳවා ගැනීමේ පරිපාටි ප්‍රකාරව III ශ්‍රේණියේ ලිපිකරු තනතුර සඳහා සලකා බැලීමට සුදුසුකම් සපුරන සුළු සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සිදු කළ යුතුය. ඒ අනුව, 2014.12.31 දිනට සුදුසුකම් සපුරන අපේක්ෂකයන් 130 සඳහා ලිඛිත පරීක්ෂණය 2016 නොවැම්බර් මස 05 දින වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී පවත්වන ලදී.

**8.4 විශ්වවිද්‍යාල අතර ස්ථාන මාරු**

විශ්වවිද්‍යාල පනතේ 78 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂය තුළ දී වි.ප්‍ර.කො.ස මඟින් ක්‍රියාත්මක කරන ලද ස්ථාන මාරු සංඛ්‍යාව පහත පරිදි වේ;

- පරිපාලන කාර්ය මණ්ඩලය - **15**
- අනධ්‍යයන පරිපාලනමය නොවන කාර්ය මණ්ඩලය - **60**

**8.5 කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්**

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන (SDC) පහළොවම නිතරන්තරයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩසටහන් සහ අධ්‍යයන, පරිපාලන, මූල්‍ය, විධායක, තාක්ෂණික, අනධ්‍යයන, ලිපිකරු හා සුළු සේවක ඇතුළත් සියලුම කාණ්ඩ සඳහා වෙනත් කෙටි කාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු, දුරස්ථ පුහුණු යනාදිය පවත්වනු ලබයි.

**8.6 විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් වෙනුවෙන් ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව පිරිනැමීම සහ පර්යේෂණ සඳහා ප්‍රදානයන් සහ වෙනත් මූල්‍යාධාර සැපයීම.**

අධ්‍යයන කාර්ය මණ්ඩලයට විශේෂයෙන් ම තරුණ විද්‍යාර්ථීන්ට මෙරට මෙන් ම පිටරට උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ පද්ධතිය තවදුරටත් පෝෂණය කිරීම සහ ශක්තිමත් කිරීම යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තියට අනුකූලව යමින් ඒ සඳහා තව තවත් අරමුදල් වෙන් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉකුත් වසර කිහිපය තුළ දැඩි උත්සාහයක් දැරුවේය. ඉහත කී

අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වසර තුළ දී ද පහත ප්‍රතිපාදන ලබා දෙන ලදී.

i. පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා මූල්‍ය අනුග්‍රහය

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථිර සේවයේ නිරත ආචාර්යවරුන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව මූල්‍යාධාර සපයයි. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක කවර හෝ විෂය ක්ෂේත්‍රයක ආධුනික කථිකාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්වයරු මෙම යෝජනා ක්‍රමය යටතේ මූල්‍යාධාර ලැබීමට සුදුසුකම් ලබති.

ප්‍රදානයේ මුළු වටිනාකම අධ්‍යයනයේ ස්වාභාවය, හදාරනු ලබන උපාධිය, සහ එය පවත්වනු ලබන රට අනුව වෙනස් වේ. කෙසේ වුවද දර්ශනපති ( හෝ පශ්චාත් උපාධි "Master's") සඳහා මෙම මුදල රු. 2,500,000/-ට නොවැඩි වන අතර ආචාර්ය උපාධියක් සඳහා මෙම මුදල රු. 3,500,000/- නොඉක්මවනු ඇත. ප්‍රදාන ලබා දෙනුයේ යෝජනාවේ ගුණාත්මය, යෝජිත අධ්‍යයනයේ ශාස්ත්‍රීය අගය හා එහි අදාළත්වය මත පදනම් වූ තරඟකාරී පදනමක් මතය. 22015 වර්ෂයේ දී අනුමත කරන ලද රු.මිලියන 69.8ට සාපේක්ෂව 2016 වර්ෂයේ දී සමස්ත පිරිවැය රු.මිලියන 151ක් වූ ආචාර්ය / දර්ශනපති උපාධි හැදෑරීම සඳහා වූ යෝජනා 51ක් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

2011 සිට 2016 දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලබා ලද පශ්චාත් උපාධි ප්‍රදාන සංඛ්‍යාව

| වර්ෂය | ලබා දුන් ප්‍රදාන ගණන | අනුමත ප්‍රදානවල වටිනාකම රු.මිලියන |
|---|---|---|
| 2011 | 18 | 9.20 |
| 2012 | 5 | 1.86 |
| 2013 | 38 | 59.38 |
| 2014 | 42 | 55.29 |
| 2015 | 43 | 69.89 |
| 2016 | 53 | 151.0 |

ii. ශ්‍රී ලංකා -ඕස්ට්‍රේලියා ඒකාබද්ධ/භින්න ආචාර්ය උපාධි වැඩසටහන

විශ්වවිද්‍යාලවල කණිෂ්ඨ විද්‍යාර්ථීන්ගේ සුභසිද්ධිය උදෙසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඕස්ට්‍රේලියාවේ පිහිටි ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය(QUT) සමඟ එක්ව ඒකාබද්ධ/භින්න ආචාර්ය උපාධි පාඨමාලාවක් දියත් කර තිබේ. ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනයේ ප්‍රමුඛයකු ලෙස සැලකෙන ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයට විශේෂයෙන්ම විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණය සහ සෞඛ්‍ය විද්‍යා යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ශක්තියක් ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය අතර අත්සන් කෙරුණු අවබෝධතා ගිවිසුමට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින්, තෝරා ගනු ලැබූ අපේක්ෂකයකුට ඕස්ට්‍රේලියාවේ වසරක් ගත කිරීමට ප්‍රමාණවත් වන මුදලක් වන රු. මිලියන 3.5ක (වසර 3ක් සඳහා) උපරිමයකට යටත්ව ලබා දෙනු ඇති අතර ඕස්ට්‍රේලියාව විසින් ආචාර්ය උපාධි අපේක්ෂකයෙකු හට එම පාඨමාලාවට හිමි කාල සීමාව (එනම් වසර තුනහමාරක්) සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 100,000 ක ඇස්තමේන්තුගත වටිනාකමින් යුත් ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන අතර පාඨමාලා ගාස්තුවලින් නිදහස් කිරීම ද සිදු කරනු ඇත.

මේ යටතේ කථිකාචාර්යවරු දහතුන් දෙනෙක් ඉල්ලුම් කර තිබූ අතර 2016 වසරේ මැයි මස 19 වැනි දින සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. ඒ අනුව ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය සඳහා ස්ථාන හිමි කර ගත් අපේක්ෂකයන් එකොළොස් දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් මූල්‍ය අනුග්‍රහය ලැබීම සඳහා තෝරා ගන්නා ලද අතර ප්‍රදානවල වටිනාකම රු.මිලියන 33.9කි. තවත් අයදුම්පත් දෙකක් හා අදාළව ක්වින්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රතිචාර අපේක්ෂාවෙන් පසුවනු ලැබේ.

**iii. එක්සත් රාජධානියෙහි පොදුරාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය අධිශිෂ්‍යත්වය - 2017**

රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය අධිශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අගෝස්තු මාසයේ දී දැන්වීම් පළ කරනු ලැබූ අතර 2016 නොවැම්බර් මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අපේක්ෂකයන් තෝරා ගන්නා ලදී.

**iv. ඕස්ට්‍රේලියාවේ මෙල්බ(ර්)න් විශ්වවිද්‍යාලයේ මෙල්බ(ර්)න් ඉංජිනේරු පාසල සමඟ උසස් ආචාර්ය උපාධි පාඨමාලාව සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන**

ඉංජිනේරු, තොරතුරු තාක්ෂණය, ගණිතය සහ පරිගණක විද්‍යාව යන අංශවලින් විශිෂ්ට දක්ෂතා දක්වන ලද උපාධිධාරීන්ට පුහුණුව ලබා දීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ මෙල්බ(ර්)න් විශ්වවිද්‍යාලය අතර උසස් ආචාර්ය උපාධි පාඨමාලාවක් හඳුන්වාදී ඇත.මෙම පාඨමාලාව යටතේ මෙල්බ(ර්)න් ඉංජිනේරු පාසල විසින් 2015 වසරේ සිට බලපැවැත්වෙන පරිදි මොරටුව, පේරාදෙණිය සහ කොළඹ යන විශ්වවිද්‍යාලවලින් වර්ෂයක දී පිටවන විශිෂ්ටතම උපාධිධාරීහු 5 දෙනෙක් බඳවා ගැනීමට ක්‍රියා කරනු ලැබේ. අවසන් වසර වසර තුළ දී තම අධ්‍යයන පාඨමාලාවලට අදාළ 3.75/4 ක දළ ලකුණු සාමාන්‍ය ( GPA) අගයක් හෝ ඉන් ඉහළ අගයක් වාර්තා කළ ශිෂ්‍යයෝ මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

මෙම වැඩසටහන යටතේ මෙල්බ(ර්)න් ඉංජිනේරු විද්‍යාලය පාඨමාලා ගාස්තු 100%කින් (වර්තමාන ගාස්තුව වසරකට ඕස්ට්‍රේලියානු ඩොලර් 36,896) නිදහස් කර සහ ජීවන වියදම් දීමනාව 80%ක් (වර්තමාන ගාස්තුව බදු රහිතව වසරකට එක් ශිෂ්‍යයෙකු සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 25,849ක් ) වශයෙන් වසර තුනහමාරක කාලයක් දක්වා අරමුදල් සපයනු ඇති අතර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ජීවන වියදම් දීමනාවෙන් 20%ක් වසර තුනහමාරක කාලසීමාවක් සඳහා ප්‍රදානය කරනු ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ශිෂ්‍යත්ව වැඩසටහනට අදාළව අයදුම්පත් විමසීම 2015 නොවැම්බර් මස අවසානයේ දී සිදු කරන ලදී. තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දෙදෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායකත්ව මුදල (ජීවන වියදම් දීමනාවෙන් 20%) අනුමත කරන ලද අතර අවබෝධතා ගිවිසුම සහ 2016 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තීරණ පරිදි ප්‍රතිපාදන ලබා දෙන ලදී.

2016 වර්ෂයේ පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන

| විශ්වවිද්‍යාලය | පශ්චාත් උපාධි ප්‍රධාන | | ක්වීන්ස්ලන්ත තා.වි.වි | | මෙල්බ(ර්)න් | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රදානලාභීන් ගණන | මුළු වටිනාකම (රු) | ප්‍රදානලාභීන් ගණන | මුළු වටිනාකම (රු) | ප්‍රදානලාභීන් ගණන | මුළු වටිනාකම (රු) |
| කොළඹ | 7 | 23,967,615 | | | | |
| පේරාදෙණිය | 3 | 7,413,000 | 1 | 3,381,000 | | |
| ශ්‍රී ජයවර්ධනපුර | 6 | 18,635,000 | 2 | 6,206,150 | | |
| කැලණිය | 6 | 16,675,000 | | | | |
| මොරටුව | 2 | 3,295,000 | 1 | 3,342,000 | 2 | 4,741,000 |
| යාපනය | | | 1 | 3,030,000 | | |
| රුහුණ | 3 | 5,501,000 | 2 | 5,815,254 | | |
| විවෘත විශ්වවිද්‍යාලය | 5 | 16,488,700 | 1 | 3,004,000 | | |
| නැගෙනහිර | 2 | 1,700,000 | 1 | 2,721,800 | | |
| අග්නි දිග | | | 1 | 3,310,500 | | |
| රජරට | 3 | 7,880,500 | | | | |
| සබරගමුව | 1 | 2,800,000 | | | | |
| වයඹ | 1 | 4,200,000 | | | | |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 0 | 0 | | | | |
| ඌව වෙල්ලස්ස | 1 | 4,200,000 | 1 | 3,095,780 | | |
| එකතුව | 40 | 112,805,815 | 11 | 33,906,484 | 2 | 4,741,000 |

**v. විදේශීය විශ්වවිද්‍යාල සමග බද්ධ වැඩසටහන් ගොඩනැංවීම**

පහත සඳහන් විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල අතර පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව සහ අධ්‍යාපනික සහයෝගිතාව ඉහළ නැංවීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අදාළ කේන්ද්‍රීය පුද්ගලයන් සමඟ සාකච්ඡා දැනටමත් අවසන් කර ඇත.

- <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජ(ර්)මන් අධ්‍යාපනික හුවමාරු සේවාව අතර අවබෝධතා ගිවිසුම (DAAD)</u>

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ වන විට ජ(ර්)මන් අධ්‍යාපනික හුවමාරු සේවාව සමඟ තිරසර ද්විපාර්ශ්වික අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි සම්බන්ධතාවක් ගොඩනැගීමේ හැකියාවක් පවතින ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම විශ්වවිද්‍යාල 4-5 තේරීමේ ක්‍රියාවලියේ නිරත වී සිටියි.

- <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම</u>

  ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය මගින් කරන ලද ඉල්ලීමක් අනුව ආයතන දෙක අතර පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සහ අධ්‍යාපනික සහයෝගිතාව සංවර්ධනය උදෙසා සකස් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි කෙටුම්පතක් වැඩිදුර සලකා බැලීම සහ අනුමැතිය සඳහා යොමු කර ඇත.

- <u>ශ්‍රී ලංකාව සහ න්‍යෂ්ටික පර්යේෂණ සඳහා වන යුරෝපීය සංවිධානයේ ගිම්හාන සිසු වැඩසටහන (CERN summer student programme) අතර අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) පිළිබඳ පසු විමරම</u>

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් යොමු කරන ලද නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලාංකිය සිසුන් දෙදෙනෙකු න්‍යෂ්ටික පර්යේෂණ සඳහා වන යුරෝපීය සංවිධානය (CERN) මඟින් 2016 වසරේ ගිම්හාන සිසු වැඩසටහන සඳහා තෝරා ගෙන ඇත.

- <u>ඔස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සොයා බැලීම</u>

  පර්යේෂණ (පර්යේෂණ මඟින් ශාස්ත්‍රපති උපාධිය සහ ආචාර්ය උපාධි), ශිෂ්‍යත්ව, අධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය සහ සහයෝගිතා පර්යේෂණ යනාදී ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාව සමඟ සහයෝගිතා සම්බන්ධතාවක් ආරම්භ කිරීමට ඩීකින් විශ්වවිද්‍යාලය දැඩි කැමැත්තකින් පසු වෙයි.

  ඊට අදාළව ඩීකින් විශ්වවිද්‍යාලයේ නියෝජිතයෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ 2016 වසරේ ජූනි මස සාකච්ඡාවක් පැවැත්වූයේ ය.

vi. උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්යමණ්ඩලයට ගුවන් ගමන් ප්‍රදාන ලෙස මූල්‍ය අනුග්‍රහය ලබා දීම

විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පශ්චාද් උපාධි සුදුසුකම් ලබා ගැනිමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ගුවන් ගමන් සඳහා මෑත වසරවල දී ලබා දුන් මූල්‍ය අනුග්‍රහය පහත දැක්වේ;

| | | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| වි.ප්‍ර.කො.ස මඟින් අනුමත කළ / ප්‍රදානය කළ ඉල්ලීම් ගණන | මෙරටට | 34 | 30 | 38 | 30 |
| | පිටකට | 55 | 63 | 60 | 59 |
| මුදල රු. | | **6,754,729.63** | **5,086,561.00** | **6,135,913.00** | **4,303,882.00** |

ස

මාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පශ්චාද් උපාධි සුදුසුකම් ලබා ගැනිමට ගුවන් ගමන් සඳහා ලබා දුන් මූල්‍ය අනුග්‍රහය පහත දැක්වේ:

| උසස් අධ්‍යාපන ආයතනය | **2016 වර්ෂයේදී වි.ප්‍ර.කො.ස. මඟින් අනුමත කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව** | | 2016 වර්ෂයේ දී වි.ප්‍ර.කො. මඟින් විශ්වවිද්‍යාල වෙත ප්‍රතිපූරණය කරන ලද මුදලේ සත්‍ය වටිනාකම (රු) |
|---|---|---|---|
| | මෙරටට | පිටකට | |
| කොළඹ විශ්වවිද්‍යාලය | 3 | 7 | 103,330.00 |

| | | | |
|---|---|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 3 | 13 | 1,109,402.00 |
| යාපනය විශ්වවිද්‍යාලය | - | 2 | - |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 1 | 3 | 252,691.00 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 6 | 6 | 791,225.00 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 3 | 4 | - |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 2 | 4 | 731,375.00 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 4 | 9 | 470,489.00 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 1 | 2 | 290,308.00 |
| සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | 2 | - | - |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 2 | 4 | 231,790.00 |
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | - | 1 | - |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 2 | 2 | 124,282.00 |
| වවුනියාව මණ්ඩපය | 1 | 1 | 198,990.00 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | - | 1 | - |
| එකතුව | **30** | **59** | **4,303,882.00** |

## 9. යටිතල පහසුකම් සංවර්ධනය

නව ඉදිකිරීම් සහ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට , පුනරුත්ථාපන ව්‍යාපෘති , අත්පත් කර ගැනීම්, අලුතින් ස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාල සඳහා යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ශිෂ්‍යයන්ගේ ධාරිතාව වර්ධනය වෙනුවෙන් 2016 වසරේ දී වෙන්කරන ලද සමස්ත මුදල රු. මිලියන 19,797.00 කි. භාණ්ඩාගාරය විසින් නිර්දේශ කරන ලද්දේ රු. මිලියන 16,706.49 ක් පමණි. එසේ වුව ද වසර තුළ මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විවිධ සීමාකිරීම් පැනවීම හේතුවෙන් 2016 වසර අවසන් වන විට විශ්වවිද්‍යාලවලට සහ උසස් අධ්‍යාපන ආයතනවලට ලබා ගැනීමට හැකි වූයේ රු. මිලියන 15,162.39 ක් පමණය.

වසර තුළ දී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන මගින් නව ව්‍යාපෘති යෝජනා 59ක් කොමිෂන් සභව වෙත ලැබුණ අතර සුපරීක්ෂාකාරී අධීක්ෂණයකින් අනතුරුව ඉන් 41* ක් පමණක් වසර අවසන් වන විට කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. 2016 වසරේ නව ව්‍යාපෘතිවලින් 47*ක් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දුන් අතර ඉකුත් වසරවලට අදාළ ව්‍යාපෘති යෝජනා ද ඇතුලුව වසර තුළ දී සමස්ථ ව්‍යාපෘති 49*ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. 2016 වසරේ දී ව්‍යාපෘති 10*# ක් භෞතික වශයෙන් ආරම්භ කළ අතර රු.මිලියන 49,148 ක පිරිවැයක් සහිත සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාවලියේ තුළ විවිධ අදියරයන් හි පසුවන ඉදිකිරීම් ව්‍යාපෘති 182*# ක් වසර අගවන වනවිට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වෙමින් පැවතුණ අතර සමාලෝචිත කාලය තුළ දී රු. මිලියන 3,470.09ක මුළු ඇස්තමේන්තු ගත පිරිවැයක් සහිත ව්‍යාපෘති 27*# ක් නිම කරන ලදුව විශ්වවිද්‍යාල පද්ධතිය වෙත භාර දෙන ලදී. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ;

| | 2011 | | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු. මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු. මි) |
| වි.ප්‍ර.කො. වෙත ලැබුණු ව්‍යාපෘති යෝජනා | 31 | 5,535 | 20 | 3,755 | 59 | 12,466 | 44 | 33,558 | 44 | 24,776 | 59 | 36,784 |
| වි.ප්‍ර.කො. මඟින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා | *24 | 8,069 | *22 | 2,512 | *39 | 8,577 | 30* | 31,049 | *20 | 9,943 | *41 | 23,566 |
| ජාතික ක්‍රමසම්පාදන දෙ. වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා | *24 | 7,762 | *23 | 3,306 | *39 | 8,577 | 29* | 30,691 | *22 | 10,458 | *43 | 25,478 |
| ජාතික ක්‍රමසම්පාදන දෙ. විසින් අනුමතකරන ලද ව්‍යාපෘති යෝජනා | *15 | 4,351 | *07 | 32259 | *35 | 6,361 | 28* | 25,492 | *13 | 6,478 | *47 | 26,106 |
| අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකරන ලද ව්‍යාපෘති යෝජනා | *12 | 1,317 | *11 | 4,854 | *49 | 10,885 | 11* | 14,605 | 7* | 4,856 | *49 | 28,667 |
| වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති | #*17 | 2,496 | #*11 | 1,514 | #*26 | 3,546 | 46* | 24,665 | #*7 | 3,112 | #*10 | 2,390 |
| දැනට සිදුකරගෙන යන ව්‍යාපෘති | #*41 | 14,662 | #*44 | 13,672 | *#48 | 10,201 | 109*# | 31,233 | #*131 | 30,382 | #*182 | 49,148 |
| අවසන් කර ඇති ව්‍යාපෘති ගණන | #*12 | 2,223 | #*13 | 2,778 | *#13 | 1,551 | 36*# | 6,762 | #*3 | 1,793 | #*27 | 3,470 |

** පෙර වර්ෂවල ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළත්ව*
*# ව්‍යාපෘතියේ භෞතික තත්ත්වය පමණක් සලකනු ලැබීය.*

## 10. තොරතුරු තාක්ෂණය සංවර්ධනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ,

- නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය හා ස්ථාපනය කිරීම හා පවත්නා පද්ධති යාවත්කාල කිරීම, අවශ්‍යතා සහ පිරිවිතර සූත්‍රායනය, මෘදුකාංග, සන්නිවේදන පද්ධති, දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ඇතුළත් පරිගණක පද්ධතියේ සමස්ත පරිපාලනය සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා හිතකර අඛණ්ඩ පරිගණක පද්ධතියක් කළමනාකරණය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රියාකාරකම් කළමනාකාරණය.
- තොරතුරු තාක්ෂණ මූලායයන අවශ්‍යතාවන්හි දී විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධීකරණය හා අරමුදල් වෙන් කිරීම සඳහා නිර්දේශ ලබා දීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාලවල සමස්ත පාලනය ඉහළ නැංවීම සඳහා නවතම තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීමේ අරමුණ සහිතව තාක්ෂණය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය.
- අලුතින් බඳවා ගත් සේවකයන් සඳහා සහ කාර්ය මණ්ඩලයේ උසස් වීම් සඳහා පුහුණු කිරීමේ සහ විභාග ලිපි ලේඛන සකස් කිරීම.

- වෙබ් අඩවි පරිපාලනය හා පවත්වා ගෙන යාම ; www.ugc.ac.lk , www.eugc.ac.lk , ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සමානත්වය පිළිබඳ කේන්ද්‍රයේ වෙබ් අඩවිය, තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන වෙබ් අඩවිය, HETC වෙබ් අඩවි .
- විද්‍යුත් පාලන යෙදවුම් (e-Governance application) පරිපාලනය හා පවත්වා ගැනීම - වෙබ් අඩවිය හරහා ඉසෙඩ් අගයේ කඩඉම් ලකුණු නිකුත් කිරීම, කෙටි පණිවුඩ සේවාව සහ රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ( 1919 ඇමතුම් මධ්‍යස්ථානය) , විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වීම.
- මාර්ගගත ගෙවීම් ද්වාරය (Online Payment gateway) ) පරිපාලනය හා පවත්වා ගැනීම – මාර්ගගතව ලියාපදිංචිවීම, අධ්‍යයන කාර්යයන්, බඳවා ගැනීම්, සහ වෙනත් අවශ්‍යතා සඳහා ගෙවීම්.
- වෙබ් දොරටුව (web portal), "eMemo", කමිටු කාමරය වෙන් කිරීමේ පද්ධතිය, පැමිනීමේ වේලාව සටහන් කිරීම සහ සේවක පිරිස් සම්බන්ධ මෘදුකාංග, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය, මාර්ගගත සහාය ලබා දීම, නීති දත්ත ගබඩාව, විද්‍යුත් විමසුම් පද්ධතිය වැනි ව්‍යාපාරික යෙදවුම් ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගැනීම.

ඉහත විෂය පථය හා සමගාමීව, විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා හිතකර තොරතුරු තාක්ෂණ පරිසරයක් කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ අංශය විවිධ කාරකාත්මත චර්යානුගත ක්‍රියාකාරකම් සිදු කරන අතර මෙම වාර්තාව 2016 වර්ෂයේ දී සිදු කරන ලද විශේෂිත ක්‍රියාකාරකම්වල සාරාංශයක් පමණි.

මෘදුකාංග සංවර්ධනය

i. මාර්ගගත ගෙවීම් පද්ධතිය

පාර්ශවකරුවන්ට අන්තර්ජාලය හරහා මුදල් ගෙවීමේදී ආරක්ෂාකාරී බව තහවුරු කර ගත හැකි මාර්ගගත ගෙවීම් පද්ධතියක් මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සිය පාර්ශ්වකරුවන්ට සේවා සැපයීම වැඩි දියුණු කළ හැකිය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මෙම ගෙවීම් ක්‍රමය භාවිත කළ හැකි ක්ෂේත්‍ර කීපයක් නම් විශ්වවිද්‍යාල ප්‍රවේශය, විදේශ විශ්වවිද්‍යාල සඳහා සහතික පිළිගැනීම, තත්ත්ව සහතිකකරණ සහතික නිකුත් කිරීම සහ වැඩමුළු, දේශන සහ සම්මන්ත්‍රණ සඳහා ලියාපදිංචි වීම වැනි අවස්ථාවන්ය.

ii. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා මෘදුකාංගයක්

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල කළමනාකරණය සඳහා පරිගණකගත පද්ධතියක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදු කළ අතර මෙම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද මෙම ප්‍රයත්නය සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් සහය ලබා දෙන ලදී.

iii. "Tapol" පද්ධතිය

වෙබ් මූලික පද්ධතියක් වන අතර එය **"Tapol"** ඒකකයේ ක්‍රියාකාරීත්වය ස්වයංක්‍රීය කර ඇත.

iv. නීති කටයුතු මෘදුකාංගය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන නඩු සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යාමට මෙම මෘදුකාංගය සංවර්ධනය කොට

ඇත. මෙම මාර්ගගත යෙදවුම නීති කටයුතු වාර්තා කිරීමටත් ඒ සඳහා ප්‍රවේශ වීමටත් පහසු මාර්ගයක් සලසයි.

**v. විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනවල නවකවදය හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා මාර්ගගත යාන්ත්‍රණය**

මාර්ගගත පැමිණිලි පද්ධතිය විශ්වවිද්‍යාල පද්ධතියේ ඕනෑම සාමාජිකයෙකුට නවකවදය, හිංසනය, බිය ගැන්වීම හා අයුතු බලපෑම් පිළිබඳව පැමිණිල්ලක් ගොනු කළ හැකි ආකාරයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගොඩ නගා ඇති නව මුල් පිරිමකි. ඉදිරිපත් කරනු ලබන සියලු පැමිණිලි පිළිබඳව විමර්ශනය කරන අතර එවැනි සිද්ධීන්වල වින්දිතයන්ට සහාය ලබා දීම හා හානි පූරණය සිදු කෙරෙනු ඇත.

## 11. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය

### 11.1 හැඳින්වීම

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා වන මූල්‍ය අනුග්‍රහයන් ප්‍රධාන ක්‍රම 03 ක් නමින් වේ. ඒවා නම්,

මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය
විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය
දායක පරිත්‍යාග මඟින් ලබා දෙන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම

මෙම යෝජනා ක්‍රම අතරින් මහපොළ හා දායක පරිත්‍යාග මඟින් ලබා දෙන ශිෂ්‍යත්ව සඳහා වාර්ෂිකව සිසුන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් තෝරා ගන්නා අතර ශිෂ්‍යාධාර සඳහා සිසුන් තේරීම අදාළ විශ්වවිද්‍යාලය /උසස් අධ්‍යාපන අයතනය මඟින් සිදු කරනු ලබයි.

(1) **මහපොළ ශිෂ්‍යත්වය**

මහපොළ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගීත්වයෙන් කාණ්ඩ දෙකක් යටතේ, එනම් මහපොළ උසස් අධ්‍යාපන කුසලතා ශිෂ්‍යත්ව හා මහපොළ උසස් අධ්‍යාපන සාමාන්‍ය ශිෂ්‍යත්ව ලෙස, ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි.

(2) **ශිෂ්‍යාධාර, මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම සඳහා අරමුදල් වෙන් කරනුයේ /ලැබෙනුයේ පවතින ශිෂ්‍යත්ව වාරිකයේ ඇස්තමේන්තුගත ප්‍රතිලාභීන්ගේ ධන අගය මත පදනම්වය.

| ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහයේ ආකාර | මහපොළ ශිෂ්‍යත්ව | | | | ශිෂ්‍යාධාර | | | | පරිත්‍යාග ශිෂ්‍යත්ව / වෙනත් මූල්‍ය අනුග්‍රහයන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2013 | 2014 | 2015 | 2016 | 2013 | 2014 | 2015 | 2016 |
| සිසුන් සංඛ්‍යාව | 39,471 | 45,000 | 45,440 | 47,704 | 28,983 | 29,484 | 32,509 | 24,609 | 55 | 20 | 34 | 84 |
| ගෙවන ලද මුළු මුදල (රු.මි) | 94.95 | 109.21 | 827.0 | 1,168.74 | 385.9 | 414.5 | 937.0 | 984.36 | 2.5 | 0.776 | 2 | 2.82 |

(3) දායක පරිත්‍යාගවලින් ලබා දෙන ශිෂ්‍යත්ව

ඉහත සඳහන් කරන ලද ශිෂ්‍යත්වවලට අමතරව, සලකන ලද වර්ෂයේ දී පහත ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම ද ක්‍රියාත්මක විය.

අ) මිට්ෂුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව

මිට්ෂුබිෂි සමාගම විසින් මූල්‍යාධාර සපයන ශිෂ්‍යත්ව ක්‍රමයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මිට්ෂුබිෂි සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට ඇත.

<table>
<tr><td>ශිෂ්‍යත්වයේ නම</td><td colspan="8">මිට්ෂුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව</td></tr>
<tr><td rowspan="6">ශිෂ්‍යත්ව පිරිනමා ඇති සිසුන් සංඛ්‍යාව</td><td colspan="2">2008/2009</td><td colspan="2">2009/2010</td><td colspan="2">2010/2011</td><td colspan="2">2011/2012</td></tr>
<tr><td colspan="2">20</td><td colspan="2">20</td><td colspan="2">30</td><td colspan="2">30</td></tr>
<tr><td>කොළඹ 10</td><td>ජ'පුර 10</td><td>කොළඹ 11</td><td>ජ'පුර 09</td><td>කොළඹ 15</td><td>ජ'පුර 15</td><td>කොළඹ 13</td><td>ජ'පුර 17</td></tr>
<tr><td colspan="2">2012/2013</td><td colspan="2">2013/2014</td><td colspan="4" rowspan="3"></td></tr>
<tr><td colspan="2">30</td><td colspan="2">30</td></tr>
<tr><td>කොළඹ 13</td><td>ජ'පුර 17</td><td>කොළඹ 15</td><td>ජ'පුර 15</td></tr>
<tr><td>ශිෂ්‍යත්වයක වටිනාකම</td><td colspan="8"><ul><li>මසකට රු.4000/- බැගින් මාස 12ක් සඳහා (එක් වර්ෂයක් සඳහා පමණි)</li><li>මසකට රු 3,625/- බැගින් මාස 12ක් සඳහා (එක් වර්ෂයක් සඳහා පමණි) 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි</li></ul></td></tr>
<tr><td>සුදුසුකම් ලැබීමේ නිර්ණායක</td><td colspan="8">කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨයේ කළමනාකරණය හැදෑරීම සඳහා තෝරා ගනු ලැබූ සිසුන්</td></tr>
</table>

(ආ) පොලිස් මධ්‍යම ශුභසාධක මණ්ඩලය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

පොලිස් මධ්‍යම ශුභසාධක මණ්ඩලය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය දෙමව්පියන් පොලිස් සේවයෙහි නිරතව සිටින සිසුන් සඳහා වන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයකි. මහපොළ, ශිෂ්‍යාධාර හෝ වෙනත් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයකින් මූල්‍ය අනුග්‍රහය නොලබන සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දෙනු ලබයි.

1980 ජූනි 25 දිනැති ශ්‍රී ලංකා පොලිස් ගැසට් පත්‍ර අංක 94 හි **II** කොටස අනුව අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රමුඛතා අනුපිළිවෙළ පහත පරිදි වේ;

1. ඉංජිනේරු විද්‍යාව
2. වෛද්‍ය විද්‍යාව
3. කෘෂිකර්මය
4. දන්ත වෛද්‍ය විද්‍යාව
5. පශු වෛද්‍ය විද්‍යාව
6. භෞතික විද්‍යාව
7. ජීව විද්‍යාව
8. වාණිජ්‍ය
9. කලා

එක් විශේෂිත වර්ෂයක එක් විෂය ක්ෂේත්‍රයක් සඳහා එක් ශිෂ්‍යත්වයක් පමණක් පිරිනමනු ඇත.

| ශිෂ්‍යත්වයේ නම | පොලිස් මධ්‍යම ශුභසාධක මණ්ඩලය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ශිෂ්‍යත්ව පිරිනමන ලද සිසුන් සංඛ්‍යාව | **2008/2009** | | **2009/2010** | | **2010/2011** | | **2011/2012** | |
| | 03 | | 03 | | 03 | | 03 | |
| | මොරටුව 01 | ජපුර 01 | පේරා 02 | රුහුණ01 | මොරටුව 01 | පේරා 01 | මොරටුව 01 | ජපුර 01 |
| | රජරට 01 | | | | වයඹ 01 | | වයඹ 01 | |
| | **2012/2013** | | | | **2013/2014** | | | |
| | මොරටුව 01 | ජපුර 01 | පේරා 01 | | මොරටුව 01 | ජපුර 01 | පේරා 01 | |
| ශිෂ්‍යත්වවල වටිනාකම | **2009/10, 2010/11** - වර්ෂයකට රු. 20,000/- සලකනු ලබන පාඨමාලා කාලය තුළ (වාර්ෂිකව) වාරික 10 බැගින්<br>**2008/09** - සලකනු ලබන පාඨමාලාවේ කාලය තුළ (වාර්ෂිකව) වාරික 10 බැගින් | | | | | | | |
| සුදුසුකම් ලැබීමේ නිර්ණායක | දෙමව්පියන් පොලිස් සේවයෙහි නිරතව සිටින සහ මහපොළ, ශිෂ්‍යාධාර හෝ වෙනත් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයකින් මූල්‍ය අනුග්‍රහය නොලබන සිසුන් | | | | | | | |

කා

## කාන්තා උපාධි අපේක්ෂිකාවන් සඳහා ශ්‍රී ලංකා කාන්තා විශ්වවිද්‍යාල සම්මේලනය *(SLFUW)* දියමන්ති ජුබිලි සැමරුම් ශිෂ්‍යත්ව වැඩසටහන -2016

| ශිෂ්‍යත්වයේ නම | කාන්තා උපාධි අපේක්ෂිකාවන් සඳහා ශ්‍රී ලංකා කාන්තා විශ්වවිද්‍යාල සම්මේලනය *(SLFUW)* දියමන්ති ජුබිලි සැමරුම් ශිෂ්‍යත්ව වැඩසටහන - 2016 | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශිෂ්‍යත්ව පිරිනමන ලද සිසුන් සංඛ්‍යාව | **2014/2015**<br>84 | | | | | | |
| | කොළඹ 06 | පේරා. 06 | ජපුර 06 | කැලණි 06 | යාපනය 06 | රුහුණ 06 | මොරටුව 06 |
| | නැගෙ. 06 | අගිනිදිග 06 | රජරට 06 | සබරගමු. 06 | වයඹ 06 | ඌව වෙල්. 06 | සෞන්. වි 06 |
| ශිෂ්‍යත්වවල වටිනාකම | ශිෂ්‍යත්වයක වටිනාකම රු.10,000/- වන අතර එක්වර ගෙවනු ලැබේ. | | | | | | |
| සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 1. ඕනෑම විශ්වවිද්‍යාලයක ලියාපදිංචි වූ මහපොළ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන සහ මහපොළ ශිෂ්‍යත්ව පිරිනමනු නොලැබූ ශිෂ්‍යාවන් මෙම ශිෂ්‍යත්ව සඳහා සලකා බලනු ලබයි.<br>2. 2014 අ.පො.ස (උ.පෙළ) කුසලතාව මත (අධ්‍යයන වර්ෂය 2014/2015) ඕනෑම විෂය ධාරාවකින්<br>3. දෙමව්පියන්ගේ වාර්ෂික ආදායම<br>3. දෙමව්පියන්ගේ වාර්ෂික ආදායම රු.350,000/-ට වඩා අඩු විය යුතුය.<br>මහපොළ ශිෂ්‍යත්ව සඳහා ලබා දී ඇති නිර්ණායක අනුව, ඉහත සඳහන් කරන ලද වාර්ෂික දෙමාපිය අදායමින් පහත අඩු කිරීම් සිදු කළ හැකිය.<br>අ) සහෝදරයන් තුන්දෙනෙකුගේ උපරිමයකට යටත්ව වයස අවු.19ට අඩු පාසල් යන සහෝදරයෙක් /සහෝදරියක් සඳහා වාර්ෂිකව රු.24,000/- ක අඩු කිරීමක් | | | | | | |

| | |
|---|---|
| | ආ) සහෝදරිය /සහෝදරයා විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හදාරන නමුත් මහපොළ හෝ ශිෂ්‍යාධාර නොලබන්නේ නම් වාර්ෂිකව රු.36,000/- ක අඩු කිරීමක්<br><br>ඇ) ශිෂ්‍යයා රැකියාවක යෙදෙන්නේ නම් ඔහුගේ /ඇයගේ රැකියාවෙන් ලබන ආදායම දෙමව්පියන්ගේ ආදායමට එකතු කළ යුතුය. |
| | |

(ඈ) ඩයලොග් තාක්ෂණ ශිෂ්‍යත්ව වැඩසටහන

ඩයලොග් කුසලතා ශිෂ්‍යත්ව වැඩසටහන අ.පො.ස. උසස් පෙළ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගත් සිසුන් සඳහා වූ කුසලතා පදනම් කර ගත් ශිෂ්‍යත්ව වැඩසටහනකි. එය ප්‍රථම උපාධි මට්ටමෙන් මොරටුව හා පේරාදෙණිය ඉංජිනේරු පීඨවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා මූල්‍යාධාර සපයයි.

<table>
<tr><td>ශිෂ්‍යත්වයේ නම</td><td colspan="9">ඩයලොග් තාක්ෂණ ශිෂ්‍යත්වය</td></tr>
<tr><td rowspan="6">ශිෂ්‍යත්ව පිරිනමන ලද සිසුන් සංඛ්‍යාව</td><td colspan="2">2008/2009</td><td colspan="2">2009/2010</td><td colspan="2">2010/2011</td><td colspan="3">2011/2012</td></tr>
<tr><td colspan="2">27</td><td colspan="2">27</td><td colspan="2">27</td><td colspan="3">27</td></tr>
<tr><td>මොරටු 24</td><td>පේරා 03</td><td>මොරටු 23</td><td>පේරා 04</td><td>මොරටු 21</td><td>පේරා 06</td><td>මොරටු 19</td><td colspan="2">පේරා 08</td></tr>
<tr><td colspan="2">2013/2014</td><td colspan="3">2014/2015</td><td colspan="4">2015/2016</td></tr>
<tr><td colspan="2">27</td><td colspan="3">27</td><td colspan="4">27</td></tr>
<tr><td>මොරටු 24</td><td>පේරා 03</td><td>මොරටු 23</td><td>පේරා 02</td><td>යාපනය 02</td><td>මොරටු 22</td><td>පේරා 02</td><td>රුහුණ 01</td><td>යාපන 02</td></tr>
<tr><td>ශිෂ්‍යත්වයක වටිනාකම</td><td colspan="9">මසකට රු.4,000/-. අධ්‍යයන පාඨමාලාව මත පදනම්ව වාර්ෂිකව වාරික 10 ක් ලෙස මාස 36 සිට 60 දක්වා</td></tr>
<tr><td>සුදුසුකම් ලැබීමේ නිර්ණායක</td><td colspan="9">1.) 2015 අ.පො.ස (උ/පෙළ) විභාගයට පළමු වර පෙනී සිට භෞතික විද්‍යා විෂය ධාරාවෙන් ලංකාවෙන් වැඩිම ඉසෙඩ් අගය ලබා ගත් ශිෂ්‍යයා<br><br>2.) 2015 අ.පො.ස (උ/පෙළ) විභාගයට පළමු වර පෙනී සිට භෞතික විද්‍යා විෂය ධාරාවෙන් ලංකාවෙන් වැඩිම ඉසෙඩ් අගය ලබා ගත් ශිෂ්‍යාව<br><br>3.) 2015 අ.පො.ස (උ/පෙළ) විභාගයට පළමු වර පෙනී සිට භෞතික විද්‍යා විෂය ධාරාවෙන් ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක 25න් වැඩිම ඉසෙඩ් අගය ලබා ගන්නා සිසුන් 25දෙනා</td></tr>
</table>

**12.** **ගරු.උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා හා ගරු. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සමඟ පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීම්**

විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය අනුකූලනය කිරීම සඳහාත් කාර්යදාම ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහාත් ගරු උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා හා ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා විශ්වවිද්‍යාල ප්‍රජාවේ විද්‍යාර්ථීන්, පරිපාලකයන් සහ අනෙකුත් නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදී.

2016 වර්ෂයේ දී රැස්වීම් ගණනාවක් පවත්වන ලද අතර පහත කණ්ඩායම් හමුවන ලදී.;

1. තාක්ෂණ විෂය ධාරා ව්‍යාපෘති පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් - 2016 මැයි මස 10වන දින ( ජ'පුර, කැලණිය,යාපනය රුහුණ, නැගෙනහිර, අග්නිදිග, රජරට, සබරගමුව, වයඹ, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් හා වව්නියාව මණ්ඩපයේ ලේඛකාධිකාරී සමඟ)

2. විශ්වවිද්‍යාල සඳහා පස් අවුරුදු සංවර්ධන සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා සහ විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම සඳහා 2016.01.02 දින පැවති රුැස්වීම

3. විසිඑක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය – ව්‍යාපෘති නිමැවුම්වල හා විශ්වවිද්‍යාල සැලසුම්වල තිරසාරත්වය මිනුම් කිරීම සඳහා ලෝක බැංකුව සමඟ 2016.01.13 දින පැවති සාකච්ඡාව

4. උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා සමඟ 2016.01.18 දින පැවති තාක්ෂණ විෂය ධාරාව යටතේ උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීම

5. තාක්ෂණ ධාරාවේ විෂයයන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා 2016.03.01 උප කුලපතිවරුන් සමඟ පැවති රැස්වීම

6. විශ්වවිද්‍යාලවල පීඨාධිපතිවරුන්, මණ්ඩපාදිපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සමඟ 2016.03.08 පැවැති ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ රැස්වීම

7. ඵලදායී ගුරු සංවර්ධන වැඩසටහන තුළින් ගුණාත්මක අධ්‍යාපනය ( අධ්‍යාපන අමාත්‍ය හා යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් සමඟ) 2016 අගෝස්තු 17වන දින

8. හෙද පීඨය ස්ථාපනය කිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට 2016.02.26 දින පැවති සාකච්ඡාව

9. තාක්ෂණ විෂය ධාරා ව්‍යාපෘති පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් - 2016.09.14 දින ( ජ'පුර, කැලණිය, රුහුණ,යාපනය, නැගෙනහිර, අග්නිදිග, රජරට, සබරගමුව, වයඹ, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් හා වව්නියාව මණ්ඩපයේ ලේඛකාධිකාරී සමඟ)

10. 2016 ඔක්තෝබර් 13 දින පැවති දැනට ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති හා ප්‍රාග්ධන අයවැය උපයෝජනය සම්බන්ධ ප්‍රගති සමාලෝචනය

11. වාර්ෂික වෙන් කිරීම් සහ 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය සඳහා උපකුලපතිවරුන්, අධ්‍යක්ෂවරුන්, මණ්ඩපාධිපතිවරුන්, අමාත්‍යාංශය හා කොමිෂන් සභා සාමාජිකයන් සමඟ වි.ප්‍ර.කො.ස මණ්ඩල ශාලාවේ දී 2016.12.28 දින පැවති රැස්වීම

## 13. නීති කටයුතු

### 13.1 නව ව්‍යවස්ථාදානය

සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ නීති අංශය නියමයන් 24ක් හා නියමාවලීන් 3ක් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදී. එමඟින් අධිකරණ නඩු 24ක් සම්බන්ධව ද කටයුතු කරන ලදී.

#### 13.1.1 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නියමයන්

- 2016 ජනවාරි මස 08 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1948/58 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය සත්ත්ව විද්‍යා හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය ලෙස නැවත නම් කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 ජනවාරි මස 08 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1948/59 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නව පීඨ දෙකක් එනම් තාක්ෂණ පීඨය හා ඉංජිනේරු පීඨය ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 ජනවාරි මස 08 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1948/60 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ සාරස විද්‍යා අධ්‍යයනාංශය සාරස විද්‍යා හා ජල තාක්ෂණ අධ්‍යයනාංශය ලෙස නැවත නම් කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 පෙබරවාරි මස 19 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1954/45 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයේ භූවිඥාපන පීඨයේ සිතියම්කරණ, තොරතුරු පද්ධති අධ්‍යයනාංශය දූරස්ථ ගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය ලෙස නැවත නම් කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 පෙබරවාරි මස 19 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1954/44 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති නව අධ්‍යයනාංශය ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 පෙබරවාරි මස 19 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1954/43 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක 5හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයට නව ජෛව පද්ධති තාක්ෂණ ඉංජිනේරු අධ්‍යයනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 මාර්තු මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1960/9 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ

ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 මාර්තු මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1960/8 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ මූලික විද්‍යා අධ්‍යනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 මාර්තු මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1960/10 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ජයන්ත වැලිහින්ද පත් කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 මාර්තු මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1960/11 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ නිසි බලධරයා පත් කිරීම අවලංගු කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 අප්‍රියෙල් මස 26 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1964/11 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ කලා හා සංස්කෘතික පීඨයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 අප්‍රියෙල් මස 26 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1964/10 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ නව තාක්ෂණ පීඨයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 මැයි මස 30 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්ර අංක 1969/2 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ජයන්ත වැලිහින්ද පත් කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 ජූනි මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1973/28 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ නව තාක්ෂණ පීඨයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 ජූලි මස පළමු දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1973/76 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ නව ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 අගෝස්තු මස 09 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1979/20 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය

අධ්‍යාපන අධ්‍යයනාංශයක්, වෛද්‍ය මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශයක්, සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශයක් ස්ථාපනය කරමින් සහ ශාස්ත්‍ර පීඨයේ බෞද්ධ අධ්‍යයන අංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 මැයි මස 30 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1969/2 හි ප්‍රකාශයට පත් කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ජයන්ත වැලිහින්ද පත් කරමින් නිකුත් කරන ලද නියමය

- 2016 ඔක්තෝබර් මස 26 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1990/16 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නිර්වින්දන වෛද්‍ය අධ්‍යයනාංශය නිර්වින්දන හා සංකටක සත්කාර වෛද්‍යවේදී අධ්‍යයනාංශය ලෙස නැවත නම් කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 නොවැම්බර් මස 03 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1991/43 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 නොවැම්බර් මස 03 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1991/44 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ භාෂා අධ්‍යනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 දෙසැම්බර් මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1995/26 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නිර්වින්දනවේද අධ්‍යනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 දෙසැම්බර් මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1995/25 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ නව නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 දෙසැම්බර් මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1995/24 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යනාංශය ලෙස නැවත නම් කරමින් නිකුත් කරන ලද නියමය.

- 2016 දෙසැම්බර් මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1995/27 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා හා සංස්කෘතික කටයුතු පීඨයේ නව දර්ශන හා ඇගයුම් අධ්‍යයන අධ්‍යනාංශයක් ස්ථාපනය කරමින් නිකුත් කරන ලද නියමය

**13.1.2** වර්ෂය තුළ දී පහත නියමාවලීන් ප්‍රකාශයට පත් කරන ලදී.

- 2016 අගෝස්තු 25 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1981/79 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය සමඟ කියවිය යුතු, 91 වගන්තිය යටතේ සාදන ලද 2016 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල (සංශෝධිත) නියමාවලිය.

- 2016 ඔක්තෝබර් 13 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1988/22 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය සමඟ කියවිය යුතු, 140 වගන්තිය යටතේ සාදන ලද 2016 අංක 02 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන (සංශෝධිත) නියමාවලිය.

- 2016 ඔක්තෝබර් 13 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1988/22 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ හා 24 ආ වගන්තිය සමඟ කියවිය යුතු, 18 වගන්තිය යටතේ සාදන ලද 2016 අංක 03 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතන (සංශෝධිත) නියමාවලිය.

**13.1.3** අධිකරණ නඩු

වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ හා විනිශ්චය සභාවල ගොනු කර තිබූ පහත අධිකරණ නඩු සම්බන්ධව නීති අංශය විසින් කටයුතු කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය (24)
අභියාචනාධිකරණය (24)
දිස්ත්‍රික් අධිකරණය (3)
කම්කරු විනිශ්චය සභාව (2)
බේරුම්කරණ (1)
විශ්වවිද්‍යාල සේවා අභියාචනාධිකරණ මණ්ඩලය (18)

**13.1.4** වෙනත් ක්‍රියාකාරකම්

ආචාර්යවරුන් හැර අනෙකුත් සේවකයන්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධව විශ්වවිද්‍යාල පනතේ 75 වගන්තිය සඳහා වන සංශෝධනයක් අන්තර්ගත විශ්වවිද්‍යාල පනත සඳහා වන නව සංශෝධනය පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අතර එම සංශෝධනය නිකුත් කරන ලදී.

**14.** විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB)

සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය වාර 18ක් රැස් වී ඇත. 2016 වර්ෂයේ දී අභියාචනා මණ්ඩලයේ නව අභියාචනා විසි දෙකක් (22) ලියාපදිංචි කොට ඇත. අභියාචනා දහහතරක් (14) සම්බන්ධයෙන් නියෝග ලබා දෙන ලද අතර මෙයින් අටක් (08) නිශ්ප්‍රභ කරන ලද අතර දෙකක් (02) පිළි ගන්නා ලදී. අභියාචනා දෙකක් ඉවත් කර ගන්නා ලදී. එක් අභියාචනයක් (01) ප්‍රතික්ෂේප කරන ලද අතර එකක් (01) සමථයට පත් කර ගන්නා ලදී. මූලික නියෝග ලබා දීමක් හෝ ඉවත් කිරීමක් සිදු නොකරන ලදී. නියෝග තුනක් (03) ලේඛනගත කරන අතර අතුරු නියෝග කිසිවක් නිකුත් කර නොමැත. 2016 වර්ෂය අවසානයේ දී අභියාචනා විසි හතරක් (24) විසඳීමට ඉතුරුව ඇත.

එක් (01) සිද්ධියක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය ඉදිරිපත් කරන ලද නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයට ඉදිරිපත් කර ඇති අතර කිසිදු නියෝගයක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ නඩු ගොනු කර නොමැත.

## 15. මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම හා මධ්‍යම අභ්‍යන්තර විගණනය

### අභ්‍යන්තර විගණන අංශයේ ව්‍යුහය හා කාර්යයන්

විශ්විද්‍යාල ආයතන සංග්‍රහයේ 1 පරිච්ඡේදයේ 3 වගන්තිය යටතේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශයට විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන පැවරුම් හා පරීක්ෂණ පිළිබඳ කාර්යභාරය පැවරී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සියලු වැදගත් පරිපාලනමය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල වැදගත් අංග ආවරණය කරමින් වර්ෂය සඳහා වූ විගණන වැඩසටහන සකස් කෙරේ. පද්ධතිය තුළ යහපාලනය පවත්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාලයන්හි අභ්‍යන්තර විගණන අංශ සමඟ සම්බන්ධීකරණය කරනු ලැබේ.

වි.ප්‍ර.කො.ස අභ්‍යන්තර විගණක නිරීක්ෂකයෙකු වශයෙන් විශ්වවිද්‍යාල හා ආයතනයන්හි විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ.

### විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

විගණන කමිටුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප කමිටුවකි. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු මඟින් පාලනය වේ.

දැනට පවතින අභ්‍යන්තර පාලන පද්ධති නැවත සමාලෝචනය කිරීම හා ඇගයීම, වර්තමාන අවශ්‍යතා සමඟ සමගාමී වීම සඳහා සංශෝධනය කිරීමට අවශ්‍ය කරුණු ඇගයීම, අභ්‍යන්තර විගණන කාර්යයන් සඳහා මඟ පෙන්වීම සහ කාර්යයන්හි ඵලදායීත්වය සමාලෝචනය කිරීම යන වගකීම් විගණන කමිටුවට පැවරී ඇත.

2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී සභාපති ද ඇතුළත් 2/3 සහභාගීත්වය සපුරන ලද විගණන කමිටු හයක් පවත්වන ලදී. විගණන කමිටුවේ ලේකම්වරයා වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යනාත්ර විගණකවරයා රැස්වීම් කැඳවයි. නිරීක්ෂකයෙකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා බාහිර විගණකවරයෙකු ලෙස කටයුතු කරන විගණකාධිපති දෙපාර්තුමේන්තුවේ නියෝජිතයෙකුට ආරාධනා කරනු ලැබීය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් හා ගණකාධිකාරීවරයාටද රැස්වීම් සඳහා ආරාධනා කරනු ලැබීය.

### පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීම

විශ්වවිද්‍යාල 15ක් හා ආයතන 18ක් හා අදාළව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීම් මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා සහාය දක්වයි.

**පූර්ව විගණනය**

ගෙවීම්වල නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා පහත ක්ෂේත්‍රයන්හි පූර්ව විගණනය සිදු කරන ලදී.

- අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම
- පාරිතෝෂිකය ගෙවීම
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම

**අභ්‍යන්තර විගණන වාර්තා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය අභ්‍යන්තර විගණන වාර්තා 18ක් නිකුත් කරන ලද අතර එයින් වාර්තා 07ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අදාළව වන අතර වාර්තා 11ක් උසස් අධ්‍යාපන ආයතන හා අදාළව වේ.

**වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන්**

විශ්විද්‍යාල පද්ධතියේ සියලුම කාර්ය මණ්ඩල කාණ්ඩවල ප්‍රතිලාභය උදෙසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අනුපිළිවෙළින් ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිළිබඳ වැඩමුළු දෙකක් පවත්වන ලදී. එයට අමතරව විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවලට අනුයුක්තව සේවකයන්ගේ දැනුම හුවමාරු කර ගැනීම සඳහා අන්තර් ක්‍රියාකාරිත්ව සැසි දෙකක් පවත්වන ලදී.

## 16. සමීක්ෂණ, ප්‍රකාශන හා පර්යේෂණ අධ්‍යයනයන්

- 2015 ප්‍රකාශන මාලාවේ දහහතරවන වෙළුම වන "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන 2015" ජූනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

- එහි ප්‍රකාශන මාලාවේ දහතුන්වන වෙළුම වන " ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 2015" 2016 ජූනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

- 2015 වර්ෂයේ දී උසස් අධ්‍යාපන ආයතනයන්හි නේවාසිකාගාර පහසුකම්වල පවතින තත්ත්වය අධ්‍යයනය කරන ලද අතර වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

- ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලවලින් අයකර ගත යුතු මුදල් ප්‍රමාණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අධ්‍යයනය කොට වාර්තාව 2015 වර්ෂයේ දී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2015 මූල්‍ය වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවල ඒකක පුනරාවර්තන වියදම විශ්ලේෂණය කොට "විශ්වවිද්‍යාලවල එක් ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍යයකු සඳහා ඒකක පුනරාවර්තන වියදම විශ්ලේෂණය" යන වාර්තාව කොමිෂන් සභාවේ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2016 වර්ෂයේ දී උසස් අධ්‍යාපන ආයතනයන්හි නේවාසිකාගාර පහසුකම්වල පවතින තත්ත්වය අධ්‍යයනය කරන ලද අතර වාර්තාව කොමිෂන් සභාවේ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

- 2014 පර්යේෂණ හා සංවර්ධන (R&D) සමීක්ෂණයේ සාරාංශ වාර්තාව කොමිෂන් සභාවේ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

- ජාතික පර්යේෂණ හා සංවර්ධන (R&D) සමීක්ෂණයේ
  - (i) වර්ෂයේ සමීක්ෂණය සම්පූර්ණ කොට අදාළ දත්ත ජාතික විද්‍යා පදනම වෙත ලබා දෙන ලදී.
  - (ii) 2015 වර්ෂයේ සමීක්ෂණය විශ්වවිද්‍යාලයන්හි කේන්ද්‍රස්ථානවල සහයෝගයෙන් පවත්වන ලද අතර සාරාංශගත තොරතුරු 2017 ජනවාරි මාසයේ දී ජාතික විද්‍යා පදනම වෙත භාර දෙනු ඇත. ඉඩකඩ පිළිබඳ සමීක්ෂණය විශ්වවිද්‍යාලයන්හි පවත්වන ලද අතර පියයන් කීපයක තොරතුරු තවදුරටත් ලැබීමට ඇත.

- 2008/2009 කණ්ඩායමේ MBBS (නැවත) පරීක්ෂණය මත පදනම්ව වෛද්‍ය උපාධිධාරීන්ගේ අවසන් කුසලතා අනුපිළිවෙළ සකස් කොට සීමාවාසික පත්වීම් සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

- 2009/2010 කණ්ඩායමේ MBBS (ප්‍රධාන) පරීක්ෂණය මත පදනම්ව වෛද්‍ය උපාධිධාරීන්ගේ අවසන් කුසලතා අනුපිළිවෙළ සකස් කොට සීමාවාසික පත්වීම් සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

- 2007/2008 කණ්ඩායමේ නැවත පරීක්ෂණය මත පදනම්ව ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කුසලතා අනුපිළිවෙල පිළියෙළ කොට ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- සිද්ධ වෛද්‍ය විද්‍යාව සඳහා පොදු කුසලතා අනුපිළිවෙළ සකස් කිරීමේ ක්‍රමය සංවර්ධනය කොට 2007/2008 කණ්ඩායමේ අවසන් පරීක්ෂණය මත පදනම්ව සිද්ධ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අවසන් කුසලතා අනුපිළිවෙළ සකස් කොට ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා සංවිධානාත්මක ප්‍රතිඵල රාමුව (ORF) සකස් කොට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර 2016 වර්ෂයේ තුන්වන කාර්තුවේ ප්‍රගතිය සැලසුම් අධ්‍යක්ෂගේ සාකච්ඡා සමඟ ඉදිරිපත් කරන ලදී.

- ස්ථාවර කමිටු වෙත " උසස් අධ්‍යාපන තොරතුරුවල වැදගත්කම " පිළිබඳව ඉදිරිපත් කිරීමක් සැලසුම් අධ්‍යක්ෂ විසින් ආරම්භ කරන ලදී. 2016 දෙසැම්බර් මස මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ස්ථාවර කමිටුවටත් වෛද්‍ය හා දන්ත වෛද්‍ය ස්ථාවර කමිටුවටත් ඉදිරිපත් කිරීම් දෙකක් සඳහා සහාය ලබා දෙන ලදී.

- 2015 වර්ෂයට අදාළව සංඛ්‍යාලේඛන සඳහා වන යුනෙස්කෝ ආයතනය (UIS) සඳහා උසස් අධ්‍යාපන දත්ත සම්පූර්ණ කොට ඉදිරිපත් කරන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය -2016, 2017 නොවැම්බර් මස 17 දින පවත්වන ලද අතර සාරාංශ වාර්තා හා සංගණන ප්‍රශ්නාවලි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනලදී.

## 17. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය (GEE)

### පසුබිම

වර්තමානයේ දී විශ්වවිද්‍යාල ජීවිතය කෙරෙහි වඩාත්ම බලපාන ගැටලුවක් වී ඇත්තේ ප්‍රචණ්ඩත්වයයි. නවක වදය දීමේ පිළිවෙත වහල්බව, අවනතිය, හා තෘප්තියට පත් වීම පිළිබඳ සංස්කෘතියක් සමාජය තුළ ආරෝපණය කරනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2015 ඔක්තෝබර් මස පත් කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුව හරහා නවක වදය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වයෙන් (SGBV) තොර වූ ප්‍රතිපත්ති පාදක කර ගනිමින් සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ ගරුත්වය හා සමාන අයිතිවාසිකම් තහවුරු කෙරෙන ප්‍රචණ්ඩත්වයෙන් තොර වූ වඩා ආරක්ෂාකාරී පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණ සහිතව වැදගත් හා කාලීන ජාතික ප්‍රයත්නයක් 2016 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙහි ප්‍රධාන කර්තව්‍ය වනුයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාව ලබා දීම, ක්‍රියාත්මක කළ හැකි ආයතනික යාන්ත්‍රණ ස්ථාපනය කිරීම, අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා විෂයමාලා සංවර්ධනය කිරීම මගින් නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (**SGBV**) වැළැක්වීම සඳහා ඒ යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල ක්‍රියතාමක කරවීමට අනන්‍ද්‍ර කරවීම හා පහසුකම් සැලසීමයි.

නවක වදය සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වයට (SGBV) පිළියම් යෙදීම සම්බන්ධයෙන් වන ක්‍රියා සැලැස්ම වැළැක්වීම, මැදිහත් වීම, සහ ප්‍රතිපත්තිමය සහයෝගය යන සාකල්‍ය ශාඛා තුනකින් යුත් ප්‍රවේශයක් අදාළ කර ගෙන ඇත.

වැළැක්වීම, මැදිහත් වීම, සහ ප්‍රතිපත්තිමය සහයෝගය යන ශීර්ෂ යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කේන්ද්‍රය (CGEE) සහ ස් ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් 2016 වර්ෂයේ දී ලබා ඇති ප්‍රගතිය මෙම වාර්තාව මගින් සාරාංශගත කර ඇත. ඉහත ශීර්ෂ තුන යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි ලැයිස්තුගත කර ඇත:

### 17.1 වැළැක්වීම

- පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය (**ACU**) හා ඉන්දීය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගීත්වයෙන් " නවක වදය හා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම" පිළිබඳව උසස් මට්ටමේ උපදේශනාත්මක සංවාදයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා සියලු රාජ්‍ය විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා පවත්වන ලදී.

- බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා නවකවදය හා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය හා අදාළ මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති, සහ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව මූලික තීරණ සම්පාදකයන් දැනුවත් වීම තහවුරු කිරීම සඳහා උප කුලපතිවරුන්, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරීවරුන්, මූල්‍යාධිකාරීවරුන්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන් හා නීතිඥයන් මේ සඳහා සහභාගි කර ගන්නා ලදී. අධ්‍යයන හා පරිපාලන අංශවල සහය ඇතිව විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය මුලින් උපුටා දැමීම කෙරෙහි ඔවුන් දැනුවත් කිරීම හා උනන්දු කරවීම ද මින් අරමුණු කරන ලදී.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් සාධාරණත්වය /සමානත්වය (GEE) පිළිබඳ සංවේදීතාවක් ඇති කිරීමට හා ධාරිතාව ගොඩනැගීමටත් ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයන්හි නවක වදය හා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ ක්‍රමෝපාය ලේඛනයක් සකස් කිරීම සඳහා

දායකත්වය ලබා ගැනීමටත් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයන්හි (SDC) අධ්‍යක්ෂවරු, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකවල (CGU) අධ්‍යක්ෂවරු හා රාජ්‍ය විශ්වවිද්‍යාල පහළොවක (15) ක් නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන් "පුහුණුකරුවන් පුහුණු කිරීම" පිළිබඳව වන වැඩමුළු හරහා දැනුවත් කිරීමත් ධාරිතාව ගොඩ නැගීමත් සිදු කරන ලදී.

- විශ්වවිද්‍යාලවල සහයෝගයෙන් විශ්වවිද්‍යාල කළමනාකාරිත්වයේ, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ශක්‍යතාව ගොඩ නැගීම සඳහා පහසුකම් සලසන ලදී. ඔවුන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදනයක් ඇති කරන ලද අතර නවක වදය හා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳව හා එහි භෞතික හා සමාජ විද්‍යාත්මක ප්‍රතිඵල හා නීතිමය පාර්ශ්වය පිළිබඳව දැනුවත් කරන ලදී. තවද ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වයේ ලක්ෂණ හඳුනා ගැනීමටත් විශ්වවිද්‍යාලය තුළ එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සූදානම් කොට තැබීම සඳහා පහසුකම් සලසන ලදී. මෙම ක්‍රියාකාරකම විශ්වවිද්‍යාල 14හිම නැවත සිදු කරනු ඇත.

- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද " ශ්‍රී ලංකාව තුළ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට පිළියම් යෙදීම සඳහා වන ප්‍රතිපත්ති රාමුව හා ජාතික කාර්ය සැලැස්ම" පිළිබඳ බහු ආංශික වැඩමුළුවට ස්ථාවර කමිටු සාමාජිකයන් සහභාගී වන ලදී. උසස් අධ්‍යාපන උප අංශයට අදාළව 2016 -2020 කාල වකවානුව සඳහා කාර්ය සැලැස්මක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලදී.

**17.2 මැදිහත් වීම**

- නවකවදය ලබා දීම සම්බන්ධයෙන් වන පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ( නමාව හඳුන්වා දෙමින් හෝ නිර්නාමිකව) කේන්ද්‍රීය මාර්ගගත පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා වූ පද්ධතියක් ඉන්දීය වි.ප්‍ර.කො.ස හා ඉන්දියාවේ "Aman Trust "හා සහයෝගීත්වයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එහි කළමනාකාරිත්වය යටතේ ස්ථාපනය කර ඇත. එය නවකවදයේ වින්දිතයන්ටත් සහ නවකවදය ලබා දීමේ සිද්ධි නිරීක්ෂණය කළ අනෙකුත් අයටත් පහසු ප්‍රවේශ අවස්ථා සපයයි. එය ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 15 තුළම ක්‍රියාත්මක වේ.

  එය ශිෂ්‍යයන්ට/ සිද්ධීන් නිරීක්ෂනය කළ අයට පැමිණ, දුරකථනය හරහා හෝ ලිඛිතව දැනුම් දීම වැනි වෙනත් ක්‍රමවේද වලට අමතරව මාර්ගගත ක්‍රමය මඟින් (www.eugc.lk/helpme@ugc.ac.lk) පැමිණිලි ගොනු කිරීමට අවස්ථාව ලබා දෙනු ඇත. සියලු පැමිණිලි මාර්ගගත පැමිණිලි පද්ධතිය මත ලියාපදිංචි වනු ඇත. මෙය විද්‍යුත් තැපැල / කෙටි පණිවුඩ හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති සහ / හෝ අධ්‍යක්ෂ / ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය වෙත අදාළ පණිවිඩය ස්වයංක්‍රීයව දන්වයි. වි.ප්‍ර.කො.ස විසින් අදාළ විශ්වවිද්‍යාලය අමතනු ලබයි. විශ්වවිද්‍යාල විසින් නිසි පරිදි ප්‍රතිචාර දක්වන්නේද හා සුදුසු හා කාලීන විසඳුම් යොදන්නේද යන්න තහවුරු කිරීම සඳහා අදාළ විශ්වවිද්‍යාල විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවල ප්‍රගතිය වි.ප්‍ර.කො.ස විසින් අධීක්ෂණය කරනු ලබයි. නවකවදය ලබා දීම සීමාව අභිබවා යමින් අපරාධයක් බවට පත් වන්නේ නම් උප කුලපතිවරයා වි.ප්‍ර.කො.ස. වෙත ඒ පිළිබඳව වාර්තා කළ යුතුය.

- විශ්වවිද්‍යාල විධායක නිලධාරීන් ( සියලු රාජ්‍ය විශ්වවිද්‍යාලවල පාලක සභා සාමාජිකයන්, ලේඛකාධිකාරීවරුන් හා පීඨාධිපතිවරුන්) සඳහා අලුතින් ස්ථාපනය කරන ලද මාර්ගගත පැමිණිලි පද්ධතිය පිළිබඳව දැනුවත් කිරීමේ හා ආදර්ශනය කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

- සියලු විශ්වවිද්‍යාලවලට තමන්ගේම යාන්ත්‍රණයක් සංවර්ධනය කර ගැනීම සඳහා පහසුකම් සලසනු පිණිස දුක් ගැනවිලි යාන්ත්‍රණ හා වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ විශ්වවිද්‍යාල වෙත බෙදා හරින ලදී.

- නවක වදය හා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි විසඳීම සඳහා රහස්‍ය හා ක්‍රියාත්මක කළ හැකි දුක් ගැනවිලි යාන්ත්‍රණ විශ්වවිද්‍යාල හතක ස්ථාපනය කර ඇත.

- විශ්වවිද්‍යාල පහළොවක් නියෝජනය කරන සහ තම විශ්වවිද්‍යාලවල නවක වදය හා ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි විභාග කිරීමට විභවයක් ඇති ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් අනූ අටදෙනෙකු (98) "ලිංගික හිංසනය පිළිබඳ පැමිණිලි විභාග කිරීම" සම්බන්ධයෙන් පුහුණු කරන ලදී.

**17.3** ප්‍රතිපත්තිමය සහයෝගය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය (**CGEE**) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ අධ්‍යක්ෂවරයෙකු සමඟ ස්ථාපනය කර ඇති අතර නවකවදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සියලු ගැටලු ආමන්ත්‍රණය කරමින් සහ විශ්වවිද්‍යාලයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ සුදුසු ව්‍යුහ/ පද්ධති; ප්‍රතිපත්ති/අතුරු ව්‍යවස්ථා / මාර්ගෝපදේශ ස්ථාපනය කිරීම / සංවර්ධනය කිරීම සඳහා උපදේශනාත්මකව පහසුකම් සපයමින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ වි.වි.ප්‍ර.කො. ප්‍රතිපත්ති සඳහා ඔවුන්ගේ වගවීම හා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරමින් හා සහාය දක්වමින් ක්‍රියාත්මක වේ.

- විශ්වවිද්‍යාල නවයක විශ්වවවිද්‍යාලයේ සියලු මට්ටම්වලදී ස්ත්රී-පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගැනීම තහවුරු කිරීමට හා නවක වදය හා ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටලු ආමන්ත්‍රණය කිරීමට බලතල සහිතව විශ්වවිද්‍යාල තුළ අධ්‍යක්ෂ / සම්බන්ධීකාරකවරයෙකු සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රස්ථාන ( මධ්‍යස්ථාන/ කාමර/ කමිටු/ කාර්ය බලකාය) ස්ථාපිත කර ඇත.

- උපදේශනාත්මක ක්‍රියාවලියක් අනුගත කර ගැනීම විශ්වවිද්‍යාලවලට ස්ත්‍රී-පුරුෂ සමාජභාව ප්‍රතිපත්ති සංවර්ධනය කර ගැනීමටත් ස්ත්‍රී-පුරුෂ සමාජභාව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සවිබල ගැන්වීමටත් පහසුකම් සලසන ලදී. විශ්වවිද්‍යාල හයක් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ ඇතුළත් කර ඇත. එක් විශ්වවිද්‍යාලයක් ප්‍රතිපත්තිය සම්පූර්ණ වශයෙන්ම අනුගත කර ගෙන ඇත.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය මඟින් සියලු විශ්වවිද්‍යාලවල සඳහා අනෙකුත් දේ අතර නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය ආවරණය කරන චර්යා ධර්ම සංග්‍රහයක් සකස් කිරීම සඳහා පහසුකම් පිරිනමා ඇත. විශ්වවිද්‍යාල දෙකක් ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩලය සඳහා ප්‍රඥප්තියක් / චර්යා සංග්‍රහයක් සංවර්ධනය කර ඇති අතර ඉන් එක් විශ්වවිද්‍යාලයක් සිසුන් සඳහා පීය මට්ටමින් සිදු කරන ආරම්භක වැඩසටහනේ දී මේ පිළිබඳ දැනුවත් කර ඇත.

- නවකවදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත දුක් ගැනවිලි සඳහා දැනට පවතින සහන සැලසීමේ ක්‍රියා පිළිවෙල සඳහා සහාය දැක්වීම හා සවිමත් කිරීම සිදු කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රජාව වෙත ස්ත්‍රී -පුරුෂ සමාජභාවය හා අදාළ යෙදවුම් සඳහා දායක වීම පිණිස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් සාධාරණත්වය /සමානත්වය (GEE) පිළිබඳ ප්‍රවීණත්වය විශ්වවිද්‍යාල සඳහා ලබා දෙන ලදී.

## 18. විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 1999 ජූනි 10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 ප්‍රකාරව විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල 1999 සැප්තැම්බර් පළමු දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපනය කරන ලදී.

පාලනය හා කළමනාකරණය


2013 වර්ෂයේ දී විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි පාලනය හා කළමනාකරණය දියුණු කිරීමට හා සවිමත් කිරීමට යෝජනා කරන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නියාමනය, පරිපාලනය, සහ කළමනාකරණය සඳහා නියමාවලියක් කෙටුම්පත් කිරීමට කමිටුවක් පත් කිරීමට හා විශ්‍රාම වැටුප් අරමුදලෙහි ක්‍රියාකාරකම් කලින් කලට සමාලෝචනය කිරීමට උපදේශන/ නිරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. වර්තමානය වනවිට නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය සඳහා කෙටුම්පත් නියමාවලියක් ඉදිරිපත් කොට ඇත. අරමුදලෙහි වාර්ෂික ගිණුම් පිළියෙල කර විගණනය සඳහා විගණකාධිපති වෙත යොමු කර ඇත. රජයේ නීති හා නියමයන්ට අනුකූලව ආයෝජන සිදු කර ඇත.


මූල්‍ය තත්ත්වය
විශ්‍රාම වැටුප් අරමුදල
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව


| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| 1. | සාමාජිකයන් | | | | | |
| | සක්‍රිය සාමාජිකයන් | 8,167 | 9,124 | 10,002 | 10,831 | 11,722 |
| | අක්‍රිය සාමාජිකයන් | 1,778 | 2,003 | 1,316 | 1,412 | 1,451 |
| | මුළු සාමාජිකයන් ගණන | 9,945 | 11,127 | 11,318 | 12,243 | 13,173 |
| | | | | | | |
| 2. | මුළු සාමාජිකත්ව ගණන | 11,122 | 12,619 | 13,887 | 15,027 | 16,230 |
| 3. | විශ්‍රාම වැටුප් ලබන සාමාජිකයන් ගණන | 121 | 149 | 172 | | |
| 4. | එකවර ආපසු ගෙවන සමාජිකයන් ගණන | 362 | 489 | 638 | 712 | 812 |
| 5. | අරමුදල් ශේෂය (රු.මිලියන ) | | | | | |
| | දායකයාගේ අරමුදල | 2,432 | 3,079 | 3,871 | 4,756 | 5,805 |
| | විශ්‍රාමිකයාගේ අරමුදල හා සංචිතය | 299 | 403 | 435 | 501 | 590 |
| | අරමුදලේ වර්ධනය | 22% | 285 | 23% | 22% | 21% |
| 6. | මුළු ආයෝජනය (රු.මි) | 2,454 | 2,937 | 3,546 | 4,494 | 5,704 |
| 7. | මුළු ආයෝජන ආදායම (රු.මි) | 236 | 491 | 504 | 543 | 595 |
| 8. | ආදායම් බදු (රු.මි) | 20 | 41 | 36 | 29 | (1) |
| 9. | ආයෝජන ප්‍රතිලාභිය (%) | 10% | 17% | 15% | 12% | 10% |


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10. | සාමාජිකයන් සඳහා ප්‍රකාශිත පොලී අනුපාතිකය | 9% | 13.50% | 14% | 11% | 10.50% |
| 11. | විශ්‍රාම වැටුප් ගෙවීම් (රු.මිලියන) | 17 | 27 | 28 | 32 | 39 |
| 12. | විශ්‍රාම වැටුප් ගෙවීමේ වර්ධනය | 0 | 59% | 4% | 14% | 21% |

ණයකර





## 19. විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදල

විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන්ගේ විශ්‍රාම ආරක්ෂණ සැලැසුමක් වශයෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 89-96 දක්වා වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ස්ථාපනය කරන ලදී. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙහි අරමුණ නම් සාමාජිකයන්ට විශ්‍රාම ගැනීමේ දී හෝ සේවය අවසන් කිරීමේ දී වඩා යහපත් ප්‍රතිලාභයක් ලබා දීම ස්ථිර ලෙස තහවුරු කිරීම පිණිස අරමුදල කළමනාකරණය කිරීමයි.


අර්ථසාධක අරමුදලෙහි මූල්‍යමය වැදගත් අවස්ථා පහත දක්වා ඇත;


| මූල්‍යමය තත්ත්වය<br>විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | දින වන විට | **2011** | **2012** | **2013** | **2014** | **2015** | **2016** |
| | | | | | | | | |
| 1. | සාමාජිකත්වය | | | | | | | |
| | සක්‍රිය සාමාජිකයන් | දෙසැ.31 | 27,892 | 28,291 | 30,103 | 29,398 | 30,276 | 32,055 |
| | අක්‍රිය සාමාජිකයන් | දෙසැ.31 | 5,288 | 5,272 | 5,251 | 5,234 | 5,222 | 5,218 |
| 2. | මුදල් ආපසු ගෙවීම | | | | | | | |
| | ආපසු ගෙවීම් සංඛ්‍යාව | දෙසැ.31 | 2,663 | 2,349 | 2,722 | 3,130 | 2,864 | 2,845 |
| | ආපසු ගෙවන ලද මුදල (රු.මි) | දෙසැ.31 | 997 | 1,031 | 1,543 | 1,799 | 1,803 | 1,737 |
| 3. | අරමුදල් ශේෂය (රු.මි) | දෙසැ.31 | 18,502 | 20,832 | 23,457 | 26,504 | 29,419 | 33,052 |
| 4. | ණය ශේෂය (රු.මි) | දෙසැ.31 | 4,031 | 4,174 | 4,652 | 4,710 | 4,662 | 4,745 |
| 5. | සාමාන්‍ය සංචිතය (රු.මි) | දෙසැ.31 | 124 | 391 | 430 | 116 | 250 | 220 |
| 6. | පොලී අනුපාත සැමයීම් සංචිත (IRER) (රු.මි) | දෙසැ.31 | 282 | - | - | - | - | - |
| 7. | වර්ෂය තුළදී ලබා දුන් ණය (රු.මි) | දෙසැ.31 | 859 | 784 | 1,243 | 892 | 804 | 916 |
| 8. | මුළු ආයෝජනයන් (රු.මි) | දෙසැ.31 | 13,582 | 15,692 | 16,607 | 18,592 | 18,543 | 23,763 |
| 9. | ආයෝජන ආදායම (රු.මි) | දෙසැ.31 | 1,561 | 1,751 | 2,455 | 2,671 | 2,678 | 2,852 |
| 10. | ආදායම් බදු (රු.මි) | දෙසැ.31 | 125 | 141 | 193 | 157 | 132 | 57 |
| 11. | ආයෝජන ප්‍රතිලබ්ධිය | දෙසැ.31 | 11.50% | 11.16% | 14.78% | 14.37% | 13.82% | 12.87% |
| 12. | ප්‍රකාශිත පොලී අනුපාතිකය - ආරම්භක ශේෂය මත | ජනවා.1 | 9.5% | 11.0% | 13.50% | 15.00% | 11.00% | 11.30% |


විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ වර්ධනය




ප්‍රතිලාභ






## 20. 2016 වර්ෂයේ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පැවරී ඇති බලතල, රාජකාරී, හා කාර්යයන් ප්‍රකාරව හා වැටුප්, බඳවා ගැනීමේ පරිපාටි හා සේවක සංඛ්‍යා, සහ අනෙකුත් පරිපාලනමය ගැටළු යනාදිය සම්බන්ධව අදාළ රාජ්‍ය ආයතන විසින් සිදු කරන ලද නියමයන් හා අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල පහසු ක්‍රියාකාරීත්වය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පහත කොමිෂන් සභා චක්‍රලේඛ හා ආයතන චක්‍රලේඛ ලිපි නිකුත් කරන ලදී. 2016 වර්ෂයේ දී නව විෂයයන් සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් චක්‍රලේඛ 19ක් ( 2015 වර්ෂයේ දී 14) නිකුත් කරන ලද අතර අනෙකුත් චක්‍රලේඛ මඟින් පෙර චක්‍රලේඛ යාවත්කාලීන කර ඇත.

1984 වර්ෂයේ දි ප්‍රකාශයට පත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවේ හා විශ්වවිද්‍යාලවල ආයතන සංග්‍රහය සංශෝධන කිරීම 2015 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද අතර එය 2016 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද බව සඳහන් කළ යුතුය. කාර්යයේ වැදගත්කම හා සංකීර්ණත්වය සලකා, විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්‍රාමික උත්කෘෂ්ට පුද්ගලයන්ගේ සහ කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාලයන්හි ඇතැම් ජ්‍යෙෂ්ඨ පරිපාලකයන්ගේ මාර්ගෝපදේශනය හා සහාය මේ සඳහා ලබා ගන්නා ලදී.

අ) කොමිෂන් සභා චක්‍රලේඛ

| චක්‍රලේඛ අංකය | විෂය | චක්‍රලේඛයේ දිනය |
|---|---|---|
| 01/2016 | බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා මධ්‍යස්ථාන / ඒකක කළමනාකරණය සඳහා සහ බාහිර විභාග පැවැත්වීම සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් අනුපාතික තීරණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ | 01.01.2016 |
| 02/2016 | අධ්‍යයන දීමනාව ප්‍රතිශෝධනය කිරීම | 21.01.2016 |
| 30/2016 | අධ්‍යක්ෂ / නේවාසිකාගාර යන තනතුරු නාමය “අධ්‍යක්ෂ / ශිෂ්‍ය නේවාසික පහසුකම්” ලෙස නැවත නම් කිරීම | 05.02.2016 |
| 04/2016 | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම් (SFAs) තුළින් උපයා ගත් අරමුදල් භාවිත කිරීම පිළිබඳ මාර්ගෝපදේශ | 01.03.2016 |
| 07/2014(i) | විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා අතිරේක මාසික දීමනාවක් ගෙවීම | 20.03.2016 |
| 03/2015(i) | 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයන් සඳහා අන්තර් දීමනා ගෙවීම | 22.04.2016 |
| 09/2015(i) | ලිපිකරු / ගබඩා භාරකරු / සරප්/ පරිගණක යෙදවුම් සහකාර තනතුරුවල II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය | 26.04.2016 |
| 08/2015(i) | විශේෂ ශ්‍රේණියට සහ I ශ්‍රේණියට උසස් කරන ලද උප ශාලාධිපතිවරුන්ට නියමිත සේවා කාලය අඩු කිරීමේ ප්‍රතිලාභය ලබා දීම | 03.05.2016 |
| 05/2016 | ඩිප්ලෝමා හා උපාධිධාරීන් සඳහා දිරි දීමනා ලෙස වැටුප් වර්ධක ගෙවීම | 12.05.2016 |
| 06/2016 | විශ්වවිද්‍යාලවල සෞඛ්‍ය මධ්‍යස්ථානවලට අනුයුක්තව සිටින වෛද්‍ය නිලධාරීන් හා දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා සම කිරීමේ දීමනා ගෙවීම සංශෝධනය | 27.05.2016 |
| 07/2016 | මූල්‍යාධිකාරී තනතුර සඳහා වන තේරීම් කමිටුව සංශෝධනය | 03.06.2016 |
| 08/2016 | කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය - ( වෛද්‍ය/ දන්ත වෛද්‍ය) සහ (වෛද්‍ය / දන්ත වෛද්‍ය)- නොවන තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සඳහා සංශෝධන | 14.06.2016 |
| 09/2016 | විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරුවල පුරප්පාඩු පිරවීම | 21.06.2016 |
| 10/2016 | රාජ්‍ය විශ්වවිද්‍යාලවල විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා (UBL) සවිමත් කිරීම | 25.07.2016 |
| 11/2016 | වෘත්තීය සමිති ක්‍රියාමාර්ග | 04.08.2016 |
| 11/2016(i) | වෘත්තීය සමිති ක්‍රියාමාර්ග | 05.08.2016 |

| | | |
|---|---|---|
| 11/2016(ii) | වෘත්තීය සමිති ක්‍රියාමාර්ග | 18.08.2016 |
| 12/2016 | රාජකාරි ඉටු කරමින් සිටියදී තුවාළ ලබන විශ්වවිද්‍යාල සේවකයන් සඳහා වන්දි | 18.08.2016 |
| 13/2016 | විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන මඟින් බාහිර උපාධි සහ බාහිර වැඩසටහන් පිරි නැමීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම | 31/08.2016 |
| 14/2016 | උප කුලපති තනතුර සඳහා පත් කිරීම | 28.09.2016 |
| 15/2016 | කළමනාකරණ සහකාර සහ කාර්යාල සහයක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි | 04.10.2016 |
| 08/2016(i) | කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය - ( වෛද්‍ය/ දන්ත වෛද්‍ය) සහ (වෛද්‍ය / දන්ත වෛද්‍ය)- නොවන තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සඳහා සංශෝධන | 17.11.2016 |
| 16/2016 | විශ්වවිද්‍යාල පද්ධතියේ ආචාර්යවරුන් හැර අනෙකුත් සේවයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස | 17.11.2016 |
| 17/2016 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම -2016 | 05.12.2016 |
| 17/2016(i) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කිරීම - 2016 | 08.12.2016 |
| 18/2016 | ආචාර්යවරුන් සඳහා අධ්‍යයන නිවාඩු | 15.12.2016 |
| 19/2016 | ආචාර්යවරුන් සහ ගුරුවරුන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු | 16.12.2016 |

ආ) ආයතන චක්‍රලේඛ ලිපි

| චක්‍රලේඛ ලිපි අංකය | විෂය | චක්‍රලේඛයේ දිනය |
|---|---|---|
| 01/2016 | රාජ්‍ය වෙසක් උත්සවය සැමරීම -2016 | 27.04.2016 |
| 02/2016 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/(2001)(XI) අදාළ කර ගැනීම– විනය පරීක්ෂණ නිලධාරීන්ගේ නම් ලැයිස්තුව | 05.05.2016 |
| 03/2016 | රාමලාන් (රාමසාන්) සමය තුළ විශේෂ නිවාඩු ලබා දීම -2016 | 07.06.2016 |
| 04/2016 | ව්‍යාපෘතිවල සේවක සංඛ්‍යාව හා පාරිශ්‍රමික කළමනාකරණය කිරීම | 10.08.2016 |
| 05/2016 | සහනදායි පදනම මත මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම | 22.08.2016 |
| 06/2016 | සහනදායි පදනම මත මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම | 22.09.2016 |
| 07/2016 | ප්‍රසිද්ධ නිවාඩු හා සති අන්තයේ සේවය කිරීම වෙනුවෙන් පරිපාලන නිලධාරීන්ට නිවාඩු දින ගෙවීම් ලබා දීම | 22.09.2016 |
| 08/2016 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩලය විසින් සහතික කරනු ලැබීම මත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය ( වෛද්‍ය / දන්ත වෛද්‍ය) තනතුර සඳහා උසස් කිරීම ක්‍රියාත්මක දිනය තීරණය කිරීම | 11.10.2016 |
| 09/2016 | භාෂා පරිවර්තනය, භාෂණ පරිවර්තනය හා යතුරු ලියනය කිරීම වෙනුවෙන් වූ ගාස්තු සංශෝධනය කිරීම | 03.11.2016 |

| | | |
|---|---|---|
| 10/2016 | ගං වතුර, නාය යෑම් හා මාර්ග අවහිරතා හේතුවෙන් රාජකාරියට වාර්තා කිරීමට නොහැකි වූ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට නිවාඩු - 2016 මැයි | 21.11.2016 |
| 11/2016 | ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශයේ කථිකාචාර්ය (ආධුනික)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය /ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීම | 30.11.2016 |
| 05/2016(i) | සහනදායි පදනම මත මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම | 06.12.2016 |
| 12/2016 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ තනතුර සඳහා උසස් කිරීම ක්‍රියාත්මක වන දිනය තීරණය කිරීම | 15.12.2016 |
| 13/2016 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2016 අදාළ කර ගැනීම | 27.12.2016 |
| 14/2016 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2016 අදාළ කර ගැනීම - විශේෂ අත්තිකාරම් ගෙවීම | 28.12.2016 |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

LKR

| 2016 දෙසැම්බර් 31 දිනට | Note | 2016 | 2015 (ප්‍රති ප්‍රකාශිත) |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 1,038,442,452 | 541,262,961 |
| ලැබිය යුතු ගිණුම් | 2 | 126,275,566 | 98,052,511 |
| තොග | | 2,840,786 | 3,160,572 |
| ඉදිරියට කල ගෙවීම්/තැන්පතු | 3 | 22,721,409 | 26,972,666 |
| **මුළු ජංගම වත්කම්** | | **1,190,280,213** | **669,448,710** |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4 | 69,012,086 | 65,247,143 |
| ඉඩම් හා ගොඩනැගිලි | 4 | 507,046,286 | 503,950,186 |
| කරගෙන යන වැඩ | | 18,703,990 | 1,563,240 |
| ආයෝජන | 5 | 55,582,534 | 73,458,127 |
| බැදුම්කර අධිමිල | | 7,938,241 | 8,864,795 |
| පරිත්‍යාග/ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන | 6 | 19,278,187 | 18,671,455 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **677,561,323** | **671,754,946** |
| **මුළු වත්කම්** | | **1,867,841,536** | **1,341,203,656** |
| ස්කන්ධය හා වගකීම | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු ගිණුම් | 7 | 619,624,518 | 524,052,613 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | 8 | 6,116,534 | 6,555,898 |
| **මුළු ජංගම වගකීම්** | | **625,741,051** | **530,608,511** |
| ජංගම නොවන වගකීම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 9 | 42,006,685 | 36,587,518 |
| ප්‍රදාන අරමුදල් | 10 | 23,899,632 | 22,464,024 |
| පර්යේෂණ අරමුදල් | 11 | 12,624,243 | 12,705,985 |
| විශේෂ අරමුදල් | 12 | 32,002,312 | 31,146,210 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **110,532,872** | **102,903,737** |
| **මුළු වගකීම්** | | **736,273,923** | **633,512,248** |
| **ශුද්ධ වත්කම්** | | **1,131,567,614** | **707,691,409** |
| ඒකාබද්ධ අරමුදල් | | | |
| විලම්භිත ප්‍රාග්ධන ලැබීම් | 13 | 69,109,707 | 63,740,608 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 14 | 65,286,501 | 41,578,491 |
| ස්ථාවර වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් ප්‍රදාන | 15 | 11,680,636 | 3,419,437 |
| වියදම් නොකළ මානව සම්පත් සංවර්ධන අරමුදල | 16 | - | 34,224,316 |
| 2017 අය වැය යෝජනා | 17 | 409,054,248 | - |
| සේවක සංවර්ධන අරමුදල | | 31,655,391 | 37,497,213 |
| UGC සංවර්ධන අරමුදල | | 15,000,000 | - |
| නැවත අගය කිරීමේ අතිරික්තය | | 509,313,767 | 509,313,767 |
| සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | | 20,467,362 | 17,917,576 |
| **ශුද්ධ වගකීම්** | | **1,131,567,614** | **707,691,406** |

මූල්‍ය ප්‍රකාශ වල පිටු අංක 05 සිට 09 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 10 සිට 20 දක්වා ගිණුම් සඳහා වන සමපත් දක්වා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයින්ගේ වගකීමට බැඳී සිටී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කොට අත්සන් කරන ලදී.

Prof. P. S. M. Gunaratne
උප සභාපති

R.A.U Ranaweera
ගණකාධිකාරී

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKR

| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016 | 2015 (ප්‍රති ප්‍රකාශිත) |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ලැබීම | | |
| මෙහෙයුම් අතිරික්තය/(ඌනතාවය) | **16,958,489** | **43,081,432** |
| ගැලපීම් | | |
| පෙරවර්ෂයේ ගැලපීම් | 591,297 | (6,494,225) |
| UGC සංවර්ධන අරමුදලට මාරුකිරීම් | (15,000,000) | - |
| ක්ෂය වීම් | 24,371,220 | 24,330,392 |
| ක්‍රමක්ෂය | (33,861,545) | (33,781,219) |
| බැදුම්කර අයිමිල | 926,555 | 926,555 |
| තොගවල අඩුවීම් | 319,786 | (973,642) |
| වෙළඳණය හිමියන්ගේ වැඩිවීම | 95,132,540 | 385,880,197 |
| පාරිතෝෂිතය සඳහා වෙන් කිරීම | 8,353,634 | 1,819,521 |
| ස්ථාවර වත්කම් විකිණීම් (ලාභ)/අලාභ | 100,606 | 47,492 |
| ඉදිරියට කළ ගෙවීම් වල අඩුවීම් | 4,251,257 | (15,757,493) |
| අයවීම් වල අඩුවීම් | (28,223,055) | (5,853,353) |
| පොලී ලැබීම් | - | - |
| පොලී ගෙවීම් | - | - |
| පාරිතෝෂිතය ගෙවීම් | (2,934,468) | (3,201,458) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ලැබීම් | **70,986,316** | **390,024,199** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපළ පිරියත උපකරණ මිලට ගැනීම | (24,438,015) | (40,875,441) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් | | - |
| ස්ථාවර තැන්පතු මත ආයෝජන | 17,268,861 | (259,132) |
| කරගෙන යන වැඩ වල වැඩිවීම් | (17,140,750) | (278,751) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **(24,309,904)** | **(41,413,324)** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| මූලධන ආධාර ලැබීම් | 53,805,000 | 64,704,614 |
| පුනරුත්ථාපන ආධාර ලැබීම් | 10,500,000 | 10,000,000 |
| පර්යේෂණ අරමුදල් වල අඩුවීම් | (81,742) | (237,765) |
| විශේෂ කාර්යයන් සඳහා අරමුදල් ලැබීම් | 856,102 | 10,021,208 |
| ශිෂ්‍යත්ව අරමුදල් ලැබීම්/ගෙවීම් | 1,435,608 | 421,467 |
| කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදලේ වැඩිවීම/ UGC සංවර්ධන අරමුදල වැඩිවීම | 9,158,178 | (25,768,695) |
| වාහන සඳහා කල්බදු ගෙවීම් | - | - |
| මානව සම්පත් සංවර්ධන අරමුදලේ අඩුවීම | (34,224,316) | 24,557,906 |
| 2017 අය වැය යෝජනා වැඩිවීම | 409,054,248 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **450,503,079** | **83,698,735** |
| | | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | 497,179,491 | 432,309,610 |
| **2016.01.01** දිනට මුදල් ශේෂය | 541,262,961 | 108,953,351 |
| **2016.12.31** දිනට මුදල් ශේෂය | **1,038,442,452** | **541,262,961** |

සටහන 01

| | | |
|---|---|---|
| 0002323284 - ලංකා බැංකුව | 432,552 | 4,703,238 |
| ලංකා බැංකුව - ශිෂ්‍යත්ව අරමුදල | 7,331,659 | 6,559,723 |
| කෙටිකාලීන ආයෝජන - ලංකා බැංකුව | 850,000,000 | 530,000,000 |
| කෙටිකාලීන ආයෝජන - ලංකා බැංකුව - 80045617 | 180,678,240 | - |
| | **1,038,442,452** | **541,262,961** |

# ආදායම් ප්‍රකාශය

LKR

| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | Note | 2016 | 2015 |
|---|---|---|---|
| ආදායම් | | | |
| රජයේ ප්‍රදාන | 18 | 2,300,145,995 | 1,591,484,503 |
| වෙනත් ආදායම් | 19 | 57,403,216 | 49,226,246 |
| | | - | - |
| මුලු ආදායම් | | **2,357,549,210** | **1,640,710,749** |
| | | | |
| වියදම් | | | |
| පුද්ගල වේතන | 20 | 193,794,398 | 166,264,184 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | 21 | 81,858,147 | 58,021,613 |
| ප්‍රදාන හා වෙනත් මාරුකිරීම් | 22 | 1,993,861,505 | 1,312,190,878 |
| ක්ෂය වෙන් කිරීම් හා ක්‍රමක්ෂය | 23 | 24,371,220 | 24,330,392 |
| පුනරුත්ථාපන වියදම් | 24 | 9,490,326 | 9,450,828 |
| වෙනත් වියදම් | 25 | 37,215,126 | 27,371,421 |
| මුලු වියදම් | | **2,340,590,721** | **1,597,629,316** |
| | | | |
| අතිරික්තය/ඌනතාවය | | **16,958,489** | **43,081,432** |

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | විලම්භිත ප්‍රදාන | වියදම් නොකළ ප්‍රදාන | රඳවාගත් ලාභ/අලාභ | UGC සංවර්ධන අරමුදල | නැවත අගය කිරීමේ අතිරික්තය | කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2016.01.01 දිනට ශේෂය | 63,740,608 | 79,222,244 | 17,917,576 | - | 509,313,767 | 37,497,213 | **707,691,408** |
| පෙරවර්ෂ සඳහා ගැලපීම් | | | 591,297 | | | | **591,297** |
| **2016.01.01 දිනට ශේෂය** | **63,740,608** | **79,222,244** | **18,508,873** | **-** | **509,313,767** | **37,497,213** | **708,282,705** |
| මූලධන ප්‍රතිපාදන වැඩිවීම | 5,369,099 | | | | | | **5,369,099** |
| අතිරික්තය/ඌනතාවය | | | 16,958,489 | | | | **16,958,489** |
| වියදම් නොකළ ප්‍රදාන වැඩිවීම | | 406,799,141 | | | | | **406,799,141** |
| කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදල අඩුවීම් | | | | - | | (5,841,822) | **(5,841,822)** |
| UGC සංවර්ධන අරමුදලට මාරුකිරීම් | | | (15,000,000) | 15,000,000 | | | - |
| **2016.12.31 දිනට ශේෂය** | **69,109,707** | **486,021,385** | **20,467,362** | **15,000,000** | **509,313,767** | **31,655,391** | **1,131,567,614** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඒ/යූජීසී/6/16/1 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதි / Date } 2017 ඔක්තෝබර් 16 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 (5) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් - 1. ලේකම් , උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

2. ලේකම් , මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඒ/යූජීසී/6/16/1   මබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 16 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 (5) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(4) හා (8) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(5) වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශකිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණන විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

කොමිෂන් සභාවේ උප සභාපති, සභාපති ධූරය දරමින් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරමින් විශ්ව විද්‍යාල පනතට අනුකූල නොවන පරිදි ඇපයෙන් සීමා සහිත සමාගමක් ලෙස ලංකා එඩියුකේෂන් ඇන්ඩ් රිසර්ච් නෙට්වර්ක්ස් සමාගම 2009 ජුනි 25 දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. එම සමාගම විසින් උසස් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දී තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් නිකුත් කරනු ලබන ණය මුදල් සහ මාසික අවකරණ ඇතුළත්කර ණය ලේඛනයක් විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව රු.1,958,127 ක් වූ සේවක ණය ශේෂවල එකතුව අවකරණ ලේඛනයේ ශේෂය සමඟ සැසඳීමේදී රු. 1,109,059 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු ගිණුම්

2011 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් දරන ලද එකතුව රු. 893,271 ක වියදම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර එය අඛණ්ඩව අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

2015 ජූලි 14 දිනැති අංක 04/2015, දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනි ලෙස තරඟකාරි ආයතනවලින් මිල ගණන් කැඳවීමකින් තොරව රක්ෂණ ආයතනයක් තෝරා ගෙන සමාලෝචිත වර්ෂයේදී වාහන 17 ක් සඳහා 2014 වර්ෂයේ වාහනවල වෙළඳපල වටිනාකම පදනම් කරගෙන රක්ෂණ ආවරණ ලබා ගෙන රු.1,317,405 ක් රක්ෂණ වාරික ලෙස ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,958,489 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.43,081,432 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 26,122,943 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වැටුප් හා වේතන සහ සේවක ප්‍රතිලාභ වියදම් රු. 27,530,214 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.17,835,677 ක අතිරික්තය 2016 වර්ෂය දක්වා විචලනය වෙමින් පැවතුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.171,093,830 ක්වූ ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ සුළු වශයෙන් අඩු වී තිබුණද 2014 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.235,124,107 ක්වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට එරෙහිව අධිකරණවල හා අනෙකුත් ආයතනවල නෛතික සිද්ධීන් 54 ක් විභාග වෙමින් පැවති අතර එයින් 30 ක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කළ ඒවා විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල්, උසස් අධ්‍යාපන ආයතන වලට බෙදා වෙන් කරදීම සහ එම උසස් අධ්‍යාපන ආයතන විසින් කරනු ලබන වියදම් පාලනය කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය තත්ත්වයන් පවත්වා ගැනීම, උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය විධිමත් කිරීම, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ශිෂ්‍යයන් ඇතුල් කිරීම විධිමත් කිරීම කොමිෂන් සභාවේ අරමුණු වේ.

අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම

පසුගිය වර්ෂ 04 තුළ විශ්ව විද්‍යාලවලට තෝරාගත් සිසුන් සංඛ්‍යාව සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණයට අනුව 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂ දක්වා විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම්ලත් සිසුන්ගෙන් විශ්ව විද්‍යාලවලට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලවලට දේශීය සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොමිෂන් සභාව විසින් කොළඹ, කැළණිය, ශ්‍රී ජයවර්ධනපුර වැනි ප්‍රධාන විශ්වවිද්‍යාලවල මෙන්ම අනෙකුත් විශ්ව විද්‍යාලවල පවත්වාගෙන යනු ලබන භෞතික විද්‍යාව, කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය, ආහාර විද්‍යාව හා තාක්ෂණය, පරිගණක විද්‍යාව, ජෛව විද්‍යාව වැනි පාඨමාලා සඳහා සුදුසුකම් සපුරන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම නිසා ඇති වන සිසු පුරප්පාඩු සඳහා තවදුරටත් ඉල්ලුම් කර ඇති සිසුන් අතුරින් නැවත බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා පිළිවෙළින් 1,794 ක්, 1,455 ක් හා 1,695 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමේ සුදුසුකම් ලබා ඇති සිසුන් විශාල ප්‍රමාණයකට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමේ වරම් අහිමි කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 2015/2016 අධ්‍යයන වර්ෂයේදී පැවති පුරප්පාඩු 1,695 න් පුරප්පාඩු 990 ක් වෙනුවෙන් විශ්වවිද්‍යාලවල විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන් වෙත ලියාපදිංචි වන ලෙස දන්වා යවා තිබූ නමුත් ඇතැම් පාඨමාලාවල පවතින යල්පැන ගිය හා ගතානුගතිකභාවය නිසා විශ්වවිද්‍යාල ප්‍රවේශය භාර නොගැනීම නිසා ඇති වූ පුරප්පාඩු බව නිරීක්ෂණය විය. එසේම පීඨාධිපතිවරුන් විසින් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව සිසුන් අනුයුක්ත නොකරන ලෙසට ප්‍රතිපාදන කොමිෂම වෙත දන්වා තිබීම හේතුවෙන් පුරප්පාඩු පැන නැගී ඇති බවද නිරීක්ෂණය විය.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම

පසුගිය වර්ෂ 04 තුළ විශ්ව විද්‍යාලවලට තෝරාගත් සිසුන් සංඛ්‍යාව සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණයට අනුව 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂ දක්වා විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම්ලත් සිසුන්ගෙන් විශ්ව විද්‍යාලවලට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලවලට දේශීය සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොමිෂන් සභාව විසින් කොළඹ, කැළණිය, ශ්‍රී ජයවර්ධනපුර වැනි ප්‍රධාන විශ්වවිද්‍යාලවල මෙන්ම අනෙකුත් විශ්ව විද්‍යාලවල පවත්වාගෙන යනු ලබන භෞතික විද්‍යාව, කෘෂි තාක්ෂණය සහ කළමනාකරණය, ආහාර විද්‍යාව හා තාක්ෂණය, පරිගණක විද්‍යාව, ජෛව විද්‍යාව වැනි පාඨමාලා සඳහා සුදුසුකම් සපුරන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම නිසා ඇති වන සිසු පුරප්පාඩු සඳහා තවදුරටත් ඉල්ලුම් කර ඇති සිසුන් අතුරින් නැවත බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා පිළිවෙළින් 1,794 ක්, 1,455 ක් හා 1,695 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමේ සුදුසුකම් ලබා ඇති සිසුන් විශාල ප්‍රමාණයකට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමේ වරම් අහිමි කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 2015/2016 අධ්‍යයන වර්ෂයේදී පැවති පුරප්පාඩු 1,695 න් පුරප්පාඩු 990 ක් වෙනුවෙන් විශ්වවිද්‍යාලවල විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන් වෙත ලියාපදිංචි වන ලෙස දන්වා යවා තිබූ නමුත් ඇතැම් පාඨමාලාවල පවතින යල්පැන ගිය හා ගතානුගතිකභාවය නිසා විශ්වවිද්‍යාල ප්‍රවේශය භාර නොගැනීම නිසා ඇති වූ පුරප්පාඩු බව නිරීක්ෂණය විය. එසේම පීඨාධිපතිවරුන් විසින් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව සිසුන් අනුයුක්ත නොකරන ලෙසට ප්‍රතිපාදන කොමිෂම වෙත දන්වා තිබීම හේතුවෙන් පුරප්පාඩු පැන නැගී ඇති බවද නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාලවලට විදේශීය සිසුන් ඇතුළත් කරගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශීය සිසුන් බඳවා ගැනීමට තීරණය කර තිබුණද පසුගිය අධ්‍යයන වර්ෂ තුනක් සඳහා විශ්වවිද්‍යාලවලට විදේශ සිසුන් බඳවා ගැනීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව සහ බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අතර පහත සඳහන් විචලතාවයන් පැවතුණි.

| අධ්‍යයන වර්ෂය | යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 2013/2014 | 62 | 41 | 21 |
| 2014/2015 | 36 | 27 | 09 |
| 2015/2016 | 61 | 17 | 44 |

(ii) දේශීය විශ්වවිද්‍යාල සඳහා තෝරා ගනු ලබන විදේශීය සිසුන් කොළඹින් බැහැර විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් නොවීමේ ප්‍රවණතාවය මෙම පුරප්පාඩු කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණු අතර එම විශ්වවිද්‍යාල තත්ත්වය උසස් කිරීමත් සමඟ ප්‍රවාහන පහසුකම්, නවාතැන්, ආහාරපාන හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් ද ජාත්‍යන්තර තත්ත්වයට ගැලපෙන ලෙස වැඩි දියුණු නොවීම මේ සඳහා හේතු වී ඇති බව ද විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකරකම්

කොමිෂන් සභාව විසින් 2015 වර්ෂයේදී පිහිටුවන ලද ස්ත්‍රී/පුරුෂ සමාජභාවයේ සමානාත්වය/සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය සහ ගුණත්වය ආරක්ෂා කිරීම පිළිබඳ සභාව වෙනුවෙන් ඉඩ පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව මාසික කුලිය රු.150,000 ක් වූ ගොඩනැගිල්ලක් රු.225,000 ක මාසික කුලියට වර්ෂයක් සඳහා ලබා ගෙන තිබුණි.

(ඇ) ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් ආචාර්යවරුන්ගෙන් අයකරගත් මුදල් විශ්වවිද්‍යාල පනතේ 10 (2) හා 99 (1) වගන්ති අනුව විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු වේ. කෙසේ වුවත් ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් ද තොරව 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ අරමුදල "Bond Violation/ Breach Fund" නමින් අරමුදලක් පිහිටුවා එම මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායම ආයතනයේ හා විශ්වවිද්‍යාලවල විවිධ වියදම් සඳහා යොදාගෙන තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව කොමිෂන් සභාවේ හා විශ්වවිද්‍යාල 6 ක සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.1,198,916 ක් හා රු.266,413,842 ක් ලෙස "Bond violation" අරමුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) නියැදි පරීක්ෂණයකට අනුව විශ්වවිද්‍යාල 4 ක ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.189,232,994 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදය 7.6 සහ 7.8 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා රු.3,855,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එයින් ප්‍රාග්ධන වැඩ 03 ක් සඳහා රු.1,750,000,000 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට 2016 දෙසැම්බර් 29 දින ලබා දී තිබුණු රු.900,000,000 න් රු.409,054,248 ක මුදලක් ඉතිරි වී තිබුණි.

(ආ) විවිධ වර්ගයේ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කොමිෂන් සභාව විසින් රු.23,899,632 කින් යුත් අරමුදල් ගිණුම් 30 ක් පවත්වා ගෙන ගොස් තිබූ නමුත් ශිෂ්‍යත්ව කටයුතු සඳහා අරමුදල් ගිණුම් 05 ක රු.15,336,221 ක් පමණක් උපයෝගී කර ගෙන තිබුණි. උපයෝජනය නොකළ අරමුදල් ගිණුම් 25 හි රු.8,563,411 ක ශේෂයක් පැවතුන අතර එම මුදල් බැංකු ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

කොමිෂන් සභාවේ සිවුමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.59,842,180 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2015 ජුනි 22 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව වැඩ නිම කළ යුතු දිනය 2016 සැප්තැම්බර් 14 දින වුවද එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 35 ක් විය. කොන්ත්‍රාත්කරුගේ 2016 අගෝස්තු 10 දිනැති

(ඇ) ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් ආචාර්යවරුන්ගෙන් අයකරගත් මුදල් විශ්වවිද්‍යාල පනතේ 10 (2) හා 99 (1) වගන්ති අනුව විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු වේ. කෙසේ වුවත් ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් ද තොරව 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ අරමුදල "Bond Violation/ Breach Fund" නමින් අරමුදලක් පිහිටුවා එම මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායම ආයතනයේ හා විශ්වවිද්‍යාලවල විවිධ වියදම් සඳහා යොදාගෙන තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව කොමිෂන් සභාවේ හා විශ්වවිද්‍යාල 6 ක සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.1,198,916 ක් හා රු.266,413,842 ක් ලෙස "Bond violation" අරමුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) නියැදි පරීක්ෂණයකට අනුව විශ්වවිද්‍යාල 4 ක ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.189,232,994 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදය 7.6 සහ 7.8 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා රු.3,855,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එයින් ප්‍රාග්ධන වැඩ 03 ක් සඳහා රු.1,750,000,000 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට 2016 දෙසැම්බර් 29 දින ලබා දී තිබුණු රු.900,000,000 න් රු.409,054,248 ක මුදලක් ඉතිරි වී තිබුණි.

(ආ) විවිධ වර්ගයේ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කොමිෂන් සභාව විසින් රු.23,899,632 කින් යුත් අරමුදල් ගිණුම් 30 ක් පවත්වා ගෙන ගොස් තිබූ නමුත් ශිෂ්‍යත්ව කටයුතු සඳහා අරමුදල් ගිණුම් 05 ක රු.15,336,221 ක් පමණක් උපයෝගී කර ගෙන තිබුණි. උපයෝජනය නොකළ අරමුදල් ගිණුම් 25 හි රු.8,563,411 ක ශේෂයක් පැවතුන අතර එම මුදල් බැංකු ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

කොමිෂන් සභාවේ සිවුමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.59,842,180 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2015 ජුනි 22 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව වැඩ නිම කළ යුතු දිනය 2016 සැප්තැම්බර් 14 දින වුවද එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 35 ක් විය. කොන්ත්‍රාත්කරුගේ 2016 අගෝස්තු 10 දිනැති

ඉල්ලීමක් සලකා බලා කොමිෂන් සභාව විසින් කොන්ත්‍රාත් කාලය 2017 ජනවාරි 12 දක්වා ද, අනතුරුව 2017 අප්‍රේල් 10 දක්වාද දීර්ඝ කර තිබුණ ද 2017 ජුනි 20 අවසන් වන විටත් ගොඩනැගිල්ලේ වැඩ නිම කර නොමැති බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 318 ක්ද තත්‍ය කාර්ය මණ්ඩලය 259 ක්ද වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 59 ක් විය.

(ආ) 2014 නොවැම්බර් සිට පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ සැලසුම් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කරමින් ස්ථිර නිලධාරියෙකු පත්කිරීම වෙනුවට ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හිමි වෛද්‍යවරයෙකු 2016 ඔක්තෝබර් 03 දින කාර්ය පැවරුම් පදනම මත බඳවා ගෙන භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව රු. 200,000 බැගින් මාසික දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය ශක්තිමත් කිරීම සඳහා වූ සම්බන්ධීකාර තනතුරක් සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.200,000 ක මාසික දීමනාවක් මත 2016 ඔක්තෝබර් 03 දින නිළධාරිණියක් බඳවා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

ප්‍රසම්පාදන සැලැස්ම

කොමිෂන් සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථාන 9 ක ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීමට රු. මිලියන 3.5 ක් හා මානව සම්පත් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට රු.මිලියන 3 ක් ලෙස 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එම කාර්යයන් ආරම්භ කර නොතිබුණු අතර 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට එම කාර්යයන් නැවත ඇතුළත් කර තිබුණි.

ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

ප්‍රසම්පාදන සැලැස්ම

---

කොමිෂන් සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථාන 9 ක ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීමට රු. මිලියන 3.5 ක් හා මානව සම්පත් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට රු.මිලියන 3 ක් ලෙස 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එම කාර්යයන් ආරම්භ කර නොතිබුණු අතර 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට එම කාර්යයන් නැවත ඇතුළත් කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සම්බන්ධයෙන් වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අරමුදල් පාලනය | අරමුදල් නිසි පරිදි උපයෝජනය කර නොතිබීම. |
| (ආ) මූල්‍ය පාලනය | කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ණය මුදල් සහ අවකරණ ඇතුළත් කරන ලද ණය ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබීම. |
| (ඇ) ව්‍යාපෘති පාලනය | ප්‍රසම්පාදන සැලසුම් නිසි පරිදි සකස් නොකිරීම, අදාල ඉලක්ක ලබා කර නොගැනීම හා ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාදයන් පැවතීම. |
| (ඈ) විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම | වර්තමානයට ගැළපෙන පරිදි පාඨමාලා හඳුන්වා නොදීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 (5) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 1. <u>සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම</u> | කොමිෂන් සභාවේ උප සභාපති, සභාපති ධූරය දරමින් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධූරය දරමින් විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරමින් විශ්වවිද්‍යාල පනතට අනුකූල නොවන පරිදි ඇපයෙන් සීමා සහිත සමාගමක් ලෙස ලංකා එඩියුකේෂන් ඇන්ඩ් රිසර්ච් නෙට්වර්ක්ස් සමාගම 2009 ජුනි 25 දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි. එම සමාගම විසින් උසස් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දී තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ<br><br>සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් කිරීම නිර්දේශ කර ඇත්තේ ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 24 මගින් බවත් එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2011 මාර්තු 01 දිනැති මුදල් චක්‍රලේඛ අංක 3/2011 අනුව රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කරනු ලබන බැවින්, සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු හෙළිදරව් කිරීමට කටයුතු කර නැත. එහෙත්, විගණන නිර්දේශයක් ලෙස 2017 වසරේ සිට ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | එකඟ වේ<br><br>විගණන නිර්දේශයක් ලෙස 2017 වසරේ සිට සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ඇති ගණුදෙනු යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. |

<table>
<tr><th>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම</th><th>විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු</th><th>විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ</th><th>යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය</th></tr>
<tr><td>2.2.2 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u></td><td>කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් නිකුත් කරනු ලබන ණය මුදල් සහ මාසික අවකරණ ඇතුලත් කර ණය ලේඛනයක් විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව රු. 1,958,127 ක් වූ සේවක ණය ශේෂවල එකතුව අවකරණ ලේඛනයේ ශේෂය සමඟ සැසඳීමේදී රු. 1,109,059 ක වෙනසක් නිරීක්ෂණය විය.</td><td>එකඟ නොවේ.<br><br>මූල්‍ය ප්‍රකාශන වල සේවක ණය ශේෂයන්හි සහ උප ලේඛණවල ශේෂයන් අතර වෙනසට හේතු පහතින් පැහැදිලි කොට ඇත.<br>
<table>
<tr><th>සේවක අංකය</th><th>උපලේඛනය අනුව වටිනාකම 2016.12.31</th><th>සේවක ණය ලේඛනය අනුව වටිනාකම</th><th>පැහැදිලි කිරීම</th></tr>
<tr><td>157</td><td>250,000.00</td><td>134,108.26</td><td rowspan="11">උපලේඛනය අනුව, ණය ශේෂය හා සේවක ණය ලේඛනය අනුව, ණය ශේෂය නිවැරදිව සැසඳේ.</td></tr>
<tr><td>363</td><td>243,450.00</td><td>30,591.50</td></tr>
<tr><td>417</td><td>250,000.00</td><td>137,499.91</td></tr>
<tr><td>432</td><td>210,250.00</td><td>123,339.94</td></tr>
<tr><td>489</td><td>171,870.00</td><td>--</td></tr>
<tr><td>518</td><td>250,000.00</td><td>16,000.13</td></tr>
<tr><td>538</td><td>193,690.00</td><td>--</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td>417</td><td>10,200.00</td><td>--</td></tr>
<tr><td>417</td><td>30,000.00</td><td>--</td></tr>
<tr><td>417</td><td>120,000.00</td><td>--</td></tr>
<tr><td>216</td><td>(-927)</td><td>191,666.62</td><td></td></tr>
<tr><td>239</td><td>208,333.31</td><td>207,362.51</td><td>2016 සැප්තැම්බර් මස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වැටුප්</td></tr>
</table></td><td>එකඟ නොවේ.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිරතුරුවම සේවක ණය ශේෂයන් සහ උපලේඛනවල ශේෂයන් සැසඳීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන වලට ගනු ලැබේ.</td></tr>
</table>

| මූලාශ්‍ර ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | | | | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|---|---|---|
| | | | | | සකස් කිරීම සඳහා නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දෙන ලදී. 2016 ඔක්තෝබර් මස මෙම නව මෘදුකාංගය හරහා ආරම්භක ශේෂය ඉදිරියට රැගෙන ඒමේදී පද්ධති දෝෂයක් හේතුවෙන් මෙම වෙනස පැන නැගී ඇති අතර. මේ වන විට ඉහත වරද ද නිවැරදි කර ඇත. | |
| | | 41 | 731.00 | -- | සේවකයෙකු විශ්‍රාම ගන්නා විට විශ්‍රාම ගිය මාසයට පසු මාසයේ සිට එම සේවකයාගේ නම වැටුප් පද්ධතියෙන් ඉවත් කරනු ලබයි. . ඒ අනුව සේවක ණය ලේඛනයෙන් විගණන විමසුමෙ සඳහන් නම 2016 | |
| | | | 11,000.00 | -- | | |

| මූලාශ්‍ර ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | | | | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|---|---|---|
| | | | | | නොවැම්බර් මස සිට ඉවත් කර ඇත. එහෙත්, ස්ථිර ණය ලේඛනයේ මෙම සේවක ණය සටහන් කොට ඇත. ඒ අනුව, මෙම සේවකයාගේ ණය මුදල පියවීමෙන් පසු පමණක් සේවක ණය ලේඛනයෙන් අදාළ ශේෂය ඉවත් කරනු ලැබේ. | |
| | | 432 | 10,200.00 | 8,500.00 | උපලේඛනය අනුව වටිනාකම සහ සේවක ණය ලේඛණය අනුව වටිනාකම නිවැරදිව සැසඳේ. | |
| | | 393 | (170) | -- <br> -- | 2016 සැප්තැම්බර් මස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වැටුප් සකස් කිරීම සඳහා නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දෙන | |

| මූලාා ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | | 375 \| (500) \| \| ලදී. 2016 ඔක්තෝබර් මස මෙම නව මෘදුකාංගය හරහා ආරම්භක ශේෂය ඉදිරියට රැගෙන ඒමේදී පද්ධති දෝෂයක් හේතුවෙන් මෙම වෙනස පැන නැගී ඇති අතර. මෙ වන විට එම වරද ද නිවැරදි කර ඇත. | |
| 2.3 <u>ලැබිය යුතු ගිණුම්</u> | 2011 වර්ෂයේදී රේබීය අමාත්‍යාංශය වෙනුවෙන් දරන ලද එකතුව රු. 893,271 ක වියදම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර එය අඛණ්ඩව අත්තිකාරම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. | එකඟ වේ.<br><br>රේබීය අමාත්‍යාංශයෙන් මෙම මුදල නිරවුල් කරන ලෙස ඉල්ලීම් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධව නිරන්තර පසුවිපරම් කරනු ලැබේ. | එකඟ වේ.<br><br>රේබීය අමාත්‍යාංශයෙන් මෙම මුදල නිරවුල් කරන ලෙස ඉල්ලීම් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධව නිරන්තර පසුවිපරම් කරනු ලැබේ. |
| 2.4 <u>නීති, රීති, රෙගුලාසි</u> සහ | | | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| <u>කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u> | 2015 ජූලි 14 දිනැති අංක 04/2015, දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනි ලෙස තරඟකාරී ආයතන වලින් මිල ගණන් කැඳවීමකින් තොරව රක්ෂණ ආයතනයක් තෝරා ගෙන සමාලෝචිත වර්ෂයේදී වාහන 17 ක් සඳහා 2014 වර්ෂයේ වාහනවල වෙළඳපල වටිනාකම පදනම් කරගෙන රක්ෂණ ආවරණ ලබාගෙන රු. 1,317,405 ක් රක්ෂණ වාරික ලෙස ගෙවා තිබුණි. | මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රජය සතු ආයතන වෙතින් තරගකාරී මිල ගණන් කැඳවා මෝටර් රථ රක්ෂණය කිරීමට කටයුතු කර ඇත. | කොමිෂන් සභාව විසින් තරගකාරී මිළ ගණන් කැඳවා මෝටර් රථ රක්ෂණය කිරීමට කටයුතු කර ඇත. |
| 3 <u>මූල්‍ය සමාලෝචනය</u> | | | |
| 3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u> | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 16,958,489 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.43,081,432 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 26,122,943 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වැටුප් හා වේතන සහ සේවක ප්‍රතිලාභ වියදම් රු. 27,530,214 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | එකඟ නොවේ<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ථ වියදම රු. 2,340,590,721 කි. එම වියදමින් රු. 2,300,145,995 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වශයෙන් ලැබුන අතර ඉතිරි රු. 40.447,726 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපයන ලද ආදායමෙන් පියවන ලදී. | එකඟ නොවේ<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ථ වියදම රු. 2,340,590,721 කි. එම වියදමින් රු. 2,300,145,995 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වශයෙන් ලැබුන අතර ඉතිරි රු. 40.447,726 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපයන ලද ආදායමෙන් පියවන ලදී. |
| | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු. 17,835,677 ක අතිරික්තය 2016 වර්ෂය දක්වා විචලනය වෙමින් පැවතුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 171,093,830 ක් වූ ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ සුළු වශයෙන් අඩු වී තිබුණද 2014 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු. 235,124,107 ක් වී තිබුණි. | මේ හේතුව මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපයන ආදායමෙන් ලද අතිරික්තය 60% කින් අඩුවිය. එය මූල්‍ය තත්වයේ පිරිහීමක් නොව රාජ්‍ය වියදම පියවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායකත්වය වැඩි වීමකි. | මේ හේතුව මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපයන ආදායමෙන් ලද අතිරික්තය 60% කින් අඩුවිය. එය මූල්‍ය තත්වයේ පිරිහීමක් නොව රාජ්‍ය වියදම පියවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායකත්වය වැඩි වීමකි. |
| 3.2 <u>ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි</u> | | | |

| මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ වල හා අනෙකුත් ආයතන වල නෛතික සිද්ධීන් 54 ක් විභාග වෙමින් පැවති අතර, එයින් 30 ක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කළ ඒවා විය. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. |
| 4. <u>මෙහෙයුම් සමාලෝචනය</u><br>4.1 <u>කාර්ය සාධනය</u> | | | |
| | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල්, උසස් අධ්‍යාපන ආයතන වලට බෙදා වෙන් කර දීම සහ එම උසස් අධ්‍යාපන ආයතන විසින් කරනු ලබන වියදම් පාලනය කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය තත්ත්වයන් පවත්වා ගැනීම, උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය විධිමත් කිරීම, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ශිෂ්‍යයන් ඇතුල් කිරීම විධිමත් කිරීම කොමිෂන් සභාවේ අරමුණු වේ. | | |
| (අ) <u>විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කර ගැනීම</u> | එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |

| මූලාශ්‍ර ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරීත්වය |
|---|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාල වලට දේශීය සිසුන් ඇතුලත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු | පසුගිය වර්ෂ 04 තුළ විශ්වවිද්‍යාල වලට තෝරාගත් සිසුන් සංඛ්‍යාව සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණයට අනුව 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂ දක්වා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාල වලට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 15% සිට 18% දක්වා වැඩි වී තිබුණි. | නිරීක්ෂණ සමග එකඟ වේ. | නිරීක්ෂණ සමග එකඟ වේ. |
| | i. කොමිෂන් සභාව විසින් කොළඹ, කැළණිය, ශ්‍රී ජයවර්ධනපුර වැනි ප්‍රධාන විශ්වවිද්‍යාල වල මෙන්ම අනෙකුත් විශ්වවිද්‍යාල වල පවත්වාගෙන යනු ලබන භෞතික විද්‍යාව, කෘෂි තාක්ෂණය සහ කළමණාකරණය, ආහාර විද්‍යාව හා තාක්ෂණය, පරිගණක විද්‍යාව, ජෛව විද්‍යාව වැනි පාඨමාලා සඳහා සුදුසුකම් සපුරන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම නිසා ඇති වන සිසු පුරප්පාඩු සඳහා තවදුරටත් ඉල්ලුම් කර ඇති සිසුන් අතුරින් නැවත බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා පිළිවෙලින් 1,794 ක් සහ 1,695 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව, විශ්වවිද්‍යාල වලට ඇතුළත් වීමේ සුදුසුකම් ලබා ඇති සිසුන් විශාල ප්‍රමාණයකට විශ්වවිද්‍යාල වලට ඇතුළත් වීමේ වරම් අහිමි කර තිබුණු බව නිරීක්ෂණය විය. | 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා ඇතිවූ මුල් පුරප්පාඩු සංඛ්‍යාව 1695 ක් වුවත්, ඇතැම් පීඨවල පීඨාධිපතිවරුන් විසින් පුරප්පාඩු පිරවීමේ තුන්වන අදියරයෙන් පසුව සිය පීඨවල අධ්‍යයන කටයුතු ආරම්භ වී ඇති බැවින් තව දුරටත් සිසුන් අනුයුක්ත නොකරන ලෙස දන්වන ලද පාඨමාලාවන්ට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව 705ක් වේ. ඒ අනුව, සත්‍ය වශයෙන්ම සිසුන් තෝරාගෙන ඇතත් සිසුන් විසින් ප්‍රවේශය භාර නොගැනීම නිසා ඇතිවූ පුරප්පාඩු සංඛ්‍යාව 990 ක් ලෙස දැක්විය හැකිය.<br><br>තවද, අධ්‍යයන වර්ෂ තුනක් සඳහා සිදුකරන ලද පුරප්පාඩු පිරවීමේ වට ගණන පහත දැක්වේ.<br><br>2013/2014 පුරප්පාඩු වට 6<br>2014/2015 පුරප්පාඩු වට 5<br>2015/2016 පුරප්පාඩු වට 7 | මෙහි සඳහන් වන 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා වන පුරප්පාඩු ශිෂ්‍ය සංඛ්‍යාව 1695ක් ලෙස නිවැරදි විය යුතු අතර ඇතැම් පීඨවල පීඨාධිපතිවරුන් විසින් පුරප්පාඩු පිරවීමේ තුන්වන අදියරයෙන් පසුව සිය පීඨවල අධ්‍යයන කටයුතු ආරම්භ වී ඇති බැවින් තව දුරටත් සිසුන් අනුයුක්ත නොකරන ලෙස දන්වන ලද පාඨමාලාවන්ට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව 705ක් වේ. ඒ අනුව, සත්‍ය වශයෙන්ම සිසුන් තෝරාගෙන ඇතත් සිසුන් විසින් ප්‍රවේශය භාර නොගැනීම නිසා ඇතිවූ පුරප්පාඩු සංඛ්‍යාව 990 ක් ලෙස දැක්විය හැකිය.<br><br>තවද, අධ්‍යයන වර්ෂ තුනක් සඳහා සිදුකරන ලද පුරප්පාඩු පිරවීමේ වට ගණන පහත දැක්වේ.<br><br>2013/2014 පුරප්පාඩු වට 6<br>2014/2015 පුරප්පාඩු වට 5<br>2015/2016 පුරප්පාඩු වට 7 |
| | ii 2015/2016 අධ්‍යයන වර්ෂයේදී පැවති පුරප්පාඩු 1,695 න් පුරප්පාඩු 990 ක් වෙනුවෙන් විශ්වවිද්‍යාලවල විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන් වෙත ලියාපදිංචි වන ලෙස දන්වා යවා තිබූ නමුත්, ඇතැම් පාඨමාලාවල පවතින යල්පැන ගිය හා ගතානුගතිකභාවය නිසා විශ්වවිද්‍යාල ප්‍රවේශය භාර නොගැනීම නිසා ඇති වූ පුරප්පාඩු බව නිරීක්ෂණය විය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සෑම විටම සිසුන් ලියාපදිංචි නොවීම නිසා ඇතිවන පුරප්පාඩු සඳහා පුරප්පාඩු පිරවීම යටතේ සිසුන් අනුයුක්ත කිරීම කොතෙක් සිදුකළත් අනුයුක්ත කරන ලද එම සිසුන් අදාළ පාඨමාලා භාර නොගැනීම නිසා මෙම තත්වය ඇතිවේ. තවද ඉහත සඳහන් කළ පරිදි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සෑම විටම සිසුන් ලියාපදිංචි නොවීම නිසා ඇතිවන පුරප්පාඩු සඳහා පුරප්පාඩු පිරවීම යටතේ සිසුන් අනුයුක්ත කිරීම කොතෙක් සිදුකළත් අනුයුක්ත කරන ලද එම සිසුන් අදාළ පාඨමාලා භාර නොගැනීම නිසා මෙම |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | එසේම පීඨාධිපතිවරුන් විසින් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව සිසුන් අනුයුක්ත නොකරන ලෙසට ප්‍රතිපාදන කොමිෂම වෙත දක්වා තිබීම හේතුවෙන් පුරප්පාඩු පැන නැගී ඇති බව ද නිරීක්ෂණය විය. | ඇතැම් පීඨවල පීඨාධිපතිවරුන් අධ්‍යයන කටයුතු ආරම්භ වී ඇති බැවින් එම අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් අනුයුක්ත කිරීම නවත්වන ලෙස දැන්වූ විට අදාළ පුරප්පාඩු සඳහා සිසුන් අනුයුක්ත කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. මෙලෙස සියළු පීඨ වල ඇති පුරප්පාඩු එකවර පුරවා අවසන් කිරීමට නොහැකි වීමට ප්‍රධාන හේතුවක් වන්නේ සියළුම පීඨවල අධ්‍යයන කටයුතු එකම දිනයක ආරම්භ නොකිරීමයි. මේ හේතුවෙන්, කලින් ආරම්භ කරන පීඨයන්හි වැඩි පුරප්පාඩු වට සංඛ්‍යාවක් පිරවීමට හැකියාවක් නොලැබේ.<br><br>මෙම තත්වයට තවත් ප්‍රධාන හේතුවක් ලෙස එම පාඨමාලාවන් සඳහා සිසුන්ගේ ඉල්ලුම අඩුවීමද දැක්විය හැක. මේ හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම පීඨවල පීඨාධිපතිවරුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවලදී එම පාඨමාලාවන් සඳහා සිසුන් ආකර්ෂණය කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස පීඨාධිපතිවරුන් දැනුවත් කරන ලදී.<br><br>මෙයට හොඳම නිදසුනක් ලෙස 2015/2016 වර්ෂයේ අලුතින් හඳුන්වාදෙනු ලැබූ තාක්ෂණවේදය පාඨමාලා සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ පුරප්පාඩු 2ක් පමණක් පැවතීම දැක්විය හැකිය. ඒ අනුව, 2015/2016 වර්ෂයේ එම පාඨමාලාව සඳහා එක් පුරප්පාඩු පිරවීමේ වටයක් පමණක් සිදුකර සියළු සිසුන් අනුයුක්ත කර අවසන් කර ඇති අතර මීට අවුරුදු ගණනාවකට පෙර හඳුන්වාදුන් විද්‍යා සහ කෘෂිකර්ම පාඨමාලා සඳහා පුරප්පාඩු වට කිහිපයක් යටතේ සිසුන් අනුයුක්ත කලද සිසුන් විසින් මෙම ගතානුගතික පාඨමාලා ප්‍රතික්ෂේප කරන තත්වයක් පෙන්නුම් කරන බැවින් පිරවීමට නොහැකිව ඉතිරිවන | තත්වය ඇතිවේ. තවද ඉහත සඳහන් කළ පරිදි ඇතැම් පීඨවල පීඨාධිපතිවරුන් අධ්‍යයන කටයුතු ආරම්භ වී ඇති බැවින් එම අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් අනුයුක්ත කිරීම නවත්වන ලෙස දැන්වූ විට අදාළ පුරප්පාඩු සඳහා සිසුන් අනුයුක්ත කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. මෙලෙස සියළු පීඨ වල ඇති පුරප්පාඩු එකවර පුරවා අවසන් කිරීමට නොහැකි වීමට ප්‍රධාන හේතුවක් වන්නේ සියළුම පීඨවල අධ්‍යයන කටයුතු එකම දිනයක ආරම්භ නොකිරීමයි. මේ හේතුවෙන්, කලින් ආරම්භ කරන පීඨයන්හි වැඩි පුරප්පාඩු වට සංඛ්‍යාවක් පිරවීමට හැකියාවක් නොලැබේ.<br><br>මෙම තත්වයට තවත් ප්‍රධාන හේතුවක් ලෙස එම පාඨමාලාවන් සඳහා සිසුන්ගේ ඉල්ලුම අඩුවීමද දැක්විය හැක. මේ හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම පීඨවල පීඨාධිපතිවරුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවලදී එම පාඨමාලාවන් සඳහා සිසුන් ආකර්ෂණය කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස පීඨාධිපතිවරුන් දැනුවත් කරන ලදී.<br><br>මෙයට හොඳම නිදසුනක් ලෙස 2015/2016 වර්ෂයේ අලුතින් හඳුන්වාදෙනු ලැබූ තාක්ෂණවේදය පාඨමාලා සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ පුරප්පාඩු 2ක් පමණක් පැවතීම දැක්විය හැකිය. ඒ අනුව, 2015/2016 වර්ෂයේ එම පාඨමාලාව සඳහා එක් පුරප්පාඩු පිරවීමේ වටයක් පමණක් සිදුකර සියළු සිසුන් අනුයුක්ත කර අවසන් කර ඇති අතර මීට අවුරුදු ගණනාවකට පෙර හඳුන්වාදුන් විද්‍යා සහ කෘෂිකර්ම පාඨමාලා සඳහා |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| (ඇ) විශ්වවිද්‍යාල වලට විදේශීය සිසුන් ඇතුළත්කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු | | පුරප්පාඩු එම පාඨමාලාවල පවතී.<br><br>මෙම තත්වය ගැන විශේෂ අවධානයක් යොමු කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට සියළුම විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු 2017 වර්ෂයේ ඔක්තෝබර් 1 දින ආරම්භ කරන ලෙස සියළුම විශ්වවිද්‍යාලවල පීඨාධිපතිවරුන්ට දන්වා යවන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පුරප්පාඩු පිරවීමේ වට කිහිපයක් යටතේ සිසුන් තෝරා අවසන් කර මෙම වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට විශ්වවිද්‍යාල වෙත ලියාපදිංචි සිසුන්ගේ අවසන් නාමලේඛන යැවීමට කටයුතු කර ගෙන යනු ලබයි.<br><br>එසේ සියලුම විශ්වවිද්‍යාල 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා 2017 ඔක්තෝබර් 1 වැනි දින ආරම්භ කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ප්‍රවේශවීමට අවශ්‍ය අවම කඩයිම් ලකුණු 2015/2016 අධ්‍යයන වර්ෂයට වඩා මාස 3 කට පෙර නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩු වට කිහිපයක් යටතේ සිසුන් අනුයුක්ත කලද සිසුන් විසින් මෙම ගතානුගතික පාඨමාලා ප්‍රතික්ෂේප කරන තත්වයක් පෙන්නුම් කරන බැවින් පිරවීමට නොහැකිව ඉතිරිවන පුරප්පාඩු එම පාඨමාලාවල පවතී.<br><br>මෙම තත්වය ගැන විශේෂ අවධානයක් යොමු කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට සියළුම විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු 2017 වර්ෂයේ ඔක්තෝබර් 1 දින ආරම්භ කරන ලෙස සියළුම විශ්වවිද්‍යාලවල පීඨාධිපතිවරුන්ට කරන ලද දැනුම් දීමට අනුව 60% පමණ පීඨ 2017 ඔක්තෝබර් මස 01 දින ආරම්භ කර ඇත. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පුරප්පාඩු පිරවීමේ වට කිහිපයක් යටතේ සිසුන් තෝරා අවසන් කර මෙම වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට විශ්වවිද්‍යාල වෙත ලියාපදිංචි සිසුන්ගේ අවසන් නාමලේඛන යැවීමට කටයුතු කර ඇත.<br><br>එසේ සියලුම විශ්වවිද්‍යාල 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා 2017 ඔක්තෝබර් 1 වැනි දින ආරම්භ කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ප්‍රවේශවීමට අවශ්‍ය අවම කඩයිම් ලකුණු 2015/2016 අධ්‍යයන වර්ෂයට වඩා මාස 3 කට පෙර නිකුත් කර ඇත. මෙය තවදුරටත් කාර්යක්ෂම කිරීමේ පියවරක් ලෙස 2017/2018 අධ්‍යයන වර්ෂ සඳහා අයදුම්පත් කැඳවීම 2017 උසස් පෙළ ප්‍රතිඵල නිකුත් කර සතියක් ඇතුළත සිදු කරන ලදී. |

<table>
<tr><th>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම</th><th>විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු</th><th>විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ</th><th>යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරීත්වය</th></tr>
<tr><td></td><td>i. 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකාවේ විශ්වවිද්‍යාල වලට විදේශීය සිසුන් බඳවා ගැනීමට තීරණය කර තිබුණද පසුගිය අධ්‍යයන වර්ෂ තුනක් සඳහා විශ්වවිද්‍යාලවලට විදේශ සිසුන් බඳවා ගැනීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව සහ බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව අතර පහත සඳහන් විචලතාවයන් පැවතුණි.<br>
<table>
<tr><th>අධ්‍යයන වර්ෂය</th><th>යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව</th><th>බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>2013/2014</td><td>62</td><td>41</td><td>21</td></tr>
<tr><td>2014/2015</td><td>36</td><td>27</td><td>09</td></tr>
<tr><td>2015/2016</td><td>61</td><td>17</td><td>44</td></tr>
</table></td><td>(i) 2013/2014, 2014/2015 සහ 2015/2016 යන අධ්‍යයන වර්ෂවල ඇතැම් පාඨමාලා සඳහා යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට පහත කරුණු හේතුවී ඇත.<br><br>1. යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව අදාළ පාඨමාලා සඳහා අයදුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම.<br>උදාහරණයක් ලෙස 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා කලා පාඨමාලාවට සිසුන් 24ක් බඳවා ගැනීමට යෝජනා වී තිබුණද එම පාඨමාලාවට අයදුම් කර ඇත්තේ සිසුන් 11ක් පමණි.<br><br>2. අයදුම්කරන ලද සිසුන් අතරින් අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන්ගේ අයදුම්පත් තේරීම් කමිටු සඳහා යොමු කිරීමට පෙරම ප්‍රතික්ෂේප කරනු ලැබීම.<br><br>3. මීට අමතරව, 2016.10 06 වන දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 950 වන සභා වාරයේදී තීරණය කරනු ලැබූ පරිදි කිසියම් සිසුවෙකු මෙම ප්‍රවේශය යටතේ තේරී පත්වීමට නම් සාමාන්‍ය ප්‍රවේශය යටතේ විශ්වවිද්‍යාලවල අදාළ පාඨමාලාවට තේරී පත්වූ දේශීය සිසුන් අතුරින් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තොරාගත් පළමු 40% හි අවසාන සිසුවා අදාළ විෂයන් 3ට ලබා ඇති ශ්‍රේණිවලට සමාන හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුය. ඒ අනුව, අදාළ සාධන මට්ටම් කරා ලඟාවී නොමැති සිසුන්ගේ අයදුම්පත්ද ප්‍රතික්ෂේප කිරීමට සිදුවිය.</td><td>(i) 2013/2014, 2014/2015 සහ 2015/2016 යන අධ්‍යයන වර්ෂවල ඇතැම් පාඨමාලා සඳහා යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට පහත කරුණු හේතුවී ඇත.<br><br>1.යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව අදාළ පාඨමාලා සඳහා අයදුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම.<br>උදාහරණයක් ලෙස 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා කලා පාඨමාලාවට සිසුන් 24ක් බඳවා ගැනීමට යෝජනා වී තිබුණද එම පාඨමාලාවට අයදුම් කර ඇත්තේ සිසුන් 11ක් පමණි.<br><br>2.අයදුම්කරන ලද සිසුන් අතරින් අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන්ගේ අයදුම්පත් තේරීම් කමිටු සඳහා යොමු කිරීමට පෙරම ප්‍රතික්ෂේප කරනු ලැබීම.<br><br>3. මීට අමතරව, 2016.10 06 වන දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 950 වන සභා වාරයේදී තීරණය කරනු ලැබූ පරිදි කිසියම් සිසුවෙකු මෙම ප්‍රවේශය යටතේ තේරී පත්වීමට නම් සාමාන්‍ය ප්‍රවේශය යටතේ විශ්වවිද්‍යාලවල අදාළ පාඨමාලාවට තේරී පත්වූ දේශීය සිසුන් අතුරින් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තොරාගත් පළමු 40% හි අවසාන සිසුවා අදාළ විෂයන් 3ට ලබා ඇති ශ්‍රේණිවලට සමාන හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුය. ඒ අනුව, අදාළ සාධන මට්ටම් කරා ලඟාවී නොමැති සිසුන්ගේ අයදුම්පත්ද ප්‍රතික්ෂේප කිරීමට සිදුවිය.</td></tr>
</table>

| මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | ii. දේශීය විශ්වවිද්‍යාල සඳහා තෝරාගනු ලබන විදේශීය සිසුන් කොළඹින් බැහැර විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් නොවීමේ ප්‍රවණතාවය මෙම පුරප්පාඩු කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණු අතර, එම විශ්වවිද්‍යාල තත්වය උසස් කිරීමත් සමඟ ප්‍රවාහන පහසුකම්, නවාතැන්, ආහාර පාන හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් ද ජාත්‍යන්තර තත්වයට ගැලපෙන ලෙස වැඩිදියුණු නොවීම මේ සඳහා හේතු වී ඇති බව ද විගණනයේදී නිරීක්ෂණය විය. | කැබිනට් තීරණයට අනුකූලව, මුදල් ගෙවීමේ පදනම මත විදේශීය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික සිසුන් සහ විදේශීය සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් කිරීමට පහත ප්‍රමුඛතා අනුපිළිවෙලට අනුව සිදු කරනු ලැබේ.<br><br>a) විදේශ රටවල සේවය කළ/කරන ශ්‍රී ලාංකික රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ දරුවන්<br>b) ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ දරුවන්<br>c) සාක් රටවල දරුවන්<br>d) ඉහත (a) යටතට අයත් නොවූ අනෙකුත් ශ්‍රී ලාංකික දරුවන්<br>e) ඉහත (b) හෝ (c) යටතට අයත් නොවූ අනෙකුත් විදේශීය දරුවන්<br><br>එසේම, විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුව කලා පාඨමාලා හැර අනෙකුත් සෑම අධ්‍යයන පාඨමාලවක් සඳහාම අදාළ වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත පදනම්ව විශ්වවිද්‍යාල සඳහා දේශීය සිසුන් තෝරාගැනීම ද්විත්ව පදනමක් මත සිදුකෙරේ. එනම්:<br><br>යම් පාඨමාලාවක ඇති ස්ථාන සංඛ්‍යාවෙන්;<br><br>• 40% ක් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරාගනු ලැබේ.<br>• ඉතිරි 60% න් 55% ක් දිස්ත්‍රික් කුසලතා පදනම මත ද 5% ක් දුෂ්කර දිස්ත්‍රික්ක සඳහා ද තෝරාගනු ලැබේ.<br><br>ඉහත නිර්ණායක මත දේශීය සිසුන් සඳහා ස්ථාන වෙන්කරනු ලබන්නේ සෑම පාඨමාලාවකම ඇති ස්ථාන සංඛ්‍යාවෙන් විදේශීය සුදුසුකම් සහිත සිසුන් සඳහා 0.5% ක් හා අධ්‍යයන කටයුතු හැර වෙනත් ක්ෂේත්‍රයන්හි ජාතික/ජාත්‍යන්තර කුසලතා සහිත සිසුන් සඳහා 0.5% ක් වෙන් කිරීමෙන් පසුවය. මීට අමතරව වෛද්‍ය, දන්ත ශල්‍ය වෛද්‍ය හා ඉංජිනේරු විද්‍යා පාඨමාලාවල යෝජිත ස්ථාන සංඛ්‍යාවෙන් 0.5%ක් සන්නද්ධ සේවාවන්හි නියුතු නිළධාරීන් බඳවා ගැනීමට වෙන් කරනු ලැබේ. මෙම සියලු ස්ථාන වෙන් කරනු ලබන්නේ ජාතික ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුවය. | කැබිනට් තීරණයට අනුකූලව, මුදල් ගෙවීමේ පදනම මත විදේශීය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික සිසුන් සහ විදේශීය සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් කිරීමට පහත ප්‍රමුඛතා අනුපිළිවෙලට අනුව සිදු කරනු ලැබේ.<br><br>a) විදේශ රටවල සේවය කළ/කරන ශ්‍රී ලාංකික රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ දරුවන්<br>b) ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ දරුවන්<br>c) සාක් රටවල දරුවන්<br>d) ඉහත (a) යටතට අයත් නොවූ අනෙකුත් ශ්‍රී ලාංකික දරුවන්<br>e) ඉහත (b) හෝ (c) යටතට අයත් නොවූ අනෙකුත් විදේශීය දරුවන්<br>එසේම, විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුව කලා පාඨමාලා හැර අනෙකුත් සෑම අධ්‍යයන පාඨමාලවක් සඳහාම අදාළ වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත පදනම්ව විශ්වවිද්‍යාල සඳහා දේශීය සිසුන් තෝරාගැනීම ද්විත්ව පදනමක් මත සිදුකෙරේ. එනම්:<br><br>යම් පාඨමාලාවක ඇති ස්ථාන සංඛ්‍යාවෙ<br><br>• 40% ක් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරාගනු ලැබේ.<br>• ඉතිරි 60% න් 55% ක් දිස්ත්‍රික් කුසලතා පදනම මත ද 5% ක් දුෂ්කර දිස්ත්‍රික්ක සඳහා ද තෝරාගනු ලැබේ.<br><br>ඉහත නිර්ණායක මත දේශීය සිසුන් සඳහා ස්ථාන වෙන්කරනු ලබන්නේ (2014/2015 අධ්‍යයන වර්ෂයට අදාළ ප්‍රවේශ අත්පොතෙහි 3.3 ඡේදයේ සඳහන් නිර්ණායකවලට යටත්ව, සෑම පාඨමාලාවකම ඇති ස්ථාන සංඛ්‍යාවෙන් විදේශීය සුදුසුකම් සහිත සිසුන් සඳහා 0.5% ක් හා අධ්‍යයන |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
| --- | --- | --- | --- |
| | | එබැවින්, විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් නොකිරීමෙන් යම් පාඨමාලාවක 0.5% ක ස්ථාන සංඛ්‍යාවේ ඇතිවන පුරප්පාඩු වෙනත් ක්‍රමයක් අනුගමනය කරමින් පිරවීම කැබිනට් තීරණ මත පදනම් වූ මෙම ජාතික ප්‍රතිපත්තිය අනුව සිදුකළ නොහැක. එසේ ඇතිවන පුරප්පාඩු සුළු ප්‍රමාණයක් ජාතික ප්‍රතිපත්තිය මත දීප ව්‍යාප්ත කුසලතා (40%) සහ දිස්ත්‍රික් පදනම මත (60%) දිස්ත්‍රික්ක 25 අතර බෙදා සිසුන් තෝරා ගැනීම ප්‍රායෝගිකව කළ නොහැකිය.<br><br>මීට අමතරව, යම් පාඨමාලාවක ස්ථාන සංඛ්‍යාවට අමතරව බඳවා ගැනීමට නියමිත 4.5% ක ප්‍රමාණයට සරිලන පරිදි විදේශීය සුදුසුකම් සහිත සිසුන් බඳවා නොගැනීමෙන් දේශීය සිසුන් තෝරාගැනීම සඳහා බලපෑමක් ඇති නොවේ. මන්ද එය පාඨමාලාවේ යෝජිත ස්ථාන සංඛ්‍යාවට අමතර බඳවා ගැනීමක් වන බැවිනි.<br><br>තවද, ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන් හැර මෙම ප්‍රවේශය යටතේ වූ විදේශීය සුදුසුකම් සහිත සිසුන් බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවීමේ පදනම මතය. එසේම, මෙම ප්‍රවේශය යටතේ 4.5% ප්‍රමාණයට යටත්ව තෝරා ගන්නා සියලුම සිසුන්ද බඳවා ගන්නේ මුදල් ගෙවීමේ පදනම මතයි. ඒ අනුව, මෙම ප්‍රවේශය යටතේ ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන් හැර අන් කිසිදු විදෙස් සුදුසුකම් සහිත ශිෂ්‍යයෙකු නිදහස් අධ්‍යාපනය යටතේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු නොලැබේ. එසේම, එම අරමුදල් අදාළ විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් නැංවීමට සහ දේශීය හා විදේශීය සිසුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැළසීමට යොදවනු ලැබේ. | කටයුතු හැර වෙනත් ක්ෂේත්‍රයන්හි ජාතික/ජාත්‍යන්තර කුසලතා සහිත සිසුන් සඳහා 0.5% ක් වෙන් කිරීමෙන් පසුවය. මීට අමතරව වෛද්‍ය, දන්ත ශල්‍ය වෛද්‍ය හා ඉංජිනේරු විද්‍යා පාඨමාලාවල යෝජිත ස්ථාන සංඛ්‍යාවෙන් 0.5%ක් සන්නද්ධ සේවාවන්හි නියුතු නිළධාරීන් බඳවා ගැනීමට වෙන් කරනු ලැබේ. මෙම සියලු ස්ථාන වෙන් කරනු ලබන්නේ ජාතික ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුවය.<br><br>එබැවින්, විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් නොකිරීමෙන් යම් පාඨමාලාවක 0.5% ක ස්ථාන සංඛ්‍යාවේ ඇතිවන පුරප්පාඩු වෙනත් ක්‍රමයක් අනුගමනය කරමින් පිරවීම කැබිනට් තීරණ මත පදනම් වූ මෙම ජාතික ප්‍රතිපත්තිය අනුව සිදුකළ නොහැක. එසේ ඇතිවන පුරප්පාඩු සුළු ප්‍රමාණයක් ජාතික ප්‍රතිපත්තිය මත දීප ව්‍යාප්ත කුසලතා (40%) සහ දිස්ත්‍රික් පදනම මත (60%) දිස්ත්‍රික්ක 25 අතර බෙදා සිසුන් තෝරා ගැනීම ප්‍රායෝගිකව කළ නොහැකිය.<br><br>මීට අමතරව, යම් පාඨමාලාවක ස්ථාන සංඛ්‍යාවට අමතරව බඳවා ගැනීමට නියමිත 4.5% ක ප්‍රමාණයට සරිලන පරිදි විදේශීය සුදුසුකම් සහිත සිසුන් බඳවා නොගැනීමෙන් දේශීය සිසුන් තෝරාගැනීම සඳහා බලපෑමක් ඇති නොවේ. මන්ද එය පාඨමාලාවේ යෝජිත ස්ථාන සංඛ්‍යාවට අමතර බඳවා ගැනීමක් වන බැවිනි.<br><br>තවද, ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන් හැර මෙම ප්‍රවේශය යටතේ වූ විදේශීය සුදුසුකම් සහිත සිසුන් බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවීමේ පදනම මතය. එසේම, මෙම ප්‍රවේශය යටතේ |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | | | 4.5% ප්‍රමාණයට යටත්ව තෝරා ගන්නා සියලුම සිසුන්ද බඳවා ගන්නේ මුදල් ගෙවීමේ පදනම මතයි. ඒ අනුව, මෙම ප්‍රවේශය යටතේ ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන් හැර අන් කිසිදු විදෙස් සුදුසුකම් සහිත ශිෂ්‍යයෙකු නිදහස් අධ්‍යාපනය යටතේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු නොලැබේ. එසේම, එම අරමුදල් අදාළ විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් නැංවීමට සහ දේශීය හා විදේශීය සිසුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැළසීමට යොදවනු ලැබේ. |
| 4.2 <u>කළමණාකරණ ක්‍රියාකාරකම්</u> | කොමිෂන් සභාව විසින් 2015 වර්ෂයේදී පිහිටුවන ලද ස්ත්‍රී/පුරුෂ සමාජභාවයේ සමානාත්වය/සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය සහ ගුණත්වය ආරක්ෂා කිරීම පිළිබඳ සභාව වෙනුවෙන් ඉඩ පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව මාසික කුලිය රු. 150,000 ක් වූ ගොඩනැගිල්ලක් රු. 225,000 ක මාසික කුලියට වර්ෂයක් සඳහා ලබාගෙන තිබුණි. | ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/සාධාරණත්ව පිළිබඳ මධ්‍යස්ථානය පිහිටුවීම 2017 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ කාර්යයක් බැවින්, ඒ සඳහා කාර්යාල ඉඩපහසුකම් ලබා ගැනීමට ටෙන්ඩර් කැඳවන ලදී.<br><br>එහෙත්, අපේක්ෂිත පරිදි කාර්යාල ඉඩපහසුකම් සැපයීම සඳහා සැපයුම්කරුවන් ගෙන් මිළ ගණන් නොලැබුනු බැවින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ල කුලියට ගැනීමට කටයුතු කරන ලදී. ප්‍රධාන තක්සේරු කරුවන්ගේ වාර්තාවට අනුව, මාසික කුලිය රු. 150,000/- වුවත්, 2017 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැවරෙන කාර්ය භාරය ඉටුකර ගැනීමට ඇති අවශ්‍යතාවය සඳහා ඉහත ගොඩනැගිල්ල කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට තීරණය කරන ලදී. | ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/සාධාරණත්ව පිළිබඳ මධ්‍යස්ථානය පිහිටුවීම 2017 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ කාර්යයක් බැවින්, ඒ සඳහා කාර්යාල ඉඩපහසුකම ලබා ගැනීමට ටෙන්ඩර් කැඳවන ලදී.<br><br>එහෙත්, අපේක්ෂිත පරිදි කාර්යාල ඉඩපහසුකම් සැපයීම සඳහා සැපයුම්කරුවන් ගෙන් මිළ ගණන් නොලැබුනු බැවින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ල කුලියට ගැනීමට කටයුතු කරන ලදී. ප්‍රධාන තක්සේරු කරුවන්ගේ වාර්තාවට අනුව, මාසික කුලිය රු. 150,000/- වුවත්, 2017 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැවරෙන කාර්ය භාරය ඉටුකර ගැනීමට ඇති අවශ්‍යතාවය සඳහා ඉහත ගොඩනැගිල්ල කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට තීරණය කරන ලදී. කෙසේ වුවද එලෙස කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ගොඩනැගිල්ල 2017.12.22 දින සිට එහි හිමිකරු වෙත නැවත භාර දී ඇත. |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | ඇ) ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් ආචාර්යවරුන්ගෙන් අයකරගත් මුදල් විශ්වවිද්‍යාල පනතේ 10 (2) හා 99 (1) වගන්ති අනුව විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු වේ. කෙසේ වුවත්, ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ අරමුදල "Bond Violation/ Breach Fund" නමින් අරමුදලක් පිහිටුවා එම මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායම ආයතනයේ හා විශ්වවිද්‍යාල වල විවිධ වියදම් සඳහා යොදාගෙන තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව කොමිෂන් සභාවේ හා විශ්වවිද්‍යාල 6 ක සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු. 1,198,916 ක් හා රු. 226,413,842 ක් ලෙස "Bond Violation" අරමුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ආචාර්යවරුන්ගෙන් අයකර ගත් මුදල් විශ්වවිද්‍යාල පනතේ 10(2) හා 99 (1) වගන්ති අනුව, විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතුය. ඒ අනුව, ඒ ඒ විශ්වවිද්‍යාලය විසින් අරමුදලෙහි විෂය පථය වෙන්ව හඳුනාගත හැකි පරිදි විශ්වවිද්‍යාල අරමුදල යටතේ වන අරමුදලක් ලෙස ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ අරමුදලක් ලෙස ඉහත පරිදි ආචාර්යවරුන්ගෙන් අයකර ගත් මුදල් පවත්වාගෙන යනු ලැබේ.<br>2002.06.18 දිනැති මුදල් මහාභාණ්ඩාගාරයෙන් ලබාදුන් අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාල පරිපාලන හා අධ්‍යයන කටයුතු වලට අදාළව එම අරමුදල භාවිතා කරන ලදී. ඒ අනුව, 1998 අගොස්තු මස 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිකුත් කලායැයි සැලකිය නොහැකි අතර, 99 (1) වගන්තියට යටත්ව වැය විෂය හඳුනාගැනීම සඳහා වෙනම පවත්වාගෙන යන වැය ලෙජරයකි | ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ආචාර්යවරුන්ගෙන් අයකර ගත් මුදල් විශ්වවිද්‍යාල පනතේ 10(2) හා 99 (1) වගන්ති අනුව, විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතුය. ඒ අනුව, ඒ ඒ විශ්වවිද්‍යාලය විසින් අරමුදලෙහි විෂය පථය වෙන්ව හඳුනාගත හැකි පරිදි විශ්වවිද්‍යාල අරමුදල යටතේ වන අරමුදලක් ලෙස ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ අරමුදලක් ලෙස ඉහත පරිදි ආචාර්යවරුන්ගෙන් අයකර ගත් මුදල් පවත්වාගෙන යනු ලැබේ.<br>2002.06.18 දිනැති මුදල් මහාභාණ්ඩාගාරයෙන් ලබාදුන් අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාල පරිපාලන හා අධ්‍යයන කටයුතු වලට අදාළව එම අරමුදල භාවිතා කරන ලදී. ඒ අනුව, 1998 අගොස්තු මස 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිකුත් කලායැයි සැලකිය නොහැකි අතර, 99 (1) වගන්තියට යටත්ව වැය විෂය හඳුනාගැනීම සඳහා වෙනම පවත්වාගෙන යන වැය ලෙජරයකි |
| | (ඈ) නියැදි පරීක්ෂණය අනුව විශ්වවිද්‍යාල 4 ක ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් 2016 වර්ෂය අවසානයට රු.189,232,994 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදය 7.6 සහ 7.8 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් කඩ කරන ලද විශ්වවිද්‍යාල නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයෙන් V පරිච්ඡේදයේ 7.6, 7.7,7.8 උප ඡේදයන් අනුව කටයුතු කලයුතු ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් ලබා දී ඇත. එය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ක්‍රමවේදයක් සකස් කළ යුතු නොවන අතර විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට සෑම විශ්වවිද්‍යාලයක්ම බැඳී ඇත. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ආචාර්යවරුන් සමඟ ගිවිසුම් ඇතිකර ගැනීම පිළිබඳව කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920 , 9/2010 මගින් වැඩිදුර උපදෙස් ලබා දී ඇත. | ගිවිසුම් කඩ කරන ලද විශ්වවිද්‍යාල නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයෙන් V පරිච්ඡේදයේ 7.6, 7.7,7.8 උප ඡේදයන් අනුව කටයුතු කලයුතු ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් ලබා දී ඇත. එය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ක්‍රමවේදයක් සකස් කළ යුතු නොවන අතර විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට සෑම විශ්වවිද්‍යාලයක්ම බැඳී ඇත. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ආචාර්යවරුන් සමඟ |

<table>
<tr><th>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම</th><th>විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු</th><th>විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ</th><th>යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය</th></tr>
<tr><td></td><td></td><td>තවදුරටත් මෙ පිළිබඳව අවධානය යොමු කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියේදී උපකුලපති කමිටුව සමඟද සාකච්ඡා කිරීමට නියමිතය.</td><td>ගිවිසුම ඇතිකර ගැනීම පිළිබඳව කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920 , 9/2010 මගින් වැඩිදුර උපදෙස් ලබා දී ඇත. තවදුරටත් මෙ පිළිබඳව අවධානය යොමු කල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරියේදී උපකුලපති කමිටුව සමඟද සාකච්ඡා කිරීමට නියමිතය.</td></tr>
<tr><td>4.4 <u>අරමුදල් ඌන උපයෝජනය</u></td><td>(අ) භාණ්ඩාගාරය විසින් සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා රු.3,855,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර එයින් ප්‍රාග්ධන වැඩ 03 ක් සඳහා රු.1,750,000,000 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට 2016 දෙසැම්බර් මස 29 දින ලබාදී තිබුණු රු. 900,000,000 න් රු 409,054,248 ක මුදලක් ඉතිරි වී තිබුණි.</td><td>විගණන විමසුමෙහි සඳහන් ප්‍රාග්ධන වැය ශීර්ෂ 03 සඳහා මහා භාණ්ඩාගාරයෙන් පහත පරිදි ප්‍රතිපාදන ලැබී ඇත.
<table>
<tr><th>වැය ශීර්ෂය</th><th>ලැබුණු මුදල රු.මි.</th><th>මුදල් ලැබුණු දිනය</th></tr>
<tr><td>තාක්ෂණික විෂය ධාරාව</td><td>50<br>250<br>100<br>200<br>150<br>750</td><td>2016.06.23<br>2016.07.07<br>2016.10.27<br>2016.11.24<br>2016.12.29<br>2016.12.29</td></tr>
<tr><td>සේවක නිල නිවාස</td><td>150</td><td>2016.11.24</td></tr>
<tr><td>වෘත්තිය සංවිධාන මගින් පිළිගැනීමේ කටයුතු දිරිගැන්වීමේ වැඩසටහන</td><td>100</td><td>2016.11.04</td></tr>
</table>
ඉහත ලේඛනය අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් 2016.12.29 වන දින ලැබී ඇත. මෙසේ වර්ෂය අවසාන සතියේදී මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම මෙම ඌන උපයෝජනයට හේතු වී ඇත. මේ වන විට ප්‍රතිපාදන සියල්ලම අදාළ කාර්යයන් සඳහා වැය කර ඇත. කෙසේ වුවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රතිපාදන එම</td><td>විගණන විමසුමෙහි සඳහන් ප්‍රාග්ධන වැය ශීර්ෂ 03 සඳහා මහා භාණ්ඩාගාරයෙන් පහත පරිදි ප්‍රතිපාදන ලැබී ඇත.
<table>
<tr><th>වැය ශීර්ෂය</th><th>ලැබුණු මුදල රු.මි.</th><th>මුදල් ලැබුණු දිනය</th></tr>
<tr><td>තාක්ෂණික විෂය ධාරාව</td><td>50<br>250<br>100<br>200<br>150<br>750</td><td>2016.06.23<br>2016.07.07<br>2016.10.27<br>2016.11.24<br>2016.12.29<br>2016.12.29</td></tr>
<tr><td>සේවක නිල නිවාස</td><td>150</td><td>2016.11.24</td></tr>
<tr><td>වෘත්තිය සංවිධාන මගින් පිළිගැනීමේ කටයුතු දිරිගැන්වීමේ වැඩසටහන</td><td>100</td><td>2016.11.04</td></tr>
</table>
ඉහත ලේඛනය අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් 2016.12.29 වන දින ලැබී ඇත. මෙසේ වර්ෂය අවසාන සතියේදී මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම මෙම ඌන උපයෝජනයට හේතු වී ඇත. මේ වන විට ප්‍රතිපාදන සියල්ලම අදාළ කාර්යයන් සඳහා වැය කර ඇත.</td></tr>
</table>

| මූලාා ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | | වර්ෂය තුළදීම උපයෝජනය කිරීමට නිරතුරුව කටයුතු කරනු ලැබේ. | කෙසේ වුවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රතිපාදන එම වර්ෂය තුළදීම උපයෝජනය කිරීමට නිරතුරුව කටයුතු කරනු ලැබේ. |
| | (ආ) විවිධ වර්ගයේ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කොමිෂන් සභාව විසින් රු. 23,899,632 කින් යුත් අරමුදල් ගිණුම් 30 ක් පවත්වාගෙන ගොස් තිබූ නමුත්, ශිෂ්‍යත්ව කටයුතු සඳහා අරමුදල් ගිණුම් 05 ක රු. 15,336,221 ක් පමණක් උපයෝගී කර ගෙන තිබුණි. උපයෝජනය නොකළ අරමුදල් ගිණුම් 25 හි රු. 8,563,411 ක ශේෂයක් පැවතුන අතර, එම මුදල් බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | 2016.12.31 දිනට මූලාා වටිනාකම රු. 23,899,632/- ක් ව පැවති ශිෂ්‍යත්ව අරමුදල් අතුරින් 14 ක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ව අරමුදල යටතේ ශිෂ්‍යත්ව පිරනැමීම සඳහා යොදාගෙන ඇත.<br><br>මූලාා වටිනාකම රු. 16,608,026/- ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 17 න් ශිෂ්‍යත්ව අරමුදල් 14 ක් යටතේ ශිෂ්‍යත්ව පරිනමා ඇති අතර, එම අරමුදල් මේ වන විටත් ක්‍රියාත්මකව පවතී. මූලාා වටිනාකම රු.3,656,222/- වූ ඉතිරි ශිෂ්‍යත්ව අරමුදල් 03 උපයෝගී කොට ගෙන 2017 වර්ෂයේදී ශිෂ්‍යත්ව පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.<br><br>ශිෂ්‍යත්ව අරමුදල් මගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කල ද අදාල වියදම් ප්‍රතිපූරණය කරනු ලබන්නේ ඒ ඒ විශ්වවිද්‍යාල වල ඉල්ලීම මත පමණි. ඒ අනුව, 2016 වර්ෂය තුළ ඒ ඒ විශ්වවිද්‍යාල විසින් ප්‍රතිපූරණය සඳහා ඉල්ලා ඇත. රු. 972,625/- පමණක් ප්‍රතිපූරණය කොට ඇත. | 2016.12.31 දිනට මූලාා වටිනාකම රු. 23,899,632/- ක් ව පැවති ශිෂ්‍යත්ව අරමුදල් අතුරින් 14 ක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ව අරමුදල යටතේ ශිෂ්‍යත්ව පිරනැමීම සඳහා යොදාගෙන ඇත.<br><br>මූලාා වටිනාකම රු. 16,608,026/- ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 17 න් ශිෂ්‍යත්ව අරමුදල් 14 ක් යටතේ ශිෂ්‍යත්ව පරිනමා ඇති අතර, එම අරමුදල් මෙ වන විටත් ක්‍රියාත්මකව පවතී. මූලාා වටිනාකම රු.3,656,222/- වූ ඉතිරි ශිෂ්‍යත්ව අරමුදල් 03 උපයෝගී කොට ගෙන 2017 වර්ෂයේදී ශිෂ්‍යත්ව පිරිනැමීමට කටයුතු කර ඇත. |
| 4.5 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u> | | | සිවි මහල් ගොඩනැගිල්ලේ ඉදි |

| මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය | කොමිෂන් සභාවේ සිවුමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 59,842,180 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2015 ජුනි 22 දින කොන්ත්‍රාත් කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව වැඩ නිම කළ යුතු දිනය 2016 සැප්තැම්බර් 14 දින වුවද එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 35% ක් විය. කොන්ත්‍රාත්කරුගේ 2016 අගෝස්තු 10 දිනැති ඉල්ලීමක් සලකා බලා කොමිෂන් සභාව විසින් කොනත්‍රාත් කාලය 2017 ජනවාරි 12 දක්වා ද අනතුරුව 2017 අප්‍රේල් 10 දක්වා ද දීර්ඝ කර තිබුණ ද 2017 ජුනි 20 අවසන් වන විටත් ගොඩනැගිල්ලේ වැඩ නිමකර නොමැති බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙ වන විටත් සිව් මහල් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු නිම කර නැතත් එය අවසන් අදියරට පැමිණ ඇත. ඒ සඳහා ගිවිසුම් ප්‍රකාරව අදාල ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර ඇත | කිරීම් කටයුතු නිම කොට 2017.09.15 දින සිට කාර්ය මණ්ඩලය එයට අනුයුක්ත කොට ඇත. |
| | (අ) කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 318 ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 259 ක් ද වූ අතර, පුරප්පාඩු 59 ක් විය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි 2015 වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 89ක් වුවද, 2016 වර්ෂය අවසාන වන විට 59 දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත. රාජකාරි කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කර ගැනීම සඳහා නිරන්තරයෙන් ම බඳවා ගැනීම සිදු කරන අතර, වර්තමානයේ පවතින පුරප්පාඩු පිරවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.<br>• 2017 වර්ෂය තුළ කම්කරු 111 ශ්‍රේණිය සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවා ගෙන ඇත.<br>• පහත සඳහන් තනතුරු සඳහා 2017 වර්ෂය තුළ බඳවා ගැනීම් කරන ලදී.<br>o පරිගණක යෙදුම් සහකාර 111 10<br>o රියදුරු 11 ශ්‍රේණි 02<br>o පර්යේෂණ සහකාර තනතුර 01<br>o වැඩ පරීක්ෂණ 111 ශ්‍රේණිය 01<br>o පොත් තබන්නා 11- "ආ" බණ්ඩය 01<br>o වැඩසටහන් සම්පාදක/ පද්ධති විශ්ලේෂක 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි 2015 වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 89ක් වුවද, 2016 වර්ෂය අවසාන වන විට 59 දක්වා අඩුකර ගැනීමට හැකි වී ඇත. රාජකාරි කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කර ගැනීම සඳහා නිරන්තරයෙන් ම බඳවා ගැනීම සිදු කරන අතර, වර්තමානයේ පවතින පුරප්පාඩු පිරවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.<br>• 2017 වර්ෂය තුළ කම්කරු 111 ශ්‍රේණිය සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවා ගෙන ඇත.<br>• පහත සඳහන් තනතුරු සඳහා 2017 වර්ෂය තුළ බඳවා ගැනීම කරන ලදී.<br>o පරිගණක යෙදුම් සහකාර 111 10<br>o රියදුරු 11 ශ්‍රේණිය 02<br>o පර්යේෂණ සහකාර තනතුර 01<br>o වැඩ පරීක්ෂණ 111 ශ්‍රේණිය 01<br>o පොත් තබන්නා 11- "ආ" බණ්ඩය 01<br>o වැඩසටහන් සම්පාදක/ පද්ධති විශ්ලේෂක 01<br>o උපාධිධාරී භාෂා පරිවර්තක 01 |

| මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරීත්වය |
|---|---|---|---|
| | | ○ උපාධිධාරී භාෂා පරිවර්තක 01<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දිගුකාලීන සැලසුම හා අවශ්‍යතාවය සලකා බලා විධායක හා අනෙකුත් තනතුරු අනුමත කර ඇත. එහෙත්, අදාළ තනතුරු වල පුරප්පාඩු පිරවීම මධ්‍යකාලීන රාමුවක් තුළ අවශ්‍යතා ඇගයීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමෙන් පසුව පමණක් කරනු ලැබේ. | • විගණන සහකාර 11 ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කිරීමට මේ වන විට කටයුතු සම්පාදනය වෙමින් පවතී.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දිගුකාලීන සැලසුම හා අවශ්‍යතාවය සලකා බලා විධායක හා අනෙකුත් තනතුරු අනුමත කර ඇත. එහෙත්, අදාළ තනතුරු වල පුරප්පාඩු පිරවීම මධ්‍යකාලීන රාමුවක් තුළ අවශ්‍යතා ඇගයීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමෙන් පසුව පමණක් කරනු ලැබේ. |
| | (ආ) 2014 නොවැම්බර් සිට පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ සැලසුම් තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කරමින් ස්ථිර නිලධාරියෙකු පත් කිරීම වෙනුවට ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හිමි වෛද්‍යවරයෙකු 2016 ඔක්තෝබර් 03 දින කාර්ය පැවරුම් පදනම මත බඳවාගෙන භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව රු. 200,000 බැගින් මාසික දීමනාවක් ගෙවා තිබුණි. | 2017 අයවැය යෝජනා මගින් ස්ථාපිත කිරීමට යෝජිත පශ්චාත් උපාධි ආයුර්වේද ආයතනය සම්බන්ධයෙන් වන මූලික සැලසුම් සංවිධානය කිරීම හා සකස් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ/සැළසුම් යටතේ ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.<br><br>ඒ අනුව, 2017 වසරට අදාළව ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ පශ්චාත් උපාධි ආයුර්වේද ආයතනයේ කාර්ය භාරයේ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කොට වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සහිත විගණන විමසුමේ සඳහන් අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සැළසුම් අංශය වෙත කාර්ය පැවරුම් පදනම මත බඳවාගන්නා ලදී.<br><br>විශේෂයෙන් අයවැය යෝජනා මගින්ම ඉටු කිරීමට යෝජනා වූ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීමට අවශ්‍ය වූ බැවින්, ඉහත අධ්‍යක්ෂ/සැළසුම් තනතුරට කාර්ය පැවරුම් පදනම මත බඳවා ගැනීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී | අධ්‍යක්ෂ සැලසුම් වෙත කාර්ය පැවරුම් පදනම මත ලබා දී තිබූ වර්ෂයන් සඳහා වූ පත්වීම 2017 ඔක්තෝම්බර් 02 වන දින සිට නැවත දීර්ඝ නොකරන ලදී. |

| මූලාශ්‍ර ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | (ඇ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය ශක්තිමත් කිරීම සඳහා වූ සම්බන්ධීකාර තනතුරක් සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු. 200,000 ක මාසික දීමනාවක් මත 2016 ඔක්තෝබර් 03 දින නිළධාරිනියක් බඳවාගෙන තිබුණි. | විශ්වවිද්‍යාල වලට ඇතුළත් කරන සිසුන්ගේ උපාධියෙහි අදාළත්වය සහ ගුණාත්මක භාවය ඉහළ නංවා ගැනීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණය සඳහා වූ ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සඳහා විගණන විමසුමේ සඳහන් පරිදි අදාළ ආචාර්යතුමිය රු. 200,000/- ක දීමනාවක් මත කාර්ය පැවරුම් පදනම මත බඳවාගන්නා ලදී.<br><br>ඉහත (අ), (ආ) සහ (ඇ) යටතේ වූ සියළු පත්කිරීම සහ ඒ හා බැඳුනු කටයුතු හා කාර්ය භාරයන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 100 (2) වගන්තියට යටත්ව විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට එම පනතෙන් ලැබුණු බලතල මත ඉටුකර ඇත. | ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය විෂයන් සඳහා සම්බන්ධීකාරක වශයෙන් බඳවාගත් මහාචාර්ය තුමියගේ සේවය එම ව්‍යාපෘති වාර්තාව නිමවීමෙන් පසු අත්හිටුවන ලදී. |
| 5. <u>ශිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u><br><br>ප්‍රසම්පාදන සැලැස්ම | කොමිෂන් සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථාන 9 ක ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීමට රු. මිලියන 3.5 ක් හා මානව සම්පත් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට රු. මිලියන 3 ක් ලෙස 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එම කාර්යයන් ආරම්භ කර නොතිබුණු අතර, 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට එම කාර්යයන් නැවත ඇතුළත් කර තිබුණි | සිව්මහල් ගොඩනැගිල්ලේ ඉදි කිරීම කටයුතු 2015 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2016 වර්ෂයේදී නිම කිරීමට යෝජිතව තිබුන ද පහත සඳහන් කරුණු මෙම කටයුත්ත ප්‍රමාද වීමට හේතු විය.<br><br>• කොමිෂන් සභා සාමාජිකයන් ඉල්ලා අස් වී නව කොමිෂන් සභා සාමාජිකයන් පත් කර ප්‍රසම්පාදන කමිටුව පත් කර ගැනීම සඳහා 2015 පෙබරවාරි මස සිට අප්‍රේල් මාසය දක්වා කාලයක් ප්‍රමාද වීම<br><br>• ඉදි කිරීම කාල සීමාව තුළ වර්ෂාව ආදී ප්‍රායෝගික ගැටලු හේතුවෙන් ඉදි කිරීම කටයුතු ප්‍රමාද වීම<br><br>මේ වන විට ඉදි කිරීම ව්‍යාපෘති කාල සීමාව 2017 අප්‍රේල් දක්වා දීර්ඝ කෙරුනු බැවින් සිව්මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම කටයුතු 2017 ප්‍රසම්පාදන සැලැස්මටද ඇතුලත් කරන ලද බව. | 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් කල අයිතම පහට අයත් කාර්යයන් පහත සඳහන් පරිදි නිම කොට ඇත.<br><br>• සිව් මහල් ගොඩනැගිල්ලට 2017.09.15 වන දින සිට කාර්ය මණ්ඩලය අනුයුක්ත කොට ඇත.<br><br>• මුදල් දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම 2017 ජූලි මාසයේදී නිම කරන ලදී.<br><br>• පිළිගැනීමේ කවුන්ටරය ඉදිකිරීම මේ වන විට නිමකොට ඇත.<br><br>• CCTV කැමරා පද්ධතිය මේ වන විට නව ගොඩනැගිල්ලට සහ ප්‍රවේශ අංශයට සවිකොට ඇත.<br><br>• මානව සම්පත් තොරතුරු පද්ධතිය, යෝජිත කළමණාකරණ තොරතුරු |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 6. පද්ධති පාලනයන් | | මුදල් දෙපාර්තමේන්තුව හා පිළිගැනීමේ නිලධාරී කවුන්ටරය අලුත් වැඩියා කටයුතු 2015, 2016 වර්ෂ වල සිටම ඉටු කිරීමට බලාපොරොත්තු වුවද ප්‍රධාන ඉදිකිරීමේ කටයුත්තක් සිදු කෙරෙමින් පවතින බැවින් මෙම අලුත් වැඩියා කටයුතු ඊට සමගාමීව සිදු කරන විට ආයතන පරිශ්‍රය තුළ ඇති විය හැකි බාධාකාරී තත්වය සලකා බලා මුදල් දෙපාර්තමේන්තුව හා පිළිගැනීම් කවුන්ටරය අලුත් වැඩියා කිරීම අත් සිටුවන ලදී. මේ වන විට සිව්මහල් ගොඩනැගිල්ලලේ ඉදි කිරීම් කටයුතු අවසන් අදියරේ පවතින බැවින් මුදල් දෙපාර්තමේන්තුව අලුත් වැඩියා කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව, මෙම කාර්යය 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කරන ලදී.<br><br>එමෙන්ම, මහජන සම්බන්ධතා නිලධාරී කාර්යාලය වැඩි දියුණු කිරීමේ කටයුතු 2017 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර ඇත.<br><br>ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම යන අයිතමය 2015, 2016 ප්‍රසම්පාදන සැළසුම තුළ සඳහන් කර තිබුණ ද නව සිව්මහල් ගොඩනැගිල්ලද ආවරණය වන අයුරින් මෙම කටයුත්ත සිදු කළ යුතු බැවින් මෙම කටයුතු දෙක සිව්මහල් ගොඩනැගිල් ඉදි වන තෙක් කල් දමන ලදී.<br><br>නව ගොඩනැගිල්ල ඉදිකිරීම මේ වන විට අවසන් අදියරේ පවතින බැවින් ආරක්ෂක කැමරා පද්ධතිය සවි කිරීමේ කටයුත්ත 2017 ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර මිළ ගණන් කැඳවීම සිදු කර ඇත.<br><br>මානව සම්පත් මෘදුකාංගය 2016 වර්ෂයේදී ස්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් කරුවකු තෝරා ගෙන ප්‍රදානය කළ අතර එම කොන්ත්‍රාත්කරු එම කාර්යය ඉටු නොකරන ලදී. ඒ වෙනුවෙන් කොන්ත්‍රාත් කරුට කිසිදු ගෙවීමක් නොකරන ලද අතර පසු ව 2017 වර්ෂයේ දී යෝජිත කළමණාකරන තොරතුරු පද්ධති මෘදුකාංගය මගින් එම කටයුත්ත ආවරණය වන බැවින් මානව සම්පත් මෘදුකාංගය යළි ප්‍රසම්පාදනය කිරීම නතර කරන ලදී. මේ වන විට කළමණාකරන තොරතුරු පද්ධති මෘදුකාංගය සඳහා මිළ ගණන් කැඳවා ඇත. | පද්ධති මෘදුකාංගය මගින් ස්ථාපිත කිරීමට නියමිතය. කළමණාකරණ තොරතුරු පද්ධතිය සඳහා මේ වන විට මිළ ගණන් කැඳවා ඇත. |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සම්බන්ධයෙන් වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.<br><br>(අ) අරමුදල් පාලනය<br>(ආ) මූල්‍ය පාලනය<br>(ඇ) ව්‍යාපෘති පාලනය<br>(ඈ) විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීම | නිරීක්ෂණ වල දක්වා ඇති පාලන ක්ෂේත්‍ර වන අරමුදල් පාලනය, මූල්‍ය පාලනය, ව්‍යාපෘති පාලනය සහ විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුලත් කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට එකඟ වේ. | නිරීක්ෂණ වල දක්වා ඇති පාලන ක්ෂේත්‍ර වන අරමුදල් පාලනය, මූල්‍ය පාලනය, ව්‍යාපෘති පාලනය සහ විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුලත් කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට එකඟ වේ. |

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන | 2016<br>රුපියල් | 2015<br>රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන අයිතම | 5 | 56,906,793 | 157,270,759 |
| ලැබිය යුතු ආයෝජන ආදායම | 6 | 672,795,030 | 622,687,721 |
| ලැබිය යුතු දායක මුදල් | 7 | 70,847,929 | 41,178,831 |
| | | 800,549,752 | 821,137,311 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දිගුකාලීන ආයෝජන | 8 | 5,644,879,590 | 4,493,876,369 |
| | | 5,644,879,590 | 4,493,876,369 |
| මුළු වත්කම් | | 6,445,429,342 | 5,315,013,680 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ ණයහිමියෝ | 9 | 450,260 | 323,026 |
| සාමාජිකයන්ට ගෙවිය යුතු මුදල් | 10 | 6,826,347 | 3,639,071 |
| ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව | 11 | 75,924 | - |
| ගෙවිය යුතු ආදායම් බදු | 12 | 42,558,855 | 54,996,975 |
| | | 49,911,386 | 58,959,072 |
| මුළු ශුද්ධ වත්කම් | | **6,395,517,956** | **5,256,054,608** |
| සාමාජික අරමුදල හා සංචිත | | | |
| දායක අරමුදල | | 5,805,244,685 | 4,755,500,787 |
| විශ්‍රාම අරමුදල | | 198,242,140 | 151,528,918 |
| සමුච්චිත ආදායම | | 392,031,131 | 349,024,903 |
| අරමුදලේ ශුද්ධ අගය | | **6,395,517,956** | **5,256,054,608** |

අත්සන් කළේ
මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

අත්සන් කළේ
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්

අත්සන කළේ
ආර් ජ.යු රණවීර
ගණකාධිකාරී

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | සටහන | 2016 (රු.) | 2015 (රු.) |
|---|---|---|---|---|
| ආදායම | | | | |
| ආයෝජන ආදායම | | 13 | 594,737,836 | 542,857,419 |
| එකතු කළා ; | ආදායම් බදු අධි වෙන්කිරීම | | 1,498,181 | 29,273,663 |
| බදු පසු ශුද්ධ ආදායම | | | 596,236,017 | 513,583,756 |
| අඩු කළා: | **වියදම්** | | | |
| | විශ්‍රාම අරමුදලේ ගැලපීම | 14 | 7,323,848 | 5,554,648 |
| | මෙහෙයුම් වියදම් | 15 | 391,199 | 739,657 |
| | | | 7,715,047 | 6,294,305 |
| වියදම් අඩුකල පසු ශුද්ධ ආදායම | | | **588,520,971** | **507,289,450** |
| එකතු කළා: | ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය | | 349,024,903 | 305,275,982 |
| බෙදිය හැකි ශුද්ධ ආදායම | | | **937,545,874** | **812,565,432** |
| අඩු කළා: | සාමාජික පොළී | | | |
| | දායක අරමුදල් සඳහා පොළිය | | 529,512,380 | 449,951,283 |
| | විශ්‍රාම අරමුදල් සඳහා පොළිය | | 16,002,363 | 13,589,245 |
| | | | 545,514,743 | 463,540,528 |
| ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය | | | **392,031,131** | **349,024,903** |

# විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
## 2016දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | දායකයන්ගේ අරමුදල (රුපියල්) | විශ්‍රාමිකයන්ගේ අරමුදල (රුපියල්) | සමුච්චිත අරමුදල (රුපියල්) | එකතුව (රුපියල්) |
|---|---|---|---|---|
| **2015** දිනට ශේෂය | 3,871,077,850 | 130,105,997 | 305,275,982 | 4,306,459,829 |
| 2015 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 507,289,449 | 507,289,449 |
| පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු | - | 5,554,649 | - | 5,554,649 |
| රිසිට්පත් රහිත දායක මුදල් ලැබීම් | 147 | - | - | 147 |
| විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම් | - | 419 | - | 419 |
| සාවද්‍ය දායකත්වය මත ලැබූ පොළිය | (48,228) | - | - | (48,228) |
| පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල් | 495,386,368 | - | - | 495,386,368 |
| සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම | (26,246,280) | - | - | (26,246,280) |
| දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම් | (34,139,673) | 34,139,673 | - | - |
| වි.වි. අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම් | (480,680) | - | - | (480,680) |
| 2015 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම | - | (31,861,064) | - | (31,861,064) |
| විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය | 449,951,283 | 13,589,245 | (463,540,528) | - |
| **2015** දෙසැම්බර් 31 දිනට ශේෂය | 4,755,500,787 | 151,528,919 | 349,024,903 | 5,256,054,609 |
| 2016 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 588,520,971 | 588,520,971 |
| පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු | - | 7,323,848 | - | 7,323,848 |
| වි.වි.අර්ථසාධක අරමුදලින් ලැබීම් | 1,737,958 | - | - | 1,737,958 |
| විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම් | - | 4,754 | - | 4,754 |
| හිඟ ජීවන වියදම් දීමනාව ලැබීම් | 39,069,323 | 820,906 | | 39,890,229 |
| සාවද්‍ය දායකත්වයන් නිවැරදි කිරීම | - | - | - | - |
| පවත්නා වර්ෂයයේ දායකත්ව අරමුදල | 588,571,311 | - | - | 588,571,311 |
| සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම | (47,705,569) | - | - | (47,705,569) |
| දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම් | (61,386,620) | 61,386,620 | | - |
| වි.වි. අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම් | (54,885) | - | - | (54,885) |
| වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම 2016 | - | (38,825,270) | - | (38,825,270) |
| විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය | 529,512,380 | 16,002,363 | (545,514,743) | - |
| | 1,049,743,898 | 46,713,221 | 43,006,228 | 1,139,463,347 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,805,244,685** | **198,242,140** | **392,031,131** | **6,395,517,956** |

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2016 (රු) | 2015 (රු) |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| බදු හා වියදම් පසු ශුද්ධ ආදායම | 588,520,971 | 507,289,450 |
| එකතු කළා/ (අඩු කළා) : භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්/ අයිම්ල | 16,186,478 | 8,893,520 |
| විකුණූ භාණ්ඩාගාර බැඳුම්කර මත ලාභය/ අලාභය | (1,579,569) | (1,175,969) |
| විශ්‍රාම අරමුදලේ ගැලපීම | 7,323,848 | 5,554,648 |
| ආදායම් බදු වෙන් කිරීම් | (1,498,181) | 29,273,664 |
| | 608,953,547 | 549,835,313 |
| <u>කාරක ප්‍රාග්ධනය ක්‍රියාකාරී අරමුදල් වෙනස්වීම්</u> | | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් (වැඩිවීම )/අඩුවීම | (50,107,310) | 181,091,488 |
| විවිධ ණයහිමියන්ගේ වැඩිවීම/ (අඩුවීම) | 127,235 | 29,372 |
| **මෙහෙයුම් ක්‍රියකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්** | 558,973,471 | 730,956,172 |
| අඩුකළා: ආදායම් බදු ගෙවීම් | (10,939,939) | (48,878,995) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **548,033,532** | **682,077,178** |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර තැන්පත් වල වර්ධනය | 260,000,000 | 1,133,828,833 |
| ස්ථාවර තැන්පත් වල ආයෝජනය | (200,000,000) | - |
| කල් පිරීම්- භාණ්ඩාගාර බැඳුම්කර | - | 126,170,000 |
| විකුණුම්- භාණ්ඩාගාර බැඳුම්කර | 323,071,243 | 28,616,230 |
| ණයකර මිලදී ගැනීම් | (400,000,000) | - |
| භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම් | (1,148,681,373) | (2,244,288,390) |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **(1,165,610,130)** | **(955,673,327)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| දායක මුදල් ලැබීම් | 600,556,194 | 483,251,454 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (44,518,294) | (24,944,675) |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | (38,825,270) | (31,861,064) |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | **517,212,630** | **426,445,715** |
| මුදල් සහ මුදල් සමාන අයිතම වල ශුද්ධ වැඩිවීම | (100,363,966) | 152,849,567 |
| ආරම්භක මුදල් සහ මුදල් සමාන අයිතම | 157,270,759 | 4,421,193 |
| අවසාන මුදල් සහ මුදල් සමාන අයිතම | 56,906,793 | **157,270,759** |
| කෙටිකාලීන තැන්පතු ආයෝජන | 60,000,000 | 154,000,000 |
| බැංකු මුදල් 2323342 | (3,093,207) | 3,270,759 |
| මුදල් සහ මුදල් සමාන අයිතම් | 56,906,793 | 157,270,759 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එච්ඊඩී/ඒ/පීඑන්එෆ්/01/16    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2017 ජූනි 29 දින

ලේකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත් :

1. ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඊ/පීඑන්එෆ්/01/16   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2017 ජූනි 29 දින

ලේකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයට අදාල මුළු ආදායම් බදු ප්‍රමාණය රු.11,688,067 ක් ඉකුත් වර්ෂයේ ආදායම් බදු සඳහා අධි වෙන් කිරීම් ගිණුමෙහි වූ රු.13,186,248 ක ශේෂයෙන් හිලව් කර එහි වෙනස වූ රු.1,498,181 ක් පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් යටතේ දක්වා තිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.588,520,971 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.507,289,450 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,231,521 ක් හෙවත් සියයට 16 කින් වර්ධනය වී තිබුණි. මෙම වර්ධනයට ශුද්ධ ආයෝජන ආදායම රු.82,652,261 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

විශ්වවිද්‍යාල ස්ථිර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිහිටුවීමට විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.6,395,517,956 ක ශේෂයක් සහිතව සාමාජිකයින් 13,173 කින් සමන්විත විය.එහි විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 222 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් මුදල රු.38,825,270 ක් විය.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත වරින් වර යොමුකරවන ලදී. ගිණුම්කරණ ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

| විෂය | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස් | වර්තමාන තත්වය 05/02/2018 |
|---|---|---|---|
| 2.2මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම<br><br>2.2.1 ගිණුම්කරණ අඩුපාඩු | සමාලෝචිත වර්ෂයට අදාල මුළු ආදායම් බදු ප්‍රමාණය රු. 11,688,067 ක් ඉකුත් වර්ෂයේ ආදායම් බදු සඳහා අධි වෙන් කිරීම ගිණුමෙහි වූ රු. 13,186,248 ක ශේෂයෙන් හිලව් කර එහි වෙනස වූ රු. 1,498,181 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් යටතේ දක්වා තිබුණි. | 2016 වර්ෂයේ ආදායම් බදු ගණනය කර අධි වෙන් කිරීම ගැලපූ පසු ශුද්ධ අගය පමණක් වසරේ ආදායම් බදු වශයෙන් ගිණුම් ගත කර ඇත.<br><br>මෙමගින් මූල්‍ය ප්‍රතිඵලයට වන බලපෑම ශුන්‍ය වුවද සමස්ථ ගිණුම්කරන සටහන අවසාන ගිණුම් වල හෙළිදරව් නොකිරීම සම්බන්ධව එකඟ වන අතර එය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2016 වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීම සම්බන්ධ සමස්ථ ගිණුම්කරණ සටහන 2017 වර්ෂයේ අවසාන ගිණුම් වල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| 2.3 නීති රීති රෙගුලාසි සහ කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම. | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමණාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. | මූලික කෙටුම්පත් නියමාවලිය නීති<br><br>කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව මගින් 2016 අප්‍රේල් 28 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිරීක්ෂණ සඳහා එවන ලදී.<br><br>ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිරීක්ෂණ සමඟ කෙටුම්පත් නියමාවලිය නැවත 2016 දෙසැම්බර් 22 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදී.<br><br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අවසාන අනුමැතිය සහිත නියමාවලිය ලැබීමෙන් පසු විශ්‍රාම වැටුප් නියමාවලිය ගැසට් කරනු ලැබේ. | නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් තව දුරටත් සංශෝධනය කරන ලද නියමාවලිය 2018 ජනවාරි 24 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිරීක්ෂණය සඳහා එවන ලදී. නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ අවසාන අනුමැතිය ලැබීමෙන් පසු විශ්‍රාම වැටුප් නියමාවලිය ගැසට් කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| 3. මූල්‍ය සමාලෝචන<br><br>3.1 මූල්‍ය ප්‍රතිඵල | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.588,520,971 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 507,289,450 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 81,231,521 ක් හෙවත් 16% කින් වර්ධනය වී තිබුණි. මෙම වර්ධනයට ශුද්ධ ආයෝජන ආදායම රු 82,652,261 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් මූල්‍ය ප්‍රතිඵල සමඟ එකඟ වේ. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී මූල්‍ය ප්‍රතිඵලය රු.මි. 82.65කින් වර්ධනය වී තිබුණි. ආයෝජනවලින් ලැබෙන ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵල වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. | විගණන වාර්තාවේ සඳහන් මූල්‍ය ප්‍රතිඵලය සමඟ එකඟ වේ. |
| 4.මෙහෙයුම් සමාලෝචනය<br><br>4.1 කාර්ය සාධනය | විශ්වවිද්‍යාල ස්ථිර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිහිටුවීමට විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 6,395,517,956 ක ශේෂයක් සහිතව සාමාජිකයන් 13,173 කින් සමන්විත විය. එහි විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 222 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් මුදල රු. 38,825,270 ක් විය. | විගණන වාර්තාවේ සඳහන් මෙහෙයුම් සමාලෝචනය සමග එකඟ වේ. 2016 වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් අරමුදල රු. 6,395,517,956 ක ශේෂයක් සහිතව සාමාජිකයන් 13,173 කින් සමන්විත විය.<br><br>එහි විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 222 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් මුදල රු. 38,825,270 ක් විය. | විගණන වාර්තාවේ සඳහන් කාර්ය සාධන ප්‍රතිඵලය සමඟ එකඟ වේ. |
| 5.පද්ධති හා පාලනයන් | විගණනයේදී නිරීක්ෂනය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත වරින් වර යොමු කරන ලදී. ගිණුම්කරණ ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුය. | විශ්‍රාම වැටුප් අරමුදලේ පද්ධති හා පාලනයන් දියුණු කර ගැනීම සඳහා විගණකාධිපති වාර්තාවේ උපදේශයන්ද පදනම් කර ගනිමින් පවතින පද්ධති හා පාලනයන් පිළිබඳව වාර්ෂිකව ඇගයීමට ලක් කරනු ලබන අතර වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පද්ධති හා පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

# විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
# 2016.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | 2016 වර්ෂය රුපියල් | (ප්‍රති ප්‍රකාශිත) 2015 වර්ෂය රුපියල් |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම වත්කම් | | |
| මුදල් හා මුදල් සමාන වත්කම් | 129,574,612 | 2,583,171,028 |
| ලැබිය යුතු පොළිය | 4,783,185,642 | 4,152,091,729 |
| ලැබිය යුතු දායක මුදල් | 276,875,816 | 175,194,809 |
| ලැබිය යුතු අර්ථසාධක ණය වාරික | 47,517,338 | 53,159,006 |
| වෙනත් අත්තිකාරම් | 1,000 | 1,000 |
| තොග | 168,102 | 219,576 |
| | 5,237,322,510 | 6,963,837,148 |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ , පිරියත හා උපකරණ | 686,545 | 887,485 |
| දිගුකාලීන ආයෝජන | 23,762,567,591 | 18,543,270,542 |
| අර්ථසාධක ණය | 4,745,330,371 | 4,662,145,689 |
| | 28,508,584,508 | 23,206,303,716 |
| මුළු වත්කම් | 33,745,907,017 | 30,170,140,864 |
| වගකීම් | | |
| අඩුකලා : ජංගම වගකීම් | | |
| විවිධ ණයහිමියෝ | 2,316,687 | 2,310,427 |
| ගෙවිය යුතු ජීවන වියදම් දීමනා හිඟ දායක මුදල් | 74,008,058 | 104,893,466 |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ | 33,833,554 | 29,750,062 |
| ගෙවිය යුතු බදු | 348,084,600 | 349,905,309 |
| | 458,242,899 | 486,859,264 |
| මුළු ශුද්ධ වත්කම් | 33,287,664,118 | 29,683,281,600 |
| මූල්‍යයනය වන්නේ; | | |
| සාමාජික ගිණුම් ශේෂය - ක්‍රියාකාරී | 33,008,249,356 | 29,374,577,556 |
| සාමාජික ගිණුම් ශේෂය - අක්‍රිය | 44,126,524 | 44,041,137 |
| අක්‍රිය ගිණුම් සඳහා වෙන්කිරීම | 8,000,000 | 8,000,000 |
| ඉල්ලුම් නොකල ප්‍රතිලාභ සංචිත | 6,965,536 | 6,956,641 |
| රඳවා ගත් ලාභ | 220,322,702 | 249,706,266 |
| අරමුදලේ ශුද්ධ වටිනාකම | 33,287,664,118 | 29,683,281,600 |

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | 2016 වර්ෂය රුපියල් | (ප්‍රති ප්‍රකාශිත) 2015 වර්ෂය රුපියල් |
|---|---|---|
| ආදායම් | | |
| ආයෝජන ආදායම් | 2,850,587,743 | 2,676,277,840 |
| වෙනත් ආදායම් | 1,745,830 | 1,500,000 |
| මුළු ආදායම | 2,852,333,573 | 2,677,777,840 |
| අඩුකලා : ආදායම් බදු | (57,488,495) | (131,887,945) |
| බදු පසු ආදායම | 2,794,845,077 | 2,545,889,895 |
| අඩුකලා : මෙහෙයුම් වියදම් | (2,161,576) | (1,245,806) |
| මෙහෙයුම් ලාභය | 2,792,683,501 | **2,544,644,089** |
| එකතුකලා : සංචිත | | |
| ආදායමට ගැලපීම් | 15,647,229 | 19,354,326 |
| පසුගිය වසරේ රඳවාගත් ලාභය | 249,706,266 | 118,706,914 |
| බෙදාහැරීම සඳහා ශුද්ධ ලාභය | 3,058,036,997 | **2,682,705,329** |
| සාමාජික ගිණුම් සඳහා පොළිය | (2,836,533,872) | (2,420,426,697) |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළිය | (1,180,422) | (7,572,366) |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන්කිරීම වැඩිකිරීම | – | (5,000,000) |
| ඉදිරියට ගෙන යන රඳවාගත් ලාභ | **220,322,701** | **249,706,266** |

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2016 වර්ෂය රුපියල් | (ප්‍රති ප්‍රකාශිත) 2015 වර්ෂය රුපියල් |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය | | |
| බදු සහ වියදම් වලට පසුව ශුද්ධ ලාභය | 2,792,683,501 | 2,544,644,089 |
| ගැලපීම් | | |
| භාණ්ඩාගාර බිල්පත් අව මිල/අධි මිල | 85,718,055 | 28,027,818 |
| භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙන් ලද ලාභය/පාඩුව | (48,281,530) | (90,288,069) |
| වර්ෂයේ ක්ෂය | 200,940 | 117,215 |
| කපාහැරීම් | 222,682 | - |
| ආදායම් බදු | 57,488,495 | 131,887,945 |
| මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය | 2,888,032,143 | 2,614,388,998 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | |
| තොග වෙනස්වීම | 51,474 | (59,535) |
| ලැබිය යුතු ආයෝජන ආදායම් වෙනස්වීම | (631,093,913) | (572,448,186) |
| ණය වෙනස්වීම | (77,545,174) | 28,979,132 |
| ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වෙනස්වීම | (30,885,408) | (66,852,495) |
| විවිධ ණයහිමියන්ගේ වෙනස්වීම | 6,196 | 1,932 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල් | 2,148,565,318 | 2,004,009,846 |
| වර්ෂය තුල ගෙවන ලද ආදායම් බදු | (59,309,205) | (87,488,992) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 2,089,256,113 | **1,916,520,854** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර තැන්පතු කල්පිරීම් | 1,410,000,000 | 2,395,500,000 |
| ස්ථාවර තැන්පතු ආයෝජන | (400,000,000) | - |
| භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම/කල්පිරීම | 4,430,523,555 | 5,073,897,091 |
| ණයකර මිලට ගැනීම | (1,595,366,700) | (1,000,000,000) |
| භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම | (9,101,890,429) | (6,358,691,101) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (5,256,733,574) | **110,705,990** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| සාමාජික මුදල් ලැබීම් | 2,447,215,828 | 2,266,902,028 |
| සාමාජික මුදල් ගෙවීම් | (1,733,334,785) | (1,791,785,128) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 713,881,042 | **475,116,900** |
| මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම | (2,453,596,418) | 2,502,343,744 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම් | 2,583,171,028 | 80,827,285 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම් | 129,574,612 | **2,583,171,028** |

## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | සාමාජික ශේෂය ක්‍රියාකාරී | සාමාජික ශේෂය අක්‍රිය | අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන් කිරීම | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ සංචිත | රඳවා ගන්නා ලද ලාභ | මුළු ශුද්ධ වත්කම් |
|---|---|---|---|---|---|---|
| **2015.01.01 දිනට ශේෂය** | 26,463,190,362 | 40,352,106 | 3,000,000 | 6,954,807 | 118,706,914 | 26,632,204,189 |
| වර්ෂයට අදාල සාමාජික මුදල් | 2,308,161,949 | - | - | - | - | 2,308,161,949 |
| සාමාජික පොළී | 2,420,426,697 | - | - | - | (2,420,426,697) | - |
| සාමාජික මුදල් නැවත ගෙවීම් | (1,795,183,598) | - | - | - | - | (1,795,183,598) |
| සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම් | (6,545,028) | - | - | - | - | (6,545,028) |
| ගැළපිලි | (15,472,826) | 3,689,032 | (7,572,366) | 1,835 | 19,354,326 | - |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී | - | - | 7,572,366 | - | (7,572,366) | - |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා වෙන්කිරීම වැඩිකිරීම | - | - | 5,000,000 | - | (5,000,000) | - |
| 2015 වර්ෂයේ අතිරික්තය (ප්‍රති ප්‍රකාශිත) | - | - | - | - | 2,544,644,089 | 2,544,644,089 |
| **2015.12.31 දිනට ශේෂය (ප්‍රති ප්‍රකාශිත)** | **29,374,577,555** | **44,041,138** | **8,000,000** | **6,956,641** | **249,706,266** | **29,683,281,600** |
| වර්ෂයට අදාල සාමාජික මුදල් | 2,559,666,892 | - | - | - | - | 2,559,666,892 |
| සාමාජික පොළී | 2,836,533,872 | - | - | - | (2,836,533,872) | - |
| අක්‍රිය සාමාජික ගිණුම් සඳහා පොළී | - | - | 1,180,422 | - | (1,180,422) | - |
| සාමාජික මුදල් නැවත ගෙවීම් | (1,737,418,277) | - | - | - | - | (1,737,418,277) |
| සප්ත වාර්ෂික නිවාඩු සඳහා අයකර ගැනීම් | (10,547,376) | - | - | - | - | (10,547,376) |
| ගැළපිලි | (14,563,310) | 85,386 | (1,180,422) | 8,895 | 15,647,229 | (2,222) |
| 2016 වර්ෂයේ අතිරික්තය | - | - | - | - | 2,792,683,501 | 2,792,683,501 |
| **2016.12.31 දිනට ශේෂය** | **33,008,249,356** | **44,126,524** | **8,000,000** | **6,965,536** | **220,322,702** | **33,287,664,118** |

126

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එච්ඊඩී/ඒ/යූජීඑෆ්/එෆ්ඒ/2016 | මගේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2017 ජූනි 29 දින | | |

ලේකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් -
1. ලේකම් , උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඒ/යූජීඑෆ්/එෆ්ඒ/2016 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2017 ජූනි 29 දින

ලේකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සහ 2015 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලියේ 24 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම්ද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 මතය

---

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 ලැබිය යුතු ගිණුම්

2016 දෙසැම්බර් 31 දිනට රු.44,126,524 ක් වූ අර්ථසාධක අරමුදලේ අක්‍රීය සාමාජික ශේෂය තුල, ගිවිසුම් කඩකරන ලද සාමාජිකයින්ගෙන් අය විය යුතු ශේෂයන් ද ඇතුළත් වී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,792,683,501 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,544,644,089 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.248,039,412 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ආදායම රු.174,309,903 කින් වැඩිවීම හා ආදායම් බදු වියදම රු.74,399,450 කින් අඩුවීම ඉහත අතිරික්තයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල සැලකීමේදී එහි ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය වූ අතර රජයට ගෙවන ලද ආදායම් බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයේ දායකත්වය රු.2,850,171,996 ක් විය. එය ඉකුත් වර්ෂයේ දායකත්වය සමඟ සැසඳීමේදී සියයට 6 ක වර්ධනයක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව උසස් අධ්‍යාපන ආයතන විසින් එහි සේවය කර, සේවය අවසන් කරන ලද සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ ශේෂය නිදහස් කිරීමට අදාල විස්තර මාස 02 ක් ඇතුලත කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දිය යුතු අතර එම කටයුත්ත ආයතනයේ වරදක් හේතුවෙන් ප්‍රමාද වීම මත දායකයන්ට පොලී ගෙවීමට සිදු වුවහොත් එය අදාල වගකිව යුතු නිලධාරීන්ට අයිභාර කළ යුතු වේ. එසේ වුවද ප්‍රමාද කාලය මාස 04 සිට මාස 252 ක් දක්වා විහිදී තිබූ නමුත් එම ප්‍රමාද කාලය සඳහා ගෙවූ පොලිය රු.110,805 ක් වුවද චක්‍රලේඛ ප්‍රකාරව අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද , සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ අරමුදල් නිදහස් කිරීමේදී විශ්වවිද්‍යාල විසින්

නියමිත කාලය තුළ ලිපිගොනු ඉදිරිපත් නොකිරීම මෙසේ ගෙවීම ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබූ අතර කොමිෂන් සභාව ප්‍රමාද වලක්වා ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ගෙවන ණය සම්බන්ධයෙන් 2007 අගෝස්තු 31 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 739 වන කමිටු රැස්වීමේදී ගත් තීරණයන් අනුව අරමුදලින් ණය ලබාදීම සඳහා ණය මුදල් ඉල්ලුම් කරන නිලධාරියාගේ ණය මුදල ඉල්ලුම් කරන මාසයට පෙර මාසයේ අර්ථසාධක දායක මුදල් හා පසුගිය මුළු ණය වාරික, ණය ඉල්ලුම් කරන මාසයේ 10 වන දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් අංශයට ලැබිය යුතු වුවද ඒ අනුව ලැබී නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. එම ප්‍රමාදවීම් සම්බන්ධයෙන් සභාව විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| අරමුදල් කළමනාකරණය | (i) සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම.<br>(ii) මාසික ණය වාරික හා අර්ථසාධක අරමුදල් දායකයන් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ

විගණකාධිපති වාර්තාව

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 2.2 <u>ලැබිය යුතු ගිණුම</u> | 2016 දෙසැම්බර් 31 දිනට රු. 44,126,524 ක් වූ අර්ථසාධක අරමුදලේ අක්‍රිය සාමාජක ශේෂය තුළ ගිවිසුම් කඩකරන ලද සාමාජිකයන්ගෙන් අයවිය යුතු ශේෂයන් ද ඇතුළත් වී තිබුණි. | එකඟ නොවේ.<br><br>විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වනුයේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යයන හා අනධ්‍යයන සේවකයින් වේ. එම සේවකයින් සමඟ ගිවිසුම් වලට එළඹෙනුයේ ඒ ඒ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වන අතර, ඒ සඳහා අර්ථසාධක අරමුදල ඍජුව හෝ වක්‍රව සම්බන්ධ නොවේ.<br><br>ඒ අනුව, අක්‍රිය සාමාජිකයින් අතර, සිටින ගිවිසුම් කඩකරන ලද අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගෙන් එම මුදල් අයකර ගැනීම හෝ අර්ථසාධක අරමුදලින් කපා හැරීමට කටයුතු කිරීමට අර්ථසාධක අරමුදලට බලයක් නොමැත.<br><br>මේ පිළිබඳව විශ්වවිද්‍යාල පනතේ 94 (a) දරණ වගන්තියට අනුව, අර්ථසාධක අරමුදලින් ගිවිසුම් කඩකල සේවකයින්ගෙන් අදාළ මුදල් අඩුකල හැකි ද යන්න පිළිබඳව කරන ලද විමසීමට අනුව නීතිපති විසින් 2016.10.13 දිනැති ලිපිය මගින් එලෙස අඩුකල නොහැකි බව අප වෙත දන්වා ඇත.<br><br>ඒ අනුව, අක්‍රිය සාමාජිකයින්ට අදාළව ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් ආයතනයට ලැබිය යුතු මුදල් ප්‍රමාණය ගිණුම්වල හඳුනා ගැනීම සිදුකල නොහැකි වේ. | මේ පිළිබඳව විශ්වවිද්‍යාල පනතේ 94 (a) දරණ වගන්තියට අනුව, අර්ථසාධක අරමුදලින් ගිවිසුම් කඩකල සේවකයින්ගෙන් අදාළ මුදල් අඩුකල හැකි ද යන්න පිළිබඳව කරන ලද විමසීමට අනුව නීතිපති විසින් 2016.10.13 දිනැති ලිපිය මගින් එලෙස අඩුකල නොහැකි බව අප වෙත දන්වා ඇත.<br><br>ඒ අනුව, අක්‍රිය සාමාජිකයින්ට අදාළව ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් ආයතනයට ලැබිය යුතු මුදල් ප්‍රමාණය ගිණුම්වල හඳුනා ගැනීම සිදුකල නොහැකි වේ. |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 3. මූල්‍ය සමාලෝචනය<br>3.1 මූල්‍ය ප්‍රතිඵල | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 2,792,683,501 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,544,644,089 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 248,039,412 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ආදායම රු. 174,309,903 කින් වැඩිවීම හා ආදායම් බදු වියදම රු. 74,399,450 කින් අඩුවීම ඉහත අතිරික්තයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන බලපා තිබුණි.<br><br>පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල සැලකීමේදී එහි ක්‍රමික වර්ධනයක් නිරීක්ෂණය වූ අතර, රජයට ගෙවන ලද ආදායම් බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයේ දායකත්වය රු. 2,850,171,996 ක් විය. එය ඉකුත් වර්ෂයේ දායකත්වය සමඟ සැසඳීමේදී සියයට 6 ක වර්ධනයක් විය. | එකඟ වේ. | එකඟ වේ. |
| 4.මෙහෙයුම් සමාලෝචනය<br>4.1 කාර්ය සාධනය | (අ) 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, උසස් අධ්‍යාපන ආයතන විසින් එහි සේවය කර, සේවය අවසන් කරන ලද සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ ශේෂය නිදහස් කිරීමට අදාළ විස්තර මාස 02 ක් ඇතුලත කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දිය යුතු අතර එම කයුත්ත ආයතනයේ වරදක් හේතුවෙන් ප්‍රමාද වීම මත දායකයන්ට පොළී ගෙවීමට සිදු වුවහොත් එය අදාළ වගකිය යුතු නිලධාරීන්ට අධිභාර කළ යුතු වේ. එසේ වුවද ප්‍රමාද කාලය මාස 04 සිට මාස | එකඟ නොවේ.<br><br>1982.02.02 දිනැති අංක 155 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල සේවය කර සේවය අවසන් කිරීමෙන් පසු ඔවුන්ගේ නිදහස් කිරීමේ පත්‍රිකා මාස දෙකක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එවීම ප්‍රමාද වීමට දායකයා/සේවකයා හේතුකොට ගෙන, විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතන නිලධාරියා හේතුකොට ගෙන හෝ එම අයදුම්පතට ආවේනික වූ ක්‍රියාවලියෙහි හේතු මත සිදුවිය හැකිය. | 1982.02.02 දිනැති අංක 155 දරන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල සේවය කර සේවය අවසන් කිරීමෙන් පසු ඔවුන්ගේ නිදහස් කිරීමේ පත්‍රිකා මාස දෙකක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන |

| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | 252 ක් දක්වා විහිදී තිබූ නමුත් එම ප්‍රමාද කාලය සඳහා ගෙවී පොලිය රු. 110,805 ක් වුවද චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුනි. තවද, සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ අරමුදල් නිදහස් කිරීමේදී විශ්වවිද්‍යාල විසින් නියමිත කාලය තුළ ලිපිගොනු ඉදිරිපත් නොකිරීම මෙසේ ගෙවීම ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබූ අතර, කොමිෂන් සභාව ප්‍රමාද වලක්වා ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | | කොමිෂන් සභාවට එවීම ප්‍රමාද වීමට දායකයා/සේවකයා හේතුකොට ගෙන, විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතන නිලධාරියා හේතුකොට ගෙන හෝ එම අයදුම්පතට ආවේනික වූ ක්‍රියාවලියෙහි හේතු මත සිදුවිය හැකිය. |
| | (ආ) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ගෙවන ණය සම්බන්ධයෙන් 2007 අගෝස්තු 31 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 739 වන කමිටු රැස්වීමේදී ගත් තීරණයන් අනුව අරමුදලින් ණය ලබා දීම සඳහා ණය මුදල් ඉල්ලුම් කරන නිලධාරියාගේ ණය මුදල ඉල්ලුම් කරන මාසයට පෙර මාසයේ අර්ථසාධක දායක මුදල් හා පසුගිය මුළු ණය වාරික, ණය ඉල්ලුම් කරන මාසයේ 10 වන දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් අංශයට ලැබිය යුතු වුවද ඒ අනුව ලැබී නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. එම ප්‍රමාද වීම් සම්බන්ධයෙන් සභාව විධිමත් පියවරක් ගෙන නොතිබුණි. | එකඟ නොවේ.<br><br>මේ සඳහා දැනටමත් චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත. තවද, අර්ථසාධක දායක මුදල් සහ ණය වාරික ප්‍රමාද වී එවන විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වලට අදාළව අර්ථසාධක ණය මුදල් ගෙවීම අදාළ ප්‍රමාද වූ දින ගණනින් ප්‍රමාද කරනු ලැබේ.<br><br>සෑම මසකම 10 වන දිනට හෝ ඊට පෙර ලැබිය යුතු වන්නේ ස්ථිර සේවකයින්ගේ අරමුදල් වේ. එම දායක මුදල් නියමිත දිනට නොලැබේ නම්, ණය මුදල් නිකුත් කිරීම අදාළ ආයතන වෙත ණය මුදල් නිදහස් කිරීම ද ප්‍රමාද කරනු ලබයි.<br><br>තවද, අනියම් සේවකයින්ගේ දායක මුදල් ලැබිය යුතු වන්නේ සෑම මසකම 20 වන දිනට හෝ ඊට පෙර වේ. එසේ අර්ථසාධක අරමුදල් ණය නිකුත් කරනු ලබන්නේ ස්ථිර සේවකයින්ට පමණක් වන අතර, අනියම් සහ තාවකාලික සේවකයින් සඳහා ණය මුදල් ගෙවීමක් සිදු නොවේ. | මේ සඳහා දැනටමත් චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇත. තවද, අර්ථසාධක දායක මුදල් සහ ණය වාරික ප්‍රමාද වී එවන විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වලට අදාළව අර්ථසාධක ණය මුදල් ගෙවීම අදාළ ප්‍රමාද වූ දින ගණනින් ප්‍රමාද කරනු ලැබේ.<br><br>මීට අමතරව, අරමුදල් ප්‍රේශණය කිරීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා 2017.01.23 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2017 මගින් ඍජු තැන්පත් ක්‍රමය හඳුන්වා දී ඇත. |

| මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම් | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු හා නිරීක්ෂණ | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | | මීට අමතරව, අරමුදල් ප්‍රේෂණය කිරීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා 2017.01.23 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2017 මගින් සෘජු තැන්පත් ක්‍රමය හඳුන්වා දී ඇත. | |
| 5. <u>පද්ධති හා පාලනයන්</u> | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය. | එකඟ නොවේ. | |
| | I. සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම. | අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී එවැනි ප්‍රමාදයන් සිදුවී නොමැත. | අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී එවැනි ප්‍රමාදයන් සිදුවී නොමැත. |
| | II. මාසික ණය වාරික හා අර්ථසාධක අරමුදල් දායකයන් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම. | අරමුදල් ප්‍රේශණය කිරීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා 2017.01.23 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2017 මගින් සෘජු තැන්පත් ක්‍රමය හඳුන්වා දී ඇත. | අරමුදල් ප්‍රේශණය කිරීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා 2017.01.23 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2017 මගින් සෘජු තැන්පත් ක්‍රමය හඳුන්වා දී ඇත. |